**276 වන කාණ්ඩය - 03 වන කලාපය**
தொகுதி 276 - இல. 03
**Volume 276 - No. 03**

**2020 පෙබරවාරි 7වන සිකුරාදා**
2020 பெப்ருவரி 07, வெள்ளிக்கிழமை
**Friday, 07th February, 2020**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන්

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**ආබාධිත පුද්ගලයන් වෙනුවෙන් විධිමත් වැඩ පිළිවෙළක්:**

කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමියගේ ප්‍රකාශය

**කාන්තාවන් සවිබලගැන්වීම සහ සුබසාධනය:**

කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමියගේ ප්‍රකාශය

**එයාර්බස් ගනුදෙනුවේ අක්‍රමිකතා:**

කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදී

**ශෝක ප්‍රකාශ:**

ගරු සී. නන්ද මැතිව් මහතා

ගරු (වෛද්‍ය) රංජිත් අතපත්තු මහතා

ගරු ප්‍රින්ස් කාසිනාදර් මහතා

ගරු එම්.එස්. තේමිස් මහතා

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**

சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள்

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**ஊனமுற்றோருக்கான முறைமைசார் வேலைத்திட்டம்:**

மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூகப் பாதுகாப்பு அமைச்சரும் சுகாதாரம் மற்றும் சுதேச வைத்தியச் சேவைகள் அமைச்சருமானவரினது கூற்று

**பெண்களுக்கான வலுவூட்டலும் நலனோம்பலும்:**

மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூகப் பாதுகாப்பு அமைச்சரும் சுகாதாரம் மற்றும் சுதேச வைத்தியச் சேவைகள் அமைச்சருமானவரினது கூற்று

**எயார்பஸ் கொடுக்கல்வாங்கல் முறைகேடுகள்:**

கைத்தொழில் ஏற்றுமதி மற்றும் முதலீட்டு மேம்பாடு அமைச்சரும் சுற்றுலா மற்றும் விமானச் சேவைகள் அமைச்சருமானவரினது கூற்று

**துறைமுக, விமானநிலைய அபிவிருத்தி அறவீடு (திருத்தம்) சட்டமூலம்:**

முதன்முறை மதிப்பிடப்பட்டது

**அனுதாபத் தீர்மானங்கள்:**

மாண்புமிகு சீ. நந்தா மெத்தியூ

மாண்புமிகு (வைத்திய கலாநிதி) ரஞ்சித் அத்தபத்து

மாண்புமிகு பிரின்ஸ் காசிநாதர்

மாண்புமிகு எம். எஸ். தேமிஸ்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Legislative Standing Committee: Additional Members

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

FORMAL PROGRAMME FOR THE DISABLED:

Statement by Minister of Women and Child Affairs and Social Security and Minister of Healthcare and Indigenous Medical Services

EMPOWERMENT AND WELFARE OF WOMEN:

Statement by Minister of Women and Child Affairs and Social Security and Minister of Healthcare and Indigenous Medical Services

IRREGULARITIES IN AIRBUS DEAL:

Statement by Minister of Industrial Export and Investment Promotion and Minister of Tourism and Civil Aviation

PORTS AND AIRPORTS DEVELOPMENT LEVY (AMENDMENT) BILL:

Read the First time

VOTES OF CONDOLENCE:

Hon. C. Nanda Mathew

Hon. (Dr.) Ranjith Atapattu

Hon. Prince Casinader

Hon. M.S. Themis

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

**2020 පෙබරවාරි 7වන සිකුරාදා**
*2020 பெப்ருவரி 07, வெள்ளிக்கிழமை*
*Friday, 07th February, 2020*

**පූ. භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப.10.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන්
### சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள்
### LEGISLATIVE STANDING COMMITTEE: ADDITIONAL MEMBERS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

"ශ්‍රී ලංකා පරිසර වෘත්තියවේදීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ 113(2) ස්ථාවර නියෝගය ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු පළ වන මන්ත්‍රීවරුන් අතිරේක සාමාජිකයන් වශයෙන් ගරු කථානායකතුමා විසින් නම් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

1. ගරු තාරක බාලසූරිය මහතා
2. ගරු කංචන විජේසේකර මහතා
3. ගරු විජිත හේරත් මහතා
4. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
5. ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
6. ගරු කරුණාරත්න පරණවිතාන මහතා
7. ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
8. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

## II

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

"ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ 113(2) ස්ථාවර නියෝගය ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු පළ වන මන්ත්‍රීවරුන් අතිරේක සාමාජිකයන් වශයෙන් ගරු කථානායකතුමා විසින් නම් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

1. ගරු මහින්ද සමරසිංහ මහතා
2. ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
3. ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය
4. ගරු චන්දිම වීරක්කොඩි මහතා
5. ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
6. ගරු නිහාල් ගලප්පත්ති මහතා
7. ගරු ඩී.වී. චානක මහතා
8. ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

## III

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2020 පෙබරවාරි මස 07 වන සිකුරාදා එනම්, අද දින අපර භාග 2.00ට ගරු කථානායකවරයාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීවරුන් සියලුදෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## *சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்*
## PAPERS PRESENTED

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මාර්ග සහ මහාමාර්ග අමාත්‍ය, වරාය හා නාවික කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - வீதி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Roads and Highways, Minister of Ports and Shipping and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම,

(i) 2018 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා සහ කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2013/2014 සහ 2014/2015 වර්ෂ සඳහා මාන්තයි සෝල්ට් ලිමිටඩ් හි වාර්ෂික වාර්තා සහ ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තා නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු ලසන්ත අලගියවන්න මහතා (රාජ්‍ය කළමනාකරණ හා ගිණුම් කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - அரச முகாமைத்துவ மற்றும் கணக்கீட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - State Minister of Public Management and Accounting)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2018 වර්ෂය සඳහා වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2018 වර්ෂය සඳහා විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iii) 2016 සහ 2017 වර්ෂ සඳහා විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(iv) 2018 වර්ෂය සඳහා මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(v) 2015 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(vi) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(vii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(viii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(ix) 2018 වර්ෂය සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(x) 2014, 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා; සහ

(xi) 2016 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2018 වර්ෂය සඳහා අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2017 වර්ෂය සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iii) 2018 වර්ෂය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iv) 2018 වර්ෂය සඳහා මහා භාරකාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(v) 2018 වර්ෂය සඳහා ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව;

(vi) 2018 වර්ෂය සඳහා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(vii) 2017 වර්ෂය සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(viii) 2016 වර්ෂය සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(ix) 2018 වර්ෂය සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව;

(x) 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තා;

(xi) 2016 වර්ෂය සඳහා සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව;

(xii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය;

(xiii) 2016 වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xiv) 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තා; සහ

(xv) 2013 සහ 2014 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව එම කාරක සභාවේ සභාපති ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා වෙනුවෙන්, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් පිළිගන්වනවා ඇති.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති වෙනුවෙන්, මම අධ්‍යාපනය හා මානව සම්පත්

සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සකස් කරන ලද "ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය ස්ථාපනය කිරීම" පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව පුංචි හැඳින්වීමක් කරන්න මට අවස්ථාව දෙන්න. 1962 ඉඳලා මේ රටේ ගුරු උපදේශක සේවයේ සිටි ගුරුවරුන් මෙය සේවාවක් හැටියට ස්ථාපනය කර දෙන්න කියලා වසර 58ක් තිස්සේ මේ රටේ තිබුණු විවිධ රජයන්ගෙන් ඉල්ලීම් කළා. නමුත් ඒක සිද්ධ වුණේ නැහැ. 2009දී ලබා දුන් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් තිබෙනවා, ගුරු සේවාවක් හැටියට මෙය ස්ථාපනය කළ යුතුයි කියලා. ඉන් අනතුරුව 2007දීත්, 2016 සිට 2019 දක්වා හය වතාවකුත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කළා. කැබිනට් පත්‍රිකාව අනුමත වුණත් ඇතැම් සංශෝධන සඳහා විටින් විට නැවත වතාවක් කැබිනට් එකට ඉදිරිපත් වුණා.

මේ අයගේ කාර්යභාරය හා සම්බන්ධව කියනවා නම්, විශේෂයෙන් ගුරුවරුන් සංවර්ධනය කිරීම, බාහිර අධීක්ෂණය, කේවල අධීක්ෂණය, කණ්ඩායම් අධීක්ෂණය, ගුරුවරුන් සුසාධ්‍යකරණය සහ ඇගයීම, ප්‍රශ්න පත්‍ර සකස් කිරීම, පෙළ පොත් ලිවීම, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ගුරුවරුන් යාවත්කාලීන කිරීම හා පාසල්වල ප්‍රතිඵල සංවර්ධනය යනාදී විශාල වැඩ කොටසකට උරදෙන පිරිසක් තමයි, ගුරු උපදේශකවරුන් කියන්නේ. නමුත්, මේ අයට ගැටලුවක් තිබෙනවා. මෙය සේවාවක් හැටියට ස්ථාපනය නොකිරීම තුළ අද විදුහල්පතිවරුන්, කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ පළාත් අධ්‍යක්ෂවරුන් යම් යම් ගැටලුවලට, සංකූලතාවලට මැදි වෙලා ඉන්නවා. ඒකට හේතුව තමයි, මේ අය පාසලේ ගුරුවරයකු හැටියට තමයි තවම වැටුප් ගන්නේ. නමුත්, ඒ ගුරුවරයා ඒ පාසලේ නැහැ. අනෙක් පාසල් අධීක්ෂණය කරමින්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා යටතේ ඒ කාර්යාලයේ තමයි වැඩ කරන්නේ. ඒ හේතුව නිසා එම පාසලට ගුරුවරයෙක් ලබා ගැනීමේ තිබෙන ඉඩකඩත් නැතිව යනවා. ඒ නිසා ඒකෙන් පාසලට වැඩක් වෙන්නේත් නැහැ. මොකද, බොහෝවිට සතියකට එක දවසක් පමණයි විෂයය උගන්වන්න ඒ අය එන්නේ.

ඊළඟට, වැටුප් වර්ධක ලබා ගැනීමේදී මේ ගුරු උපදේශකවරුන්ට කිසිම අවස්ථාවක් නැහැ. මොකද, මේ අය ගුරුවරයෙකුත් නොවෙයි; විදුහල්පතිවරයෙකුත් නොවෙයි; පරිපාලන සේවයේ නියුතු අයෙකුත් නොවෙයි. එතකොට මේ අය කවුද? මෙන්න මේ ගැටලුවටත් මේ අය දිගින් දිගටම මුහුණ දෙනවා. රුපියල් 300ක ප්‍රවාහන දීමනාවක් පමණයි ඔවුන්ට ලැබෙන්නේ. ඒකත් කිලෝමීටර් 10කට එහා යනවා නම් තමයි ගෙවන්නේ. මෙන්න මේ වාගේ ගැටලු රැසකට ඒ අය මුහුණ දෙමින් තමයි වසර 58ක් තිස්සේ මේ ගුරුවරුන් වෙනුවෙන්, විශේෂයෙන් මේ රටේ අධ්‍යාපනය වෙනුවෙන්, දරුවන් වෙනුවෙන් මේ කටයුත්ත කරන්නේ.

ඒ නිසා මේ සේවාව ගුරු උපදේශක සේවාවක් හැටියට ස්ථාපනය කරන්න කියන එක අපි ආංශික අධීක්ෂණ කාරක සභාවේදී කථා කරලා, මේ වෙනකොට ඒ යෝජනාව රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමතයි; ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමෙන් අනුමතයි; කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමතයි; මුදල් අමාත්‍යාංශයෙන් අනුමතයි. නමුත්, සංශෝධනයක් සඳහා මේ වෙනකොට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබෙනවා. දැනට මාසයක් පමණ ගත වුණත්, ඒ කැබිනට් පත්‍රිකාව තවම අනුමත වෙලා නැහැ.

අද මේ සභාවේ ගරු අග්‍රාමාත්‍යතුමාත් සිටින නිසා බොහොම ගෞරවයෙන් එතුමාගෙන් ලොකු ඉල්ලීමක් කරනවා. මම දැක්කා, එතුමා ඊයේ-පෙරේදා ගුරුවරුන් සම්බන්ධයෙන් හොඳ ඇගැයීමක් කළා; ඒ වාගේම ප්‍රශංසාත්මකව කථා කළා. ගරු අග්‍රාමාත්‍යතුමනි, මේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් දැවැන්ත සේවාවක් කරන මේ ගුරු උපදේශකවරුන් සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා තිබෙන කැබිනට් පත්‍රිකාව හැකි ඉක්මනින් අනුමත කර දීලා, ඊළඟ මැතිවරණයට කලින් ගුරු සේවාවක් විධියට ස්ථාපිත කර දෙන්න ඔබතුමා මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද, මැතිවරණයක් ආවොත් ආයෙත් මේ කටයුත්ත කල් යන නිසා. බොහොම ස්තුතියි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 1- 13/2020 - (1), ගරු බුද්ධික පතිරණ මහතා-
*[සභා ගර්භය තුළ නැත.]*

### අධ්‍යාපන පරිපාලන සේවයේ පුරප්පාඩු: ඌව පළාත
### இலங்கை கல்வி நிர்வாக சேவை வெற்றிடங்கள்: ஊவா மாகாணம்
### VACANCIES OF EDUCATION ADMINISTRATIVE SERVICE: UVA PROVINCE

54/2020

**2. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මේ වනවිට ඌව පළාතේ සේවය කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අයත් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන්ගේ නම්, තනතුරු හා සේවා ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඌව පළාතට අනුමත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) දැනට පළාතේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்டவினா:

(அ)(i) தற்சமயம் ஊவா மாகாணத்தில் சேவையாற்றும் இலங்கை கல்வி நிர்வாக சேவைக்குரிய உத்தியோகத்தர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) மேற்படி உத்தியோகத்தர்களின் பெயர்கள், பதவிகள் மற்றும் சேவையாற்றும் இடங்கள் தனித்தனியே யாவையென்பதையும்;

[ගරු ගරු චමින්ද විජේසිරි මහතා]

(iii ) ஊவா மாகாணத்திற்கு அங்கீகரிக்கப்பட்ட இலங்கை கல்வி நிர்வாக சேவை உத்தியோகத்தர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iv) தற்சமயம் ஊவா மாகாணத்தில் நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(v ) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்கு அமைச்சு மேற்கொள்ளவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) the number of Sri Lanka Education Administrative Service Officers serving in Uva Province at present;

(ii) the names of officers, positions and work places, separately;

(iii) the approved number of Sri Lanka Education Administrative Service Officers for Uva Province;

(iv) the number of vacancies in the province at present; and

(v) the measures that will be taken by the Ministry to fill those vacancies?

(b) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 105 යි, 2019.07.01 දිනට.

(ii) දීර්ඝ උත්තරයක් නිසා ඇමුණුම් 01 ලෙසට **සභාගත*** කරනවා.

(iii) 156 යි. ඇමුණුම් 02* බලන්න.

(iv) පුරප්පාඩු සංඛ්‍යාව 51කි.

(v) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සීමිත, විවෘත හා සේවා පළපුරුද්ද සහ කුසලතා පදනම මත බඳවා ගැනීම් සිදු කිරීමට නියමිත අතර, එම බඳවා ගැනීම් මඟින් මෙම පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම් **සභාගත*** කරමි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

පිළිතුරු සැපයීම වෙනුවෙන් ගරු අමාත්‍යතුමාට ස්තුතියි. ගරු අමාත්‍යතුමනි, ඌව පළාත රටේ අනාගතය වෙනුවෙන් විශාල දරු සම්පතක් නිර්මාණය කරන පළාතක්. ගරු ඇමතිතුමනි, ගුරු සේවයේ අය අධිසේවක කියන පදනම යටතේ විදුහල්පති සේවයේ පිහිටුවපු යුගයක් තිබුණා, ඔබතුමාට මතක ඇති. එවැනි විදුහල්පතිවරුන් තමයි තවමත් පාසල්වල ඉන්නේ. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් විදුහල්පතිවරුන් ලෙස බඳවා ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් පසුගිය කාලය තුළ ක්‍රියාත්මක වුණත්, පළාත් සභාව විසින් ඒවා නොතකා කටයුතු කරන ලද බව අපි දන්නවා. අධිසේවක පදනම යටතේ ගත් අය තමයි තවමත් සමහර පාසල්වල විදුහල්පතිවරුන් හැටියට ඉන්නේ. රටේ අනාගතය වෙනුවෙන් සුදුසු දරු සම්පත නිර්මාණය කරන පාසල්වලින් දේශපාලන වශයෙන් ලබා දුන් පත්වීම් අයින් කළ යුතුය කියන පදනම මත තමයි අපි පසුගිය ආණ්ඩුව කාලය තුළ නියමිත විභාග පවත්වලා, අදාළ පත් කිරීම් කරන්න කටයුතු කර තිබුණේ.

එක පැත්තකින්, අධිසේවයේ සිටින අපේ සමහර විදුහල්පතිවරුන්ටත් යම් අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා. මොකද, ඔවුන්ට උසස් වීමවත් නැහැ; දැනට සිටින සේවයේත් ස්ථිර නැහැ; වැටුප් වැඩි වීමකුත් නැහැ. නමුත්, දේශපාලනමය වශයෙන් එවැනි පත්වීම් ලබා දීම තුළ පාසල් පද්ධතිය විශාල බිඳ වැටීමකට ලක් වෙලා තිබෙනවා. උදාහරණයක් කිව්වොත්, අපේ පළාතේ පාසල් තිබුණත්, එම පාසල්වල ඉගෙන ගන්නා දරුවන්ගේ අධ්‍යාපන මට්ටමේ ඉහළ ගුණාත්මකභාවයක් පෙන්නුම් කරන්නේ නැහැ. එයට හේතුව තමයි, පාසල් පරිපාලන පද්ධතිය කඩා වැටීම.

ගරු ඇමතිතුමනි, නව රජය හැටියට ඔබතුමන්ලා විශේෂයෙන්ම මේ පත්වීම් තුළ තිබෙන ගුණ අගුණභාවය පිළිබඳව සොයා බලන්න. අපි පසුගිය කාලයේ රටට පිළිගන්න පුළුවන් විධියට විභාග පවත්වා පත් කරපු අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් එම විදුහල්වලට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා යම් සූදානමක් තිබෙනවාද කියා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධව එතුමා කියන දේවල් අපි හුඟක් දුරට පිළිගන්නවා. මෙය එදා ඉඳලා තිබෙන -දීර්ඝ කාලීනව තිබෙන- ප්‍රශ්නයක්. හැබැයි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව ඒ සියලුදෙනා සම්බන්ධයෙන් සාධාරණව ක්‍රියා කිරීමට අපි කටයුතු කරනවා. එහි කිසිම ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. ඇත්තටම ගරු අධ්‍යාපන ඇමතිතුමායි මේ ප්‍රශ්නයට පිළිතුර දෙන්න මේ ගරු සභාවට එන්න හිටියේ. එතුමාට උත්සවයකට සහභාගි වීමට තිබෙන නිසා මට ප්‍රකාශ කරන්න කිව්වා, ඉදිරි මාස කිහිපය තුළ මේ ප්‍රශ්නවලට විසඳුම් වහාම ලබා දෙනවා කියලා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, මෙහිදී විශේෂයෙන් වැදගත් වන කාරණයක් තිබෙනවා. අධ්‍යාපන පරිපාලන සේවයේ උසස්වීම් ලබා සිටින විදුහල්පතිවරුන් තවම ඉන්නේ ගුරු සේවයේයි. ඒ නිසා ඔවුන්ට හිමි තැන ලබා දෙන්න කටයුතු කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය අහනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලින් ප්‍රශ්නය සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කළොත් හොඳයි. මේවා, 1994 අවුරුද්දෙන් පසුව කරපු පත්වීම් දේශපාලන පත්වීම් බව අපි

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

දන්නවා. නමුත්, ඒ වැඩ බලන විදුහල්පතිවරු වැඩෙන්න ගිය පාසල් රැකගෙන තිබෙනවා. ඒ අයට ගුරු සේවයේ නියමිත උසස්වීමත් නැහැ. එතකොට විශ්‍රාම යන්න සිදු වෙලා තිබෙන්නේ ගුරු සේවයේ සිටියදීමයි. උදාහරණයක් විධියට, ගුරු සේවය 2 ශ්‍රේණියේ සිට වැඩ බලන විදුහල්පති පත්වීමකට ආ කෙනෙක් ගනිමු. වසර ගණනාවක් වැඩ බලන විදුහල්පතිවරයකු ලෙස සේවය කළත් අද වන විට ඔහුට විශ්‍රාම යෑමට සිදු වෙලා තිබෙන්නේ ගුරු සේවයේ සිටියදීමයි. වැඩ බලන පරිපාලන නිලධාරිනුත් අධිසේවක ගණයේලා පත් කරලා තිබෙනවා. සාධාරණයක් ඉෂ්ට නොවී විශ්‍රාම යන්න ඒ අයටත් අද සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා ඒ ගැනත් සලකා බලන්න කියන ඉල්ලීම කරන ගමන්, මම දෙවැනි අතුරු ප්‍රශ්නය යොමු කරන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1994 අවුරුද්දේ ඉඳලා 2015 අවුරුද්දට ආසන්න වන තෙක් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කාර්යක්ෂමතා කඩ ඉම් විභාග පැවැත්වූයේ නැහැ. උදාහරණයක් ලෙස නොවිධිමත් අධ්‍යාපන ව්‍යාපෘති නිලධාරීන් ගනිමු. ඒ අය වසර 3ක් ඇතුළත කාර්යක්ෂමතා කඩ ඉම් විභාගය සමත් විය යුතුයි කියලා තිබෙනවා. නමුත් විභාගය නොපැවැත්වීම හේතුකොටගෙන ඒ අයට එම සුදුසුකම සපුරාගන්න බැරි වෙලා තිබෙනවා. අපි ආංශික අධීක්ෂණ කාරක සභාවේදී කථා කරලා ඒ අය MN-06වලට ගෙනැල්ලා, ඒ ගොල්ලන්ගේ වැටුප සකස් කරන්න යනකොට හැත්තෑදෙනෙකු සම්බන්ධයෙන් ගැටලුවක් තිබුණා. එතැන එකසිය අනූඅටදෙනෙක් ඉන්නවා. එම එකසිය අනූඅටදෙනාගෙන් එකසිය විසිඅටදෙනෙක් ඊට පසු කාලයේ හෝ යම් සාධාරණයක් ඉටු කරගෙන තිබෙනවා. මේ වනවිට කාර්යක්ෂමතා කඩ ඉම් විභාගය නොපැවැත්වීම නිසා එම විභාගය සමත්වීමේ සුදුසුකම සපුරාගන්න බැරි වෙච්ච 70දෙනෙක් පමණ සිටිනවා. ඒ අය සම්බන්ධයෙන් යම්කිසි සහනයක් ලබා දිය හැකිද කියන ප්‍රශ්නය සහ කැබිනට් පත්‍රිකාවක් මගින් හෝ එම කටයුත්ත කරගන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තමයි මම අහන්නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සම්බන්ධව අධ්‍යාපන ඇමතිතුමා දැනුවත් කරලා, අසාධාරණයට ලක් වූ පිරිසට සාධාරණයක් ඉටු කිරීමට රජයක් හැටියට අපි අනිවාර්යයෙන්ම කටයුතු කරනවා. මේවා එදා පටන් එන ප්‍රශ්න. පසුගිය කාලයේත් මේ ප්‍රශ්න විසඳන්න බැරිවෙලා තිබෙනවා. අපේ කාලය තුළ එම ප්‍රශ්නවලට විසඳුම් ලබාදෙනවා. මම මේ සම්බන්ධයෙන් ගරු ඇමතුතිමා දැනුවත් කරන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 3 -81/2020- (1), ගරු හේෂා විතානගේ මැතිතුමා.
- *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -106/2020- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කැබිනට්, රාජ්‍ය සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් සඳහා මිලදී ගත් වාහන: විස්තර
## அமைச்சரவை, இராஜாங்க மற்றும் பிரதி அமைச்சர்களுக்குக் கொள்வனவு செய்த வாகனங்கள்: விபரம்
VEHICLES PURCHASED FOR CABINET, STATE AND DEPUTY MINISTERS: DETAILS

112/2020

**5. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015.01.08 දින සිට මේ දක්වා කැබිනට් අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් සඳහා වාහන මිලදී ගත් අවස්ථා කවරේද;

(ii) එක් එක් වාහනයේ වර්ගය හා මිල කවරේද;

(iii) එම වාහන සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சர் மற்றும் நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சர், புத்தசாசன, கலாசார மற்றும் சமய அலுவல்கள் அமைச்சர் மற்றும் நகர அபிவிருத்தி, நீர் வழங்கல் மற்றும் வீடமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்பதற்கு,- (1)

(அ) (i) 2015.01.08 ஆம் திகதியிலிருந்து இன்று வரை அமைச்சரவை அமைச்சர்கள், இராஜாங்க அமைச்சர்கள் மற்றும் பிரதி அமைச்சர்களுக்கென வாகனங்கள் கொள்வனவு செய்யப்பட்ட சந்தர்ப்பங்கள் யாவை என்பதையும்;

(ii) ஒவ்வொரு வாகனத்தினதும் வகை மற்றும் விலை யாது என்பதையும்;

(iii) மேற்படி வாகனங்களுக்கென செலவிடப்பட்ட மொத்த பணத் தொகை யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Finance, Economy and Policy Development, Minister of Buddhasasana, Cultural and Religious Affairs and Minister of Urban Development, Water Supply and Housing Facilities:

(a) Will he inform this House -

(i) the occasions when vehicles were purchased for Cabinet Ministers, State

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

Ministers and Deputy Ministers from 08.01.2015 to date;

(ii) the make and price of each vehicle; and

(iii) the total amount of money spent on those vehicles?

(b) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) මෙම කාල සීමාව තුළ අමාත්‍යවරුන් සඳහා වාහන මිලදී ගැනීම්වලට අදාළ තොරතුරු ඇමුණුම 01හි දක්වා ඇත.

ගරු මන්ත්‍රීතුමනි, ඇමුණුම 01හි දීර්ඝ විස්තරයක් තිබෙන්නේ. එම නිසා මා ඇමුණුම 01 **සභාගත*** කරනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ඔබතුමා සංඛ්‍යාව කියන්න කෝ. වාහන සියල්ලේ එකතුවට මොකක් හරි ඉලක්කමක් ඇති නේ?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

වාහනවලද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ඔව්, වාහනවල.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මම අන්තිමට ඒ සංඛ්‍යාව කියන්නම්.

(ii) අදාළ තොරතුර ඇමුණුම 01හි දක්වා ඇත.

(iii) අදාළ තොරතුර ඇමුණුම 01හි දක්වා ඇත.

ගරු මන්ත්‍රීතුමනි, වාහනවල වටිනාකමේ මුළු එකතුව වශයෙන් බිලියන 2.8ක් දක්වා මෙහි සඳහන් වනවා. රුපියල් ලක්ෂ 28,000ක වාහන අරගෙන තිබෙනවා, යහපාලන ආණ්ඩුව කාලයේ. ලෑන්ඩ්කෲසර්, බෙන්ස් ආදී වාහන ගණනාවක් මෙම ඇමුණුමේ තිබෙනවා. මෙය දීර්ඝ උත්තරයක්.

(ආ) පැන නොනඟී.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අහන්න අතුරු ප්‍රශ්න තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමනි, ඒ වාහන සංඛ්‍යාව කියන්න පුළුවන්ද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

වාහන සංඛ්‍යාවද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ඔව්.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

නැහැ, මේ පිළිතුරේ වාහන කීයද කියලා total එක නැහැ. වාහන එකින් එකේ අවුරුද්ද, මිල, duty එක, ජාතිය, ඒ හැම දේම තිබෙනවා. දීර්ඝ විස්තරයක් තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, රුපියල් ලක්ෂ 28,000ක වාහන ගෙන්වා තිබෙනවා. කැබිනට් ඇමතිවරුන්ට රුපියල් බිලියන 1.6ක -ලක්ෂ 16,000ක- වාහන ගෙන්වා තිබෙනවා. රාජ්‍ය ඇමතිවරුන්ට රුපියල් මිලියන 652ක වාහන ගෙන්වා තිබෙනවා. නියෝජ්‍ය ඇමතිවරුන්ට අරගෙන තිබෙනවා, රුපියල් මිලියන 564ක වාහන. රුපියල් ලක්ෂ 28,000 ඉක්මවා වාහන අරගෙන තිබෙනවා. දීර්ඝ පිළිතුරක් තිබෙන්නේ. ඕනෑ නම් එකින් එක කියවන්න පුළුවන්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

වෙලාව අරගෙන කියෙව්වත් කමක් නැහැ නේද, ඇමතිතුමනි. ඒවා රට දැනගන්නත් ඕනෑ, අඩුම තරමින් ඉදිරියේදී හරි ඒ දේවල් පාලනය වෙන්න. අපි වෙලාව අරගෙන කියවමු. පාර්ලිමේන්තුවේ වෙලාවට වඩා වැදගත් වනවා, රටේ මිනිසුන්ගේ මුදල් ඉතිරි කර ගන්නා එක.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ඇමුණුම 01හි මෙසේ සඳහන් වනවා.

ගරු අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් සඳහා 2015.01.08 දින සිට 2019.11.30 දක්වා ලබාදුන් වාහන වාර්තාව.

**ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය.**

2017.01.30වන දින. ප්‍රතිපාදන මිලියන 43යි. ලෑන්ඩ් කෲෂර් VTJ 200R. මිල මිලියන 39.52යි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමනි, ඔය මුදල බදුත් එක්කද?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඔව්, බදුන් එක්ක.

**විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ, අමාත්‍යාංශය.**

අමාත්‍යවරයාට මර්සිඩීස් බෙන්ස් S 300, මිල මිලියන 41යි. ටොයෝටා කෘසර් වී8, මිලියන 32ත02යි. රාජ්‍ය අමාත්‍යවරයාට ටොයෝටා ලෑන්ඩ් කෲෂර්, මිලියන 39.37යි.

**විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශය.**

අමාත්‍යවරයාට ලෑන්ඩ් කෘසර් VTJ 200R, මිලියන 39යි. බීඑම්ඩබ් කාර්, මිලියන 39.9යි.

**මුදල් අමාත්‍යාංශය**

මර්සිඩීස් බෙන්ස් රථය, මිලියන 33යි.

**අරක්ෂක අමාත්‍යාංශය**

2016දී වෙඩි නොවදින වාහන 2යි. මිලියන 151යි. 2017.04.04 දින මර්සිඩීස් බෙන්ස් වෑන්, මිලියන 8.6යි. 2017.06.05 දින රේන්ජ් රෝවර් ජීප්- මිලියන 23.89යි. 2017.06.16 දින, ලෙක්ෂස් කාර් - මිලියන 12.46යි. 2017.06.16 දින ලෑන්ඩ් කෘසර් - මිලියන 9.52යි.

2019.03.12 දින, බීඑම්ඩබ් එක්ස් 5 - මිලියන 104යි.

ආරක්ෂක අමාත්‍යාංශයේ ඒවා කියවන්නේ ඩියුටි නැතිව.

2019.05.08 වන දින වොල්වෝ එකයි. ඩියුටි ෆ්‍රී. මිලියන 18යි. එක්කෝටි අසූතුන් ලක්ෂයයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඔබතුමා දැන් කියපු වාහන ආරක්ෂක අමාත්‍යාංශයටද අරගෙන තිබෙන්නේ?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඔව්. ආරක්ෂක අමාත්‍යාංශයට අරගෙන තිබෙන duty-free, waived off වාහන.

**ජාතික ප්‍රතිපත්ති ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය.**

අමාත්‍යවරයාට, 2016.09.21 වන දින. අවුඩි කිව් 7- මිලියන 20යි. 2016.05.05වන දින, ටොයෝටා ලෑන්ඩ් කෲෂර් වී 8 - මිලියන 42යි. ටොයෝටා හයිලක්ස් - මිලියන 8.5යි.

**තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය**

ඇමතිවරයාට රේන්ජ් රෝවර් ස්පෝර්ට් (පෙට්‍රල්) - මිලියන 42යි. නියෝජ්‍ය ඇමතිවරයාට ඩීසල් එකකුත් අරගෙන තිබෙනවා. ඒකත් මිලියන 42ක්.

**අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

2016.05.17. බීඑම්ඩබ් කාර් 740එල්ඊ - මිලියන 39යි. ටොයෝටා ලෑන්ඩ් කෘසර්- මිලියන 40යි.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මම නම් නොවෙයි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
**සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

2017.02.09වන දින. ටොයෝටා ලෑන්ඩ් කෘසර් - මිලියන 39.69යි. ටොයෝටා ලෑන්ඩ් කෘසර් වී8 - මිලියන 39.69යි. ඒක නියෝජ්‍ය ඇමතිවරයාට.

**විදේශ කටයුතු අමාත්‍යාංශය**

2017.05.09වන දින, මර්සිඩිස් බෙන්ස් - මිලියන 41.5යි. තව මර්සිඩිස් බෙන්ස් වාහනයක් අරගෙන තිබෙනවා - මිලියන 43යි.

**මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

අමාත්‍යවරයාට අරගෙන තිබෙනවා, 2016.05.13වන දින, මර්සිඩිස් බෙන්ස් 350 - මිලියන 16.8යි. බීඑම්ඩබ් කාර් රථය - මිලියන 31.9යි. බීඑම්ඩබ් 740එල්ඊ - මිලියන 40.75යි. රාජ්‍ය අමාත්‍යවරයාට - බීඑම්ඩබ් 740එල්ඊ - මිලියන 32.69යි. නියෝජ්‍ය අමාත්‍යවරයාට බීඑම්ඩබ් කාර් රථය, මිලියන 31.6.00යි.

**කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

රාජ්‍ය ඇමතිවරයාට - ලෑන්ඩ් කෘසර් රථය, මිලියන 40.91යි. නියෝජ්‍ය ඇමතිවරයාට ලෑන්ඩ් කෘසර් රථය - මිලියන 40.91යි. 2017.01.06වන දින අමාත්‍යවරයාට - ටොයොටා ලෑන්ඩ් කෲෂර් වී8 රථය - මිලියන 40.22යි.

**විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය**

2016.05.13වන දින බීඑම්ඩබ් ජීප් රථය - මිලියන 32.20යි.

**කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය.**

2016.06.17වන දින, මර්සිඩිස් බෙන්ස් කාර් රථය - මිලියන 41යි. ලෑන්ඩ් කෲෂර් ජීප් රථය, මිලියන 42.5යි.

**ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.**

රාජ්‍ය අමාත්‍යවරයාට ප්‍රෙස්ටීජ් ඔටෝ හයිබ්‍රිඩ් බීඑම්ඩබ් රථය, මිලියන 32.25යි.

2019.05.07වන දින වොල්වෝ xc90TB රථය - මිලියන 38.80යි.

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

**ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීම අමාත්‍යාංශය**

අමාත්‍යවරයාට මර්සිඩීස් බෙන්ස් රථය , මිලියන 35යි.

**අධ්‍යාපන අමාත්‍යාංශය**

2017.02.03වන දින, බීඑම්ඩබ්. කාර් රථය, මිලියන 40.70යි. රාජ්‍ය ඇමතිවරයාට අරගෙන තිබෙනවා, බීඑම්ඩබ් කාර් එකක්, මිලියන 39.90යි.

**රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය**

2016.05.31වන දින නියෝජ්‍ය අමාත්‍යවරයාට මර්සිඩීස් බෙන්ස් හයිබ්‍රිඩ් රථය, මිලියන 37.47යි.

2016.04.27වන දින අමාත්‍යවරයාට බීඑම්ඩබ් එක්ස්5 රථය, මිලියන 31.61යි.

නියෝජ්‍ය ඇමතිවරයාට ඩිස්කවරියක් අරගෙන තිබෙනවා රුපියල් මිලියන 28යි.

**වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**

2017.02.09 වන දින බීඑම්ඩබ්ලිව් 740 LE කාර් රථය, මිලියන 40.41යි.

**කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය**

2016.05.11 වන දින ටොයොටා ලෑන්ඩ් කෲසර් V8 රථය, මිලියන 42යි.

**කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය**

2017.02.27 වන දින. ලෑන්ඩ් කෲසර් රථය, රුපියල් මිලියන 39යි. එදාම ඩිස්කවරියක් අරගෙන තිබෙනවා, රුපියල් මිලියන 42.66යි.

2016 වසරේ බීඑම්ඩබ්ලිව් කාර් එකක් අරගෙන තිබෙනවා, රුපියල් මිලියන 35යි. 2016.06.20 වන දින රාජ්‍ය ඇමතිවරයාට බීඑම්ඩබ්ලිව් කාර් එකක් අරගෙන තිබෙනවා.

**අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

2016.05.18 වන දින අවුඩි A8 එකක් අරගෙන තිබෙනවා, රුපියල් මිලියන 35යි. නියෝජ්‍ය ඇමතිවරයාට අවුඩි Q7 එකක් අරගෙන තිබෙනවා, රුපියල් මිලියන 28යි. 2016.06.16 වන දින රාජ්‍ය ඇමතිවරයාට මර්සිඩීස් බෙන්ස් රථයක් අරගෙන තිබෙනවා, රුපියල් මිලියන 35යි. ඊළඟට, ආපසු මාස තුනකට පසුව 2016 අටවන මාසයේ ඇමතිතුමාට අරගෙන තිබෙනවා රේන්ජ් රෝවර් ස්පෝට්ස් එකක්, මිලියන 42යි

**ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය**

2017.03.24 දින, ටොයොටා ලෑන්ඩ් කෲසර් V8 රථය, මිලියන 39.90යි. 2017.09.11 දින රාජ්‍ය ඇමතිවරයාට ලෑන්ඩ් රෝවර් රථයක් අරගෙන තිබෙනවා, මිලියන 43යි. 2018.06.04 දින නියෝජ්‍ය ඇමතිවරයාට අරගෙන තිබෙනවා, බීඑම්ඩබ්ලිව් කාර් රථයක්, මිලියන 32.70යි.

**රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යාංශය**

2016.06.07 දින අරගෙන තිබෙනවා, මර්සිඩීස් බෙන්ස් කාර් රථයක්, මිලියන 35යි. නියෝජ්‍ය ඇමතිවරයාට අරගෙන තිබෙනවා ඒ දිනයේම ලෑන්ඩ් කෲසර් ජීප් රථයක්, මිලියන 39.70යි.

**සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය**

2016.05.12 දින රාජ්‍ය ඇමතිවරයාට අරගෙන තිබෙනවා, බීඑම්ඩබ්ලිව් කාර් රථයක්, මිලියන 31.38යි. 2017.01.26 ඇමතිවරයාට අරගෙන තිබෙනවා, ටොයොටා ලෑන්ඩ් කෲසර් V8 එකක්, මිලියන 39.78යි.

**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**

2016.10.27 දින රාජ්‍ය ඇමතිවරයාට අරගෙන තිබෙනවා, මර්සිඩීස් බෙන්ස් GLS 350 රථයක්, මිලියන 43යි.

**මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය**

නියෝජ්‍ය ඇමතිවරයාට 2016.07.26 අරගෙන තිබෙනවා, ටොයොටා VDJ 200 R රථය රුපියල් මිලියන 42.50යි.

**නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය**

ඇමතිවරයාට 2016.05.02 දින අරගෙන තිබෙනවා, ලෑන්ඩ් කෲසර් ජීප් රථයක් රුපියල් මිලියන 39.29යි. රාජ්‍ය ඇමතිවරයාට අරගෙන තිබෙනවා ලෑන්ඩ් කෲෂර් එකක්, මිලිය 39.09යි

2016.11.09 දින රාජ්‍ය ඇමතිවරයාට මර්සිඩීස් බෙන්ස් රථයක් අරගෙන තිබෙනවා, රුපියල් මිලියන 35යි.

**වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය**

අමාත්‍යවරයාට 2016.06.16 අරගෙන තිබෙනවා, ටොයොටා ලෑන්ඩ් කෲසර් V8 එකක්, රුපියල් මිලියන 40යි.

නියෝජ්‍ය අමාත්‍යවරයා අරගෙන තිබෙනවා, ලෑන්ඩ් කෲසර් ජීප් රථයක් රුපියල් මිලියන 40යි.

**විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය**

අමාත්‍යවරයාට 2017.03.01 දින මර්සිඩීස් බෙන්ස් රථයක් අරගෙන තිබෙනවා, රුපියල් මිලියන 41.44යි.

නියෝජ්‍ය අමාත්‍යවරයාට අරගෙන තිබෙනවා, ලෑන්ඩ් කෲසර් V8 ජීප් රථයක්, රුපියල් මිලියන 39.56යි.

2017.01.30 දින අමාත්‍යවරයාට අරගෙන තිබෙනවා, ලෑන්ඩ් රෝවර් එකක්, රුපියල් මිලියන 41යි.

2017.02.15 නැවතත් ඇමතිතුමාට අරගෙන තිබෙනවා, මර්සිඩීස් බෙන්ස් රථයක්, රුපියල් මිලියන 38.20යි. එක දිගට 2017.03.01, 2017.01.30, 2017.02.15 දිනවල රථ තුනක් අරගෙන තිබෙනවා.

**සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය**

අමාත්‍යවරයාට 2016.05.13වන දින අරගෙන තිබෙනවා, ග්‍රෑන්ඩ් චැරොකී එකක්, රුපියල් මිලියන 35.28යි.

රාජ්‍ය ඇමතිවරයාට අරගෙන තිබෙනවා මර්සිඩීස් බෙන්ස් රථයක්, මිලියන 41යි.

සියල්ලේ එකතුව, ඇමතිවරුන්ට බිලියන 1.65යි, රාජ්‍ය ඇමතිවරුන්ට මිලියන 652.85යි. නියෝජ්‍ය ඇමතිවරුන්ට මිලියන 564.99යි.

එච්චරයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
දීර්ඝ උත්තරයක් ලබාදීම ගැන ගරු අගමැතිතුමාටත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

මම දැනගන්නට කැමැතියි, ඇත්තටම මේ කැබිනට් ඇමතිවරුන්ට, නියෝජ්‍ය ඇමතිවරුන්ට සහ රාජ්‍ය ඇමතිවරුන්ට ගෙනාව වාහනවල ලැයිස්තුවද, එහෙම නැත්නම් ඉන්ද්‍රා ට්‍රේඩර්ස් එක හෝ රණතුංග මෝටර්ස් එක ගෙනාපු වාහන ලැයිස්තුවක් ඔබතුමාට වැරදිලා ඉදිරිපත් කළාද කියලා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මේක කැබිනට් ඇමතිවරුන්ට, නියෝජ්‍ය ඇමතිවරුන්ට සහ රාජ්‍ය ඇමතිවරුන්ට ගත්ත වාහනවල ලැයිස්තුව.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ආර්ථිකය තිබුණු තැනයි, අපේ රටේ අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් රාජ්‍ය මුදල් වියදම් කළ ආකාරය පිළිබඳවයි යම් පැතිකඩක්, -මේ සමස්තය නොවෙයි- තමයි මේ වාහන පාවිච්චිය හරහා පෙන්නුම් කරන්නේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දන්නා පරිදි ඒ අමාත්‍යවරුන්ගෙන් යම් කණ්ඩායමක් ඔබතුමන්ලාගේ ආණ්ඩුවේත් ඇමතිවරු. මම අහගෙන ඉන්නකොට තේරුණා, ඔය වාහන ලැයිස්තුවට අදාළ අමාත්‍යවරුන්ගෙන් සමහර අය දැන් ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ රාජ්‍ය අමාත්‍යවරු බව. ඒ කියන්නේ එතුමන්ලා මේ පැත්තේ ඉන්නකොටත් ඒ සුඛවිහරණ සහිතව ජීවිත ගත කළා. නැවත ඒ අය ඔබතුමන්ලාගේ ආණ්ඩුවේත් රාජ්‍ය අමාත්‍යවරුන් බවට පත්වෙලා තිබෙනවා, සමහර අය කැබිනට් අමාත්‍යවරු බවටත් පත්වෙලා තිබෙනවා. මේ පාවිච්චි කරන වාහන විශාල තොගය අධික මිල ගණන් සහිත වාහන.

මේ වාහන ප්‍රසිද්ධියේ වෙන්දේසි කොට එක්කෝ විශ්‍රාම වැටුප ලබන අයගේ කප්පාදු කළ විශ්‍රාම වැටුප ගෙවන්නට පුළුවන්ද? මහරගම පිළිකා රෝහලේ ස්කෑන් යන්ත්‍රයක ප්‍රශ්නයක් තිබෙනවා, එය ලබා දෙන්නට පුළුවන්ද, එහෙම නැත්නම් මේ වාහන නැවත ඔබතුමන්ලා අතර බෙදා ගන්නවාද කියන එක තමයි මට දැනගන්නට ඕනෑකම තිබෙන්නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුර දිසානායක මන්ත්‍රීතුමා කියපු එක කාරණයක් තමයි, හිටපු ඇමතිවරුන් දැන් රාජ්‍ය ඇමතිවරුන් වශයෙන් ආණ්ඩු පක්ෂයේ ඉන්නවාය කියන එක. එහෙම වෙන්න ඇති. 2014 වර්ෂයට පෙර සිටි බොහෝ අය ගිහින් ඒ පැත්තේ කැබිනට් ඇමති ධුර පවා ලබාගත්තා. ඉතිහාසයේ එහෙම සිද්ධවෙලා තිබෙනවා. තමුන්නාන්සේලාත් ඉතිහාසයේ ආණ්ඩුවල ඇමති ධුර දරා තිබෙනවා. ඒක තමයි ඉතිහාසය. එතකොට ඔබතුමන්ලාත් වාහන පාවිච්චි කරලා තිබෙනවා. වාහන පාවිච්චි කළේ නැහැයි කියලා කියන්න බැහැ. මේ ප්‍රශ්නය අප උඩින් තියලා ඒ වාහන වෙන්දේසි කරන්න කියලා ඔබතුමන්ලාටත් ඇඟ බේරාගන්න බැහැ. ඒ ආණ්ඩුව ඉවත් කරන්න කිව්වාම ඉවත් නොකරපු පක්ෂයක්, ඔබතුමන්ලාගේ පක්ෂය. එදා මේ හැම දෙයකටම ඔබතුමන්ලා උදවු කළා.

අරලියගහ මන්දිරයට පිටි පස්සේ දොරෙන් නොව ඉස්සරහ දොරෙන් ගිහින්, මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා, නඩු දැමීම සඳහා කෙළින්ම ඒ ආණ්ඩුවත් එක්ක හිටපු අය තමයි ඔබතුමන්ලා. ඒ වාහන වෙන්දේසි කරන්නය කියලා අපට කියනවා නම්, ඔබතුමන්ලාට කරන්න තිබුණේ මේ වාහන ගන්නකොට ඒවා නතර කරන එකයි. ඒ සඳහා ඔබතුමන්ලාට නොයෙක් අවස්ථාවලදී කටයුතු කරන්න තිබුණා. ඒ නිසා ඔබතුමන්ලාත් මේ සම්බන්ධයෙන් වග කීමක් ගන්න ඕනෑ.

අද වෙද්දී විශ්‍රාම වැටුප්, අරවා, මේවා ආදි සියලු ප්‍රශ්න පැන නැඟී තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, ඔබතුමන්ලා උදවු කරපු යහ පාලන ආණ්ඩුවෙන් ආර්ථිකය විනාශ කරපු හැටි. ආර්ථිකයට දැවැන්ත විනාශයක් කළා. ආසියාවේ තිබුණු දියුණුම ආර්ථිකයේ සිට ආසියාවේ තිබෙන අඩුම ආර්ථික වර්ධන වේගය දක්වා රට ගෙනාපු ආණ්ඩුවේ සිටියේ තමුන්නාන්සේලායි. තමුන්නාන්සේලාට ඒකෙන් ගැලවෙන්න බැහැ. තමුන්නාන්සේලා මේවා කියනවාට මා විරුද්ධ නැහැ. හැබැයි මා කියන්නේ යථාර්ථයයි. ඒ කාලයේ මේවා කළා නම් ජනතාව ඔබතුමන්ලා වෙනුවෙන් ලබාදුන් ඡන්ද ප්‍රතිශතය සියයට 3කට බස්සන්නේ නැතුව මීට වඩා ඡන්ද ප්‍රතිශතයක් ලබාදෙන්න ඉඩ තිබුණා. ඒ රජය ආරක්ෂා කරන්න තමුන්නාන්සේලා වැරදි තීන්දු තීරණ ගත්ත නිසා තමයි ඔබතුමන්ලාට, ඒ පක්ෂයට ඡන්ද ප්‍රතිශතය අඩු වුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක තමයි යථාර්ථය, මේක තමයි ඇත්ත තත්ත්වය.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. ප්‍රශ්න අංක 6 -14/2020- (1), ගරු බුද්ධික පතිරණ මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7 -55/2020- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා,

එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 8 -82/2020- (1), ගරු හේෂා විතානගේ මහතා. --
*[සභා ගර්භය තුළ නැත.]*

## මීතොටමුල්ල කුණු කන්ද කඩා වැටීමෙන් විපතට පත්වූවන්: වන්දි
## மீதொட்டமுல்ல குப்பை மேடு சரிந்து வீழ்ந்ததனால் பாதிக்கப்பட்டோர்: நட்டஈட்டு
## VICTIMS OF LANDSLIDE AT MEETHOTAMULLA GARBAGE DUMP: COMPENSATION

107/2020

**9. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාව සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2017 වර්ෂයේදී මීතොටමුල්ල කුණු කන්ද කඩා වැටීමෙන්;
- (i) මියගිය සංඛ්‍යාව;
- (ii) ආබාධිත වූ සංඛ්‍යාව;
- (iii) විපතට පත්වූවන්ට රජය විසින් ගෙවූ මුළු වන්දි මුදල;
- (iv) මියගිය පුද්ගලයෙකු වෙනුවෙන් ගෙවූ වන්දි මුදල;
- (v) හානියට පත් නිවාස වෙනුවෙන් ගෙවූ උපරිම සහ අවම වන්දි මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ)
- (i) අවතැන් වූ සියලු දෙනාට ස්ථිර නිවාස ලබා දී තිබේද;
- (ii) අවතැන් වූ පවුලකට ස්ථිර නිවාසයක් ලබා දුන් ආසන්නතම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மகாவலி, கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமிய அபிவிருத்தி அமைச்சர் மற்றும் உள்ளக வர்த்தக, உணவுப் பாதுகாப்பு மற்றும் பாவனையாளர் நலனோம்புகை அமைச்சர் மற்றும் பாதுகாப்பு இராஜாங்க அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) 2017 ஆம் ஆண்டு மீதொட்டமுல்ல குப்பை மேடு சரிந்து வீழ்ந்ததனால்,
- (i) உயிரிழந்தவர்களின் எண்ணிக்கை;
- (ii) அங்கவீனமுற்றோர்களின் எண்ணிக்கை;
- (iii) பாதிக்கப்பட்டவர்களுக்கு அரசாங்கத்தினால் செலுத்தப்பட்ட மொத்த நட்டஈட்டுத் தொகை;
- (iv) உயிரிழந்த ஒருவருக்குச் செலுத்தப்பட்ட நட்டஈட்டுத் தொகை;
- (v) சேதமடைந்த வீடுகளுக்காகச் செலுத்தப்பட்ட அதிகபட்ச மற்றும் குறைந்தபட்ச நட்டஈட்டுத் தொகை;

எவ்வளவு என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ)
- (i) இடம்பெயர்ந்த அனைவருக்கும் நிரந்தர வீடுகள் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;
- (ii) இடம்பெயர்ந்த ஒரு குடும்பத்திற்கு நிரந்தர வீடொன்று வழங்கப்பட்ட அண்மித்த திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Mahaweli, Agriculture, Irrigation and Rural Development and Minister of Internal Trade, Food Security and Consumer Welfare and State Minister of Defence:

(a) Will he inform this House-
- (i) the number of people who died;
- (ii) the number of people who got disabled;
- (iii) the full amount of compensation paid for the victims by the Government;
- (iv) the compensation paid on behalf of a deceased person; and
- (v) the maximum and minimum compensation paid for damaged houses; in connection with the landslide of Meethotamulla garbage dump in the year of 2017?

(b) Will he also inform this House-
- (i) whether all displaced people have been provided with permanent houses; and
- (ii) the most recent date on which a displaced family was provided with a permanent house?

(c) If not, why?

**ගරු චමල් රාජපක්ෂ මහතා (මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය, අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - மகாவலி, கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமிய அபிவிருத்தி அமைச்சரும் உள்ளக வர்த்தக, உணவுப் பாதுகாப்பு மற்றும் பாவனையாளர் நலனோம்புகை அமைச்சரும் பாதுகாப்பு இராஜாங்க அமைச்சரும்)
(The Hon. Chamal Rajapaksa - Minister of Mahaweli, Agriculture, Irrigation and Rural Development, Minister of Internal Trade, Food Security and Consumer Welfare and State Minister of Defence)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ)
- (i) මිය ගිය සංඛ්‍යාව 32කි.
- (ii) ආබාධිත වූ සංඛ්‍යාව 01කි.
- (iii) 2017 සිට 2019 කාලය තුළ රජය විසින් වැය කළ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් 1,725,270,502.61කි.
- (iv) මිය ගිය එක් පුද්ගලයකු වෙනුවෙන් රජය මඟින් රුපියල් ලක්ෂ 9ක වන්දි මුදලක් හා ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් රුපියල් ලක්ෂයක වන්දි මුදලක් වන ලෙසින් එක් පුද්ගලයකු වෙනුවෙන් රුපියල් මිලියනයක වන්දි මුදලක් ලබාදෙන ලදී.

(v) අවම වන්දි මුදල රුපියල් 120,000.00යි.

උපරිම වන්දි මුදල රුපියල් 13,342,500.00යි

(ආ) (i) නිවාස හෝ වන්දි මුදල් ලබා දී ඇත.

(ii) 2019.05.23 (වන්දි මුදල ලබා ගැනීම සඳහා එකඟතාව පළ කිරීමට ප්‍රමාද වූ පුද්ගලයන් සඳහා)

(ඇ) පැන නොනඟී.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ව්‍යසනය ස්වාභාවික ව්‍යසනයක් නොවෙයි. නොසැලකිල්ල මත ඇති කරන ලද ව්‍යසනයක්. එම නිසා මේ සම්බන්ධයෙන් වගකිව යුත්තේ කවුරුන්දැයි සොයා බැලීම සඳහා කමිටුවක් පත් කළා. ජනතාවට වන්දි ලබා දෙනවා වාගේම, රට තුළ යළි මෙවන් ව්‍යසන සිදු නොවෙන්නට වගබලා ගැනීම ආණ්ඩුවක් විධියට, මන්ත්‍රීවරු විධියට අපේ යුතුකමක්. එම නිසා ඒ සඳහා පත් කළ කමිටුව විසින් එම ව්‍යසනයට හේතුව හඳුනාගෙන තිබෙනවාද, ඒ පිළිබඳව යම් ක්‍රියාමාර්ග ගෙන තිබෙනවාද කියා මා ගරු අමාත්‍යතුමාගෙන් දැන ගන්නට කැමැතියි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම කමිටුවේ වාර්තාව මට බලන්න හැකියාව ලැබුණේ නැහැ. එතුමා සඳහන් කළ නිසා මම වහාම ඒ පිළිබඳව සොයා බලා පිළිතුරක් ලබා දෙන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවාද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ඒ අතුරු ප්‍රශ්නය ප්‍රමාණවත්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 10 -113/2020- (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරිසර සහ වනජීවී සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවැනි වටය.

## මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපනය: විස්තර
### போதைப் பொருளுக்கு அடிமையானோருக்கான சிகிச்சை மற்றும் புனர்வாழ்வளிப்பு: விபரம்
### TREATMENT AND REHABILITATION FOR DRUG ADDICTS: DETAILS

13/2020

1. **ගරු චමින්ද විජේසිරි මහතා (ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)**
(மாண்புமிகு சமிந்த விஜேசிறி - மாண்புமிகு புத்திக பதிரண சார்பாக)
(The Hon. Chaminda Wijesiri on behalf of the Hon. Buddhika Pathirana)
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා නේවාසික ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවා සපයන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආයතනවල නම් කවරේද;

(iii) 2017 වර්ෂයේදී උක්ත රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන සඳහා රජය විසින් වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2016 හා 2017 වර්ෂවලදී පුනරුත්ථාපන ආයතන සඳහා යොමු කළ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පුනරුත්ථාපන ආයතනවලින් පිටව යන පුද්ගලයන් පිළිබඳ පසුවිපරම් සිදු කිරීමට ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மகாவலி, கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமிய அபிவிருத்தி அமைச்சர் மற்றும் உள்ளக வர்த்தக, உணவுப் பாதுகாப்பு மற்றும் பாவனையாளர் நலனோம்புகை அமைச்சர் மற்றும் பாதுகாப்பு இராஜாங்க அமைச்சரைக் கேட்டவினா:

(அ)(i) இலங்கையில் போதைப் பொருளுக்கு அடிமை யானவர்களுக்கு வதிவிட சிகிச்சை மற்றும் புனர்வாழ்வளிப்பு சேவைகளை வழங்கும் அரச, அரச சார்பற்ற நிறுவனங்களின் எண்ணிக்கை தனித்தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி நிறுவனங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) 2017 ஆம் ஆண்டு மேற்படி அரச நிறுவனங்கள் மற்றும் அரச சார்பற்ற நிறுவனங்களுக்கு அரசாங்கத்தினால் செலவிடப்பட்ட தொகை தனித்தனியே எவ்வளவு என்பதையும்;

[ගරු චමින්ද විජේසිරි මහතා]

(iv) 2016 மற்றும் 2017 ஆண்டுகளில் புனர் வாழ்வளிப்பு நிறுவனங்களுக்கு அனுப்பப் பட்டவர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) புனர்வாழ்வளிப்பு நிறுவனங்களிலிருந்து வெளி யேறுபவர்கள் பற்றி பின்னாய்வை மேற் கொள்ளும் முறையியலொன்று உள்ளதா என்பதையும்;

(ii) ஆமெனின், மேற்படி முறையியல் யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Mahaweli, Agriculture, Irrigation and Rural Development and Minister of Internal Trade, Food Security and Consumer Welfare and State Minister of Defence:

(a) Will he inform this House-

(i) the number of government and non-government institutions that provide residential treatment and rehabilitation services within Sri Lanka for drug addicts, separately;

(ii) the names of those institutions;

(iii) the amount spent by the Government in 2017 for the said government and non-government institutions, separately; and

(iv) the number of persons referred to the rehabilitation institutions in 2016 and 2017?

(b) Will he also inform this House-

(i) whether there is a method for follow-up on people who leave the rehabilitation institutions; and

(ii) if so, what that method is?

(c) If not, why?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) රාජ්‍ය ආයතන සංඛ්‍යාව - 17

රාජ්‍ය නොවන ආයතන සංඛ්‍යාව - 13

(ii) රාජ්‍ය ආයතන

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මඟින් පාලනය වන රාජ්‍ය ආයතන - 04

- නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - මහේනවත්ත, උරපොල, නිට්ටඹුව.
- තලංගම, ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - 172, ශාන්ති මාවත, තලංගම කොස්වත්ත.
- ගාල්ල ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - උණවටුන, ගාල්ල.
- නුවර ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - මාම්පිටිය වත්ත, හන්දෙස්ස, මහනුවර.

නම් කරන ලද ප්‍රතිකාර මධ්‍යස්ථාන (බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන) 2010 ගැසට් පත්‍රයට අනුව - 10

- පල්ලෙකැලේ බන්ධනාගාරය, පල්ලෙකැලේ
- වටරෑක බන්ධනාගාරය, වටරෑක
- තල්දෙන බන්ධනාගාරය, තල්දෙන
- වීරවිල බන්ධනාගාරය, වීරවිල
- අනුරාධපුර බන්ධනාගාරය, අනුරාධපුර
- පල්ලන්සේන බන්ධනාගාරය, පල්ලන්සේන
- කන්දෙවත්ත බන්ධනාගාරය, කන්දෙවත්ත
- මීතිරිගල බන්ධනාගාරය, මීතිරිගල
- කළුතර බන්ධනාගාරය, කළුතර
- අඹේපුස්ස බන්ධනාගාරය, අඹේපුස්ස

සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන මධ්‍යස්ථාන - 01

- ජයවිරු සමාධි නිවහන, පුවක්පිටිය ප්‍රතිකාර මධ්‍යස්ථානය

පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව (ඌව පළාත) මඟින් පාලනය වන මධ්‍යස්ථාන - 01

- සමාධි නිවහන, හාලිඇල ප්‍රතිකාර මධ්‍යස්ථානය

පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය මඟින් පාලනය වන මධ්‍යස්ථාන - 01

- කන්දකාඩු මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය

රාජ්‍ය නොවන ආයතන
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මඟින් පාලනය වන රාජ්‍ය නොවන ආයතන - 13

- අඳුරෙන් ආලෝකය ප්‍රතිකාර මධ්‍යස්ථානය, කටාන
- බලය නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය, බණ්ඩාරගම
- මිතුරු මිතුරෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය, පැල්මඩුල්ල
- නිසංසල ප්‍රතිකාර මධ්‍යස්ථානය, බුත්පිටිය
- මීදුම ප්‍රතිකාර මධ්‍යස්ථානය, වත්තල
- බෙතෙස්දා කරුණාවේ නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය, කොච්චිකඩේ
- නිදහස ප්‍රතිකාර මධ්‍යස්ථානය, කුරුවිට
- සෙනෙහස ප්‍රතිකාර මධ්‍යස්ථානය, පිළියන්දල
- ජයවිරු සමාධි නිවහන ප්‍රතිකාර මධ්‍යස්ථානය, පුවක්පිටිය
- සමාධි නිවහන ප්‍රතිකාර මධ්‍යස්ථානනය, හාලිඇල
- විමෝචන ප්‍රතිකාර මධ්‍යස්ථානය, මඩකලපුව
- සුමිත්‍රයෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය, කොළඹ 07
- කරුණාවේ නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය, හොරණ

(iii) ආරක්ෂක අමාත්‍යාංශය මඟින් මුදල් වෙන්කර දෙනු ලබන්නේ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අයත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන හතරට පමණි. එබැවින්, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මඟින් පාලනය වන මධ්‍යස්ථාන හතර සඳහා 2017 වසරේදී රුපියල් 19,805,230.38ක මුදලක් වැයකර තිබේ.

රාජ්‍ය නොවන ආයතන සඳහා වන මුදල් එම ආයතන මඟින් දරනු ලැබේ.

(iv)

| ආයතනය | පුනරුත්ථාපනයට යොමු කළ සංඛ්‍යාව | |
|---|---|---|
| | 2016 | 2017 |
| රාජ්‍ය ආයතන | 1,881 | 2,098 |
| රාජ්‍ය නොවන ආයතන | 474 | 608 |
| එකතුව | 2,355 | 2,706 |

(ආ) (i) ඔව්.

(ii) අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශයේ සහ බාහිර සේවා අංශයේ නිලධාරින් විසින් පසු රැකවරණ සේවා සපයයි. සේවාලාභින්ගේ නිවෙස්වලට, ඔවුන්ගේ රැකියා ස්ථානයට හෝ ඔවුන් විසින් නම් කරන ලද ස්ථානයට ගොස් ඔවුන්ගේ නව ජීවන රටා පිළිබඳ විස්තර සොයා බලා නැවත භාවිතයට යොමු වූ පුද්ගලයන් නැවත ප්‍රතිකාර සඳහා යොමු කරනු ලැබේ.

සුව වූවන් සඳහා ප්‍රතිකාර මධ්‍යස්ථාන තුළ මාසිකව පවත්වනු ලබන පසු රැකවරණ හමු මඟින් අදාළ සේවාලාභින්ගේ පෞරුෂත්වය, ජීවන කුසලතා නැංවීමට කටයුතු කරනු ලැබේ.

දුරකථන ඇමතුම් සහ ලිපි මඟින්ද පසු රැකවරණ සේවා සපයනු ලබයි.

රාජ්‍ය නොවන සංවිධාන / පෞද්ගලික මධ්‍යස්ථානවල සේවාලාභින්ගේ පසු රැකවරණ කටයුතු ඔවුන්ගේ කාර්ය මණ්ඩල මඟින් සිදු කරනු ලබයි.

කන්දකාඩු මත් ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය හා බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් රැඳවියන්ගේ පසු ඇගයීම් කටයුතු සිදු කරනු ලබයි.

(ඇ) අදාළ නොවේ.

## ස්ත්‍රී දූෂණ, ලිංගික අපයෝජන හා ළමා අපචාර: පැමිණිලි

## வன்புணர்ச்சி, பாலியல் துஷ்பிரயோகம் மற்றும் சிறுவர் துஷ்பிரயோகம்: முறைப்பாடுகள்

## RAPE, SEXUAL AND CHILD ABUSE: COMPLAINTS

81/2020

**3. ගරු චමින්ද විජේසිරි මහතා (ගරු හේෂා විතානගේ මහතා වෙනුවට)**

(மாண்புமிகு சமிந்த விஜேசிறி - மாண்புமிகு ஹேஷா விதானகே சார்பாக)

(The Hon. Chaminda Wijesiri on behalf of the Hon. Hesha Withanage)

මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2012 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා පොලිසිය වෙත ලැබී ඇති ස්ත්‍රී දූෂණ, ලිංගික අපයෝජන හා ළමා අපචාර සම්බන්ධ පැමිණිලි සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පැමිණිලි අතරින් මේ වන විට පරීක්ෂණ අවසන් කළ පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மகாவலி, கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமிய அபிவிருத்தி அமைச்சர் மற்றும் உள்ளக வர்த்தக, உணவுப் பாதுகாப்பு மற்றும் பாவனையாளர் நலனோம்புகை மற்றும் பாதுகாப்பு இராஜாங்க அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2012 ஆண்டு தொடக்கம் இற்றைவரையில் இலங்கை பொலிஸாருக்கு கிடைத்துள்ள பெண்களுக்கெதிரான பாலியல் வன்முறை, பாலியல் துஷ்பிரயோகம் மற்றும் சிறுவர் துஷ்பிரயோகம் பற்றிய முறைப்பாடுகளின் எண்ணிக்கை, ஒவ்வொரு மாவட்டத்திற்கு அமைவாக வெவ்வேறாக எவ்வளவென் பதையும்;

(ii) மேற்படி முறைப்பாடுகளில் தற்சமயம் விசாரணைகள் நிறைவு பெற்றுள்ள முறைப்பாடுகளின் எண்ணிக்கை எவ்வள வென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?'

asked the Minister of Mahaweli, Agriculture, Irrigation and Rural Development and Minister of Internal Trade, Food Security and Consumer Welfare and State Minister of Defence:

(a) Will he inform this House-

(i) the number of complaints regarding rape, sexual abuse and child abuse received by Sri Lanka Police from the year 2012 up to now, separately in respect of each district; and

(ii) the number of complaints, out of those complaints, in respect of which investigations have been completed?

(b) If not, why?

**ගරු චමල් රාජපක්ෂ මහතා**

(மாண்புமிகு சமல் ராஜபக்ஷ)

(The Hon. Chamal Rajapaksa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) 2012 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා පොලිසිය වෙත ලැබී ඇති ස්ත්‍රී දූෂණ, ලිංගික අපයෝජන හා ළමා අපචාර සම්බන්ධ පැමිණිලි සංඛ්‍යාව පොලිස් කොට්ඨාස මට්ටමින් සකස් කර ඇමුණුම* වශයෙන් ඉදිරිපත් කරමි.

(ii)

| වර්ෂය | ස්ත්‍රී දූෂණ | බරපතළ ලිංගික අපයෝජන | ළමා අපචාර |
|---|---|---|---|
| 2012 | 1,728 | 674 | 863 |
| 2013 | 1,637 | 692 | 735 |
| 2014 | 1,565 | 624 | 772 |
| 2015 | 1,557 | 661 | 830 |
| 2016 | 1,565 | 562 | 800 |
| 2017 | 1,304 | 508 | 661 |
| 2018 | 1,284 | 520 | 755 |
| 2019 | 1,280 | 544 | 601 |
| 2020.01.15 දක්වා | 78 | 21 | 34 |

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු විමල් රාජපක්ෂ මහතා]

අදාළ සියලු තොරතුරු පොලිස් කොට්ඨාස මට්ටමින් ඇමුණුම යටතේ සවිස්තරව ඉදිරිපත් කරමි.

(ආ) පැන නොනඟී.

## ඖෂධ සඳහා කංසා භාවිතය: විස්තර
ஔடதங்களுக்கான கஞ்சா பாவனை: விபரம்
USE OF CANNABIS FOR DRUGS: DETAILS

14/2020

**6. ගරු චමින්ද විජේසිරි මහතා (ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)**
(மாண்புமிகு சமிந்த விஜேசிறி - மாண்புமிகு புத்திக பதிரண சார்பாக)
(The Hon. Chaminda Wijesiri on behalf of the Hon. Buddhika Pathirana)

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා වර්ෂයකට අවශ්‍ය කංසා ප්‍රමාණය ඇස්තමේන්තුගත කර තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ආයුර්වේද ඖෂධ සඳහා අවශ්‍ය කංසා වගා කරන්නේද;

(ii) එසේ නම්, දැනට කංසා වගා කර ඇති අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) එම වගා කටයුතු අධීක්ෂණය කරනු ලබන ආයතනය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අත්අඩංගුවට පත්වන කංසා ආයුර්වේද ඖෂධ සඳහා යොදා ගන්නේද;

(ii) එසේ නම්, 2017 වර්ෂයේදී අත්අඩංගුවට ගත් කංසාවලින් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා යොදාගත් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் சுதேச வைத்திய சேவைகள் அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) இலங்கையில் ஆயுள்வேத ஔடத உற்பத்திக்காக ஆண்டொன்றுக்கு தேவையான கஞ்சாவின் அளவு மதிப்பிடப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அதன் அளவு யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) ஆயுள்வேத ஔடதங்களுக்கு தேவையான கஞ்சா செய்கைபண்ணப்படுகின்றதா என்பதையும்;

(ii) ஆமெனின், தற்சமயம் கஞ்சா செய்கைபண்ணப்பட்டுள்ள ஏக்கரளவு யாது என்பதையும்:

(iii) இப்பயிர்ச்செய்கையை கண்காணிக்கும் நிறுவனம் யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) (i) கைப்பற்றப்படுகின்ற கஞ்சா ஆயுள்வேத ஔடதங்களுக்காக பயன்படுத்தப் படுகின்றதா என்பதையும்;

(ii) ஆமெனின், 2017 ஆண்டில் கைப்பற்றப்பட்ட கஞ்சாவில் ஆயுள்வேத ஔடத உற்பத்திக்கு எவ்வளவு பயன்படுத்தப்பட்டதென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Healthcare and Indigenous Medical Services:

(a) Will she inform this House-

(i) whether the annual requirement of cannabis for ayurvedic drugs production within Sri Lanka has been estimated; and

(ii) if so, what that amount is?

(b) Will she also inform this House-

(i) whether cannabis required for ayurvedic drugs is cultivated;

(ii) if so, the acreage currently under cannabis cultivation; and

(iii) the institution that supervises those cultivations?

(c) Will she state-

(i) whether cannabis seized in raids is used for ayurvedic drugs; and

(ii) if so, the amount used for ayurvedic drug production out of the cannabis seized in raids in 2017?

(d) If not, why?

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூகப் பாதுகாப்பு அமைச்சரும் சுகாதாரம் மற்றும் சுதேச வைத்தியச் சேவைகள் அமைச்சரும்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Women and Child Affairs and Social Security and Minister of Healthcare and Indigenous Medical Services)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත.

(ii) අදාළ නැත.

(ආ) (i) නැත.

(ii) අදාළ නැත.

(iii) අදාළ නැත.

(ඇ) (i) ඔව්.

(ii) කිලෝග්‍රෑම් 72, ග්‍රෑම් 720කි.

(ඈ) අදාළ නැත.

## 1978 සිට මේ දක්වා පත් වූ අමාත්‍යවරු: කාන්තා නියෝජනය

### 1978 இலிருந்து இற்றைவரை நியமிக்கப்பட்ட அமைச்சர்கள்: பெண்களின் பிரதிநிதித்துவம்

### MINISTERS APPOINTED FROM 1978 TO DATE: WOMEN'S REPRESENTATION

82/2020

**8. ගරු චමින්ද විජේසිරි මහතා (ගරු හේෂා විතානගේ මහතා වෙනුවට)**

(மாண்புமிகு சமிந்த விஜேசிறி - மாண்புமிகு ஹேசா விதானகே சார்பாக)

(The Hon. Chaminda Wijesiri on behalf of the Hon. Hesha Withanage)

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 1978 වර්ෂයෙන් ඇරඹී පළමුවන පාර්ලිමේන්තුවේ සිට අටවැනි පාර්ලිමේන්තුව දක්වා එක් එක් පාර්ලිමේන්තුවට අදාළව ඇති කරන ලද අමාත්‍ය මණ්ඩලවල සිටි කැබිනට්, රාජ්‍ය සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් අමාත්‍ය මණ්ඩලයේ සිටි අමාත්‍යවරියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් අමාත්‍ය මණ්ඩලයේ සිටි අමාත්‍යවරියන් සංඛ්‍යාව අදාළ අමාත්‍ය මණ්ඩලයේ සිටි මුළු අමාත්‍ය ධුර සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) රටේ වර්තමාන කාන්තා ජනගහනයේ ප්‍රතිශතයට සරිලන සාධාරණ නියෝජනයක් අමාත්‍ය මණ්ඩල තුළ කාන්තාවන්ට ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சர் மற்றும் நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சர், புத்தசாசன, கலாசார மற்றும் சமய அலுவல்கள் அமைச்சர் மற்றும் நகர அபிவிருத்தி, நீர் வழங்கல் மற்றும் வீடமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) 1978 ஆம் ஆண்டுடன் ஆரம்பமான முதலாவது பாராளுமன்றத்திலிருந்து எட்டாவது பாராளுமன்றம் வரை ஒவ்வொரு பாராளுமன்றம் தொடர்பிலும் ஏற்படுத்தப்பட்ட அமைச்சரவைகளில் இருந்த அமைச்சரவை, இராஜாங்க மற்றும் பிரதி அமைச்சர்களின் எண்ணிக்கை தனித்தனியே யாது என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு அமைச்சரவையிலும் இருந்த பெண் அமைச்சர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) ஒவ்வொரு அமைச்சரவையிலும் இருந்த பெண் அமைச்சர்களின் எண்ணிக்கையானது, குறித்த அமைச்சரவையில் இருந்த மொத்த அமைச்சர்களின் எண்ணிக்கையின் நூற்றுவீதமாக எவ்வளவு என்பதையும்;

(iv) நாட்டின் தற்போதைய பெண்கள் சனத்தொகையின் சதவீதத்திற்கு ஏற்றவாறு நியாயமான பிரதிநிதித்துவம் அமைச்சரவையில் பெண்களுக்குக் கிடைத்துள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Finance, Economy and Policy Development, Minister of Buddhasasana, Cultural and Religious Affairs and Minister of Urban Development, Water Supply and Housing Facilities:

(a) Will he inform this House-

(i) the number of Cabinet, State and Deputy Ministerial positions in the Cabinets created during each Parliament starting from the First Parliament in 1978 to Eighth Parliament, separately;

(ii) the number of female Ministers in each Cabinet;

(iii) the number of female Ministers as a percentage of the total number of ministerial portfolios in each Cabinet; and

(iv) whether women have received a fair representation in the Cabinet proportionate to the present women population in the country?

(b) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**

(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)

(The Hon. Johnston Fernando)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | පාර්ලිමේන්තුව | කැබිනට් | කැබිනට් නොවන | රාජ්‍ය | නියෝජ්‍ය |
|---|---|---|---|---|---|
| 1978 | 01 | 25 | - | - | - |
| 1989 | 02 | 21 | - | - | - |
| 1994 | 03 | 23 | - | - | 31 |
| 2000 | 04 | 42 | - | - | 36 |
| 2001 | 05 | 25 | 27 | - | 08 |
| 2004 | 06 | 31 | 03 | - | 31 |
| 2010 | 07 | 37 | - | - | 39 |
| 2015 | 08 | 45 | - | 19 | 23 |

(ii)

| වර්ෂය | පාර්ලිමේන්තුව | කැබිනට් | රාජ්‍ය | නියෝජ්‍ය |
|---|---|---|---|---|
| 1978 | 01 | 01 | - | - |
| 1989 | 02 | 01 | - | - |
| 1994 | 03 | 03 | - | 05 |
| 2000 | 04 | 04 | - | - |
| 2001 | 05 | 01 | - | - |
| 2004 | 06 | 03 | - | - |
| 2010 | 07 | 02 | - | 01 |
| 2015 | 08 | 02 | 02 | 02 |

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

(iii)

| වර්ෂය | පාර්ලිමේන්තුව | ප්‍රතිශතය |
|---|---|---|
| 1978 | 01 | 4% |
| 1989 | 02 | 4.76% |
| 1994 | 03 | 14.81% |
| 2000 | 04 | 5.12% |
| 2001 | 05 | 1.6% |
| 2004 | 06 | 4.61% |
| 2010 | 07 | 3.94% |
| 2015 | 08 | 6.89% |

(iv) අමාත්‍ය මණ්ඩලයේ කාන්තා නියෝජනය පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජන මට්ටම සමඟ සෘජු සබඳතාවක් පවතී. අමාත්‍ය මණ්ඩලයේ කාන්තා නියෝජනය ඒ අනුව විචලනය වේ.

(ආ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අමාත්‍යාංශ නිවේදන.

කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍ය, ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය.

## ආබාධිත පුද්ගලයන් වෙනුවෙන් විධිමත් වැඩ පිළිවෙළක් : කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමියගේ ප්‍රකාශය
## ஊனமுற்றோருக்கான முறைமைசார் வேலைத்திட்டம்: மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூகப் பாதுகாப்பு அமைச்சரும் சுகாதாரம் மற்றும் சுதேச வைத்தியச் சேவைகள் அமைச்சருமானவரினது கூற்று
## FORMAL PROGRAMME FOR THE DISABLED: STATEMENT BY MINISTER OF WOMEN AND CHILD AFFAIRS AND SOCIAL SECURITY AND MINISTER OF HEALTHCARE AND INDIGENOUS MEDICAL SERVICES

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூகப் பாதுகாப்பு அமைச்சரும் சுகாதாரம் மற்றும் சுதேச வைத்தியச் சேவைகள் அமைச்சரும்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Women and Child Affairs and Social Security and Minister of Healthcare and Indigenous Medical Services)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2020.02.06 වන දින ගරු සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27.(2) යටතේ ආබාධිත ප්‍රජාව සම්බන්ධයෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. 2003 වසරේදී අමාත්‍ය මණ්ඩලය මඟින් අනුමත කරන ලද ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ 2014 වසරේදී අමාත්‍ය මණ්ඩලය මඟින් අනුමත කරන ලදුව සමාජ සේවා අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඒකාබද්ධව එළිදක්වන ලද ආබාධිත බව පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීම සඳහා 2020 වර්ෂයේදී කටයුතු කිරීමට මේ වනවිටත් සැලසුම් කර ඇත. එසේම ආබාධ සහිත තැනැත්තන්ගේ සුබසිද්ධිය උදෙසා පූර්වගාමී සැලැස්මේ යෝජිත ඒකාබද්ධ ප්‍රවේශයකින් අදාළ පාර්ශ්වකරුවන් හරහා ක්‍රියාත්මක කරමින් පවතී.

ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් ක්‍රියාත්මක වන්නා වූ ආයතනයක් වශයෙන් කාන්තා, ළමා සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය හා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව මඟින් උක්ත ජාතික ක්‍රියාකාරී සැලැස්ම මඟින් ඒ ඒ පාර්ශ්වකරුවන් වෙත පැවරී ඇති කටයුතුවල සාරාංශයක් ද සහිතව ක්‍රියාකාරී සැලැස්මෙහි පිටපත් එකී පාර්ශ්වකරුවන් වෙත ලබා දී ඇත. එම පාර්ශ්වකරුවන් නියෝජනය කරන අමාත්‍යාංශවල අතිරේක ලේකම් ධුරයට නොඅඩු ධුරයක් උසුලන්නා වූ නම් කරන ලද නිලධාරියකු පත් කර ඇති අතර, එම නිලධාරියා මඟින් ඔවුන්ගේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා කටයුතු කෙරේ.

2. 2016 වසරේදී අපරානුමත කරන ලද ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ නිල සිංහල පරිවර්තනයක් සිදු කර ඇති අතර, එහි ඉංග්‍රීසි හා දෙමළ භාෂාවෙන් ද පරිවර්තන ඇත. සංඥා සහ බ්‍රේල් වැනි විකල්ප සන්නිවේදන මාධ්‍ය ඔස්සේ නිකුත් කිරීම සඳහා මේ වනවිටත් කටයුතු කරමින් පවතී. ඒ අනුව මෙය 2020 වසරේ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇති අතර, මෙම වසර තුළ එම කටයුතු අවසන් කිරීමට කටයුතු කෙරේ.

3. නව පනත් කෙටුම්පත යටතේ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 33 වගන්තියට අනුව සියලු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඒකාබද්ධ කරමින් රජයේ නිලධාරින්ගෙන් සැදුම්ලත් සම්බන්ධීකරණ කමිටුවක් යෝජනා කර ඇත. ඒ ඒ අමාත්‍යාංශ තුළ සම්මුතියේ එන සියලු අයිතිවාසිකම් ඉටු කිරීමට, එකී අමාත්‍යාංශ තුළ කේන්ද්‍රීය ස්ථාන ස්ථාපනය කිරීමට මේ යටතේ නව පනතින් හඳුන්වා දී ඇත.

තවද, සම්මුතිය මඟින් හඳුන්වා දෙනු ලබන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනයට, ආරක්ෂා කිරීමට හා අධීක්ෂණයට ස්වාධීන යන්ත්‍රණයක් පිහිටුවීම යටතේ නියාමන කමිටුවක් පිහිටුවීමට යෝජනා කර ඇති අතර, ඒ සඳහා රජයේ නිලධාරින් මෙන්ම සිවිල් සමාජයේ විවිධ කණ්ඩායම්ද නියෝජනය කරනු ලැබේ. එමඟින් ස්වාධීන නියාමනයක් අපේක්ෂා කෙරේ.

ඉහත සියලු සංශෝධන සහිතව පනත් කෙටුම්පත 2019.10.04 දිනැතිව නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇති අතර, වරින් වර පසුවිපරම් කරනු ලැබේ.

4. ආබාධිත පුද්ගලයන්ට රැකියා සැපයීම පිළිබඳ අංක 27/88 හා 1988.08.18 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සමාජ සේවා අමාත්‍යාංශයේ ඉල්ලීම අනුව, උක්ත විධිවිධාන අනුගමනය කරන ලෙස අවධාරණය කරමින්, නැවතත් 1999.01.29 දිනැතිව අංක 01/99 යටතේ නිකුත් කරමින් පළාත් සභා ද ඇතුළු සියලු ආයතන දැනුවත් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව, අදාළ චක්‍රලේඛයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් යම් යම් ආයතන මෙකී බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

උදාහරණ වශයෙන්, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ පත්වීම් සහ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවයේ 3(III), 2(II) සහ 1(III) ශ්‍රේණි සඳහා මේ වන විටත් සියයට 3ක කෝටාව යටතේ බඳවා ගැනීම් සිදුකොට ඇත.

# කාන්තාවන් සවිබලගැන්වීම සහ සුබසාධනය: කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමියගේ ප්‍රකාශය

# பெண்களுக்கான வலுவூட்டலும் நலனோம்பலும்: மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூகப் பாதுகாப்பு அமைச்சரும் சுகாதாரம் மற்றும் சுதேச வைத்தியச் சேவைகள் அமைச்சருமானவரினது கூற்று

# EMPOWERMENT AND WELFARE OF WOMEN: STATEMENT BY MINISTER OF WOMEN AND CHILD AFFAIRS AND SOCIAL SECURITY AND MINISTER OF HEALTHCARE AND INDIGENOUS MEDICAL SERVICES

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2020.01.23 වන දින ගරු සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27. (2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. වත්මන් මුළු ජනගහනයෙන් සියයට 52ක ප්‍රමාණයක් කාන්තාවන් නියෝජනය කරන බැවින්, මෙම කාන්තාවන්ගේ මිල කළ නොහැකි උත්සාහය හඳුනාගෙන ආර්ථික බලගැන්වීමේ යන්ත්‍රණයකට දායක කර ගැනීම ඉතා වැදගත් වේ.

   ඒ අනුව, එම ප්‍රදේශයන්ට ආවේණික හා හඳුනාගත් ව්‍යාපාර සහ විශේෂයෙන් සමෘද්ධි ව්‍යාපාරය සම්බන්ධ කරගනිමින් ඔවුන්ට පුහුණු වැඩසටහන් සහ මූල්‍යමය ශක්තිය ලබා දෙමින් එම කාන්තාවන්ට අවශ්‍ය දැනුම හා මූල්‍ය දායකත්වය ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කර ඇත. දැනට ව්‍යාපාර ක්ෂේත්‍රයේ යොමු වී සිටින ව්‍යවසායකයින් මෙන්ම ව්‍යවසායකයින් ලෙස ව්‍යාපාර ක්ෂේත්‍රයට යොමු වීමට අපේක්ෂිත කාන්තාවන්ට මෙමඟින් අත්වැලක් සැපයේ.

   ඒ වාගේම, කාන්තාවන් තාක්ෂණික වශයෙන් බලගැන්වීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ඒකාබද්ධව කාන්තාවන්ට ලබාදෙමින් ඔවුන්ගේ ශිල්පීය හා නිපුණතා සංවර්ධනයට දායකත්වය ලබාදෙනු ලැබේ. මේ සඳහා කාර්මික සංවර්ධන පුහුණු ආයතනය, විද්‍යා ආයතනය, ශිල්ප සභාව සහ අපනයන සංවර්ධන මණ්ඩලය වැනි ආයතනවල තාක්ෂණික දැනුම ලබාගැනීමට කටයුතු කරන අතර, සමෘද්ධි බැංකු සතු රුපියල් බිලියන 120ක පමණ ඉතිරි කිරීම් ඒ ව්‍යාපාරයට සම්බන්ධ කාන්තාවන්ගේ ආර්ථික ශක්තිය නඟාසිටුවීම සඳහා ලබා දීමට බලාපොරොත්තු වේ.

2. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය විසින් ග්‍රාමීය කාන්තාවන් සේවා නියුක්තියෙන් අඩු කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

3. 1979 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වාදුන් කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ ප්‍රඥප්තියෙහි - CEDAW- අවසාන තීරණවලට අදාළව දේපළ සඳහා අයිතිවාසිකම් කීමට කාන්තාවන්ට ඇති නීතිමය බාධා ඉවත් කර අදාළ නීති සංශෝධනය කිරීම සිදු කොට ඇත. ඒ අනුව ඉඩම් හා ඉඩම් සංවර්ධන ආඥා පනත අදාළ පරිදි සංශෝධන කිරීමට 2017 හා 2018 වර්ෂවල ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම් සමඟ සාකච්ඡා පවත්වා දැනුම් දී ඇති අතර, අදාළ සංශෝධන සිදු වූ පසු කාන්තාවන්ට ණය පහසුකම් ලබා ගැනීමට පවතින බාධා මඟ හැරෙනු ඇත.

   අඩු ආදායම්ලාභී කාන්තාවන්ට අවශ්‍ය නීතිමය සහාය නීති ආධාර කොමිෂන් සභාව යටතේ දැනටමත් ලබා දෙනු ලැබේ.

4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 4/2005 විධිවිධාන අනුව සෑම සජීවී දරු උපතක් සඳහාම වැඩ කරන දින 84ක සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ද,ඉන් අනතුරුව, අඩවැටුප් සහිත දින 84ක නිවාඩු ද, අවශ්‍ය වන්නේ නම් වැටුප් රහිත දින 84ක නිවාඩු ද ලබා ගැනීම සඳහා අවස්ථාව පවතී.

   එසේම අභ්‍යාසලාභී උපාධිධාරින් සඳහා ද දින 84ක් නිවාඩු ද අවශ්‍ය වන්නේ නම්, වැටුප් සහිත නිවාඩු සහ විශේෂ හේතු මත මාස 03ක කාලයක් සඳහා ද වැටුප් රහිත ප්‍රසූත නිවාඩු ලබා ගැනීමේ හැකියාව පවතී.

   රාජ්‍ය නිලධාරිනියන් හට වැටුප් සහිත මාස 04ක ප්‍රසූති නිවාඩු කාල සීමාව මාස 06ක කාල සීමාවක් දක්වා දීර්ඝ කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යයනය කරමින් පවතී.

   ආදායම් තත්ත්වය නොසලකා සියලු ගැබිනි මව්වරුන් සඳහා පෝෂණ මල්ල වැඩසටහන 2020 වසරේදී ද ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත ලැබී ඇති අතර, දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන හා උපදෙස් ලබා දී ඇත. බොහෝ දිස්ත්‍රික්කවල මූලික පරිපාලන කටයුතු සිදු කර වෙළෙඳ ආයතන ලියා පදිංචි කර, මව්වරුන් වෙත වවුචර්පත් නිකුත් කිරීම ආරම්භ කර ඇත.

5. ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 52%ක් කාන්තාවන් වන අතර, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංගණනයන්ට අනුව මුළු පවුල් සංඛ්‍යාවෙන් 24.3%ක් කාන්තා ගෘහ මූලික පවුල් වේ. මෙම අමාත්‍යාංශයේ විෂය පථයේ ප්‍රමුඛතම අංශය වන කාන්තාවන් සමාජ හා ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ ක්‍රියාවලියේ දී මෙම කාන්තා ගෘහ මූලික පවුල් කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කර ඇත. ඒ අනුව කාන්තා ගෘහ මූලික පවුල් සඳහා 2019-2021 යන වසර තුන වෙනුවෙන් තුන් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් කෙටුම්පත් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

   එම සැලැස්ම පහත අංශ යටතේ සකස් කර ඇත.

   1. සෞඛ්‍ය හා මනෝ සමාජීය සහායක සේවා
   2. ජීවනෝපාය හා ආහාර සුරක්ෂිතතාවය
   3. සහාය සේවා
   4. පුද්ගලික ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණ ක්‍රියාත්මක කිරීම
   5. දැනුවත් කිරීම
   6. 2018 වර්ෂයේදී ජාතික කාන්තා කමිටුව විසින් කාන්තාවන් වැඩි වශයෙන් දේශපාලනයට සහභාගි කරවා ගැනීමේ අරමුණින් මැතිවරණ ක්‍රියාකාරී කණ්ඩායම්, කාන්තා දේශපාලනයට සහභාගිත්වය පුළුල් කිරීම සඳහා කටයුතු කරන පාර්ශ්ව, එනම් රාජ්‍ය ආයතන රාජ්‍ය නොවන ආයතන සහ ආධාර දෙන ආයතනවල සහභාගිත්වයෙන් පහත කරුණු සාකච්ඡා කරන ලදී.

[ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය]

පළාත් සභා මැතිවරණයේදී කාන්තා නාම යෝජනා ලබා දීම.
පාර්ලිමේන්තු මැතිවරණ සඳහා කාන්තා නාම යෝජනා ලබා දීම.

පළාත් පාලන ආයතනවලට තේරී පත් වූ කාන්තාවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. ඊට අමතරව 2019 වර්ෂයේදී කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව ආංශික අධීක්ෂණ කමිටුවේ දී ද 30%ක කාන්තා නියෝජනයක් ලබා ගැනීම සඳහා, "කාන්තා පාර්ලිමේන්තු කෝටාව" ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද අතර, එයට අදාළ නිර්දේශ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික කමිටු සාමාජිකයන් විසින් ඉදිරියේ දී ලබා දීමට එකඟ විය.

## එයාර්බස් ගනුදෙනුවේ අක්‍රමිකතා: කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## எயார்பஸ் கொடுக்கல்வாங்கல் முறைகேடுகள்: கைத்தொழில் ஏற்றுமதி மற்றும் முதலீட்டு மேம்பாடு அமைச்சரும் சுற்றுலா மற்றும் விமானச் சேவைகள் அமைச்சருமானவரினது கூற்று
## IRREGULARITIES IN AIRBUS DEAL: STATEMENT BY MINISTER OF INDUSTRIAL EXPORT AND INVESTMENT PROMOTION AND MINISTER OF TOURISM AND CIVIL AVIATION

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - கைத்தொழில் ஏற்றுமதி மற்றும் முதலீட்டு மேம்பாடு அமைச்சரும் சுற்றுலா மற்றும் விமானச் சேவைகள் அமைச்சரும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Industrial Export and Investment Promotion and Minister of Tourism and Civil Aviation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ 2020.02.06 වැනි දින ගරු අනුර දිසානායක මැතිතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේය:

1. නිශාන්ත වික්‍රමසිංහ මහතා - සභාපති (2012 සහ 2013)
2. 2012 අධ්‍යක්ෂ මණ්ඩලය,
   i. නිශාන්ත වික්‍රමසිංහ මහතා - සභාපති
   ii. නිහාල් ජයමාන්න මහතා - අධ්‍යක්ෂ
   iii. කපිල චන්ද්‍රසේන මහතා - අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි (2008.12.31 වෙනි දින අධ්‍යක්ෂ ලෙස පත් කර ඇති අතර ප්‍රධාන විධායක නිලධාරි ලෙස 2011.08.01 දින පත් කර ඇත.)
   iv. ශමීන්ද්‍ර රාජපක්ෂ මහතා - අධ්‍යක්ෂ
   v. මහීලාල් ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂ
   vi. ලක්ෂ්මි සන්ගක්කාර මිය - අධ්‍යක්ෂ
   vii. සනත් උක්වත්ත මහතා - අධ්‍යක්ෂ
   viii. සුසන්ත රත්නායක මහතා - අධ්‍යක්ෂ
   ix. නාලිනී වේරගොඩ මිය - අධ්‍යක්ෂ (එතුමිය 2012.07.04 වෙනි දින ඉල්ලා අස්වී ඇත.)

   2013 අධ්‍යක්ෂ මණ්ඩලය
   i. නිශාන්ත වික්‍රමසිංහ මහතා - සභාපති
   ii. නිහාල් ජයමාන්න මහතා - අධ්‍යක්ෂ
   iii. කපිල චන්ද්‍රසේන මහතා - අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි (2008.12.31 වෙනි දින අධ්‍යක්ෂ ලෙස පත් කර ඇති අතර ප්‍රධාන විධායක නිලධාරි ලෙස 2011.08.01 දින පත් කර ඇත.)
   iv. ශමීන්ද්‍ර රාජපක්ෂ මහතා - අධ්‍යක්ෂ
   v. මහීලාල් ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂ
   vi. ලක්ෂ්මි සන්ගක්කාර මිය - අධ්‍යක්ෂ
   vii. සනත් උක්වත්ත මහතා - අධ්‍යක්ෂ
   viii. සුසන්ත රත්නායක මහතා - අධ්‍යක්ෂ
3. කපිල චන්ද්‍රසේන මහතා - අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි (2008.12.31 වෙනි දින අධ්‍යක්ෂ ලෙස පත් කර ඇති අතර ප්‍රධාන විධායක නිලධාරි ලෙස 2011.08.01 දින පත් කර ඇත.)
4. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සපයන ලද තොරතුරු මත පදනම්ව හිටපු අධ්‍යක්ෂ සහ ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි කපිල චන්ද්‍රසේන සහ ඔහුගේ බිරිඳ අත් අඩංගුවට ගෙන මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලෙස නීතිපතිවරයා පොලීසියට උපදෙස් දී තිබේ. කපිල චන්ද්‍රසේන සහ ඔහුගේ බිරිඳ මේ වන විටත් අත්අඩංගුවට ගෙන ඇති බව වාර්තා වේ. අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශනය සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත තොරතුරු ඉදිරිපත් කරන ලෙසට ශ්‍රී ලංකා පොලීසිය වෙත නීතිපතිවරයා උපදෙස් ලබා දී ඇත.

අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා ශ්‍රීලන්කන් ගුවන් සේවය කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. එක්සත් රාජධානියේ ක්‍රවුන් අධිකරණ තීන්දුවට අදාළ නිල ලේඛන එක්සත් රාජධානියේ බරපතළ වංචා කාර්යාලය විසින් ප්‍රසිද්ධියට පත් කර ඇත. නීති උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව වග කිවයුතු පාර්ශ්වයන්ගෙන් වන්දි ලබා ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් සමාගම අපේක්ෂා කරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය යහ පාලන රජය කාලයේ හිටපු ජනාධිපතිවරයා විසින් ශ්‍රීලන්කන් ගුවන් සමාගම පිළිබඳව විමර්ශනය කරන්න කොමිසමක් පත් කළා. ඒ කොමිසමට ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ නිලධාරින් යම් යම් කාරණා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සම්බන්ධව එදා පරීක්ෂණයක් කරලා තිබෙනවා; නීතිපතිට යොමු කරලා තිබෙනවා. නමුත්, ක්‍රියා මාර්ගයක් අරගෙන නැහැ. හිටපු යහ පාලන ආණ්ඩුවේ සමහර මැති ඇමතිවරුන් මේකෙන් වාසි අරගෙන මේක යට ගැහුවා කියලා නොයෙකුත් චෝදනා තිබෙනවා. හැබැයි මේ සිද්ධිය එළියට ආපු වෙලාවේම අතිගරු ජනාධිපතිතුමා නීතිපතිතුමා දැනුවත් කරලා වහාම විමර්ශනයක් පවත්වා අවශ්‍ය කටයුතු කරන්න උපදෙස් දී තිබෙනවා. ඒ වාගේම, ශ්‍රීලන්කන් ගුවන් සමාගම මේ පිළිබඳව නීත්‍යනුකූලව පැමිණිල්ලක් ඉදිරිපත් කරලා තිබෙනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට. ඒ සිද්ධියට අදාළ අය මේ වන කොටත් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි ඉදිරියේදී කටයුතු කරාවි. මේ

පිළිබඳ අපේ කිසිම මැදිහත් වීමක් නැහැ. රජය බලපෑම් කරන්නේ නැහැ. පසුගිය රජය කාලයේ කොහොමද බලපෑම් කළේ කියලා රන්ජන් රාමනායක මහත්මයාගේ කථා අහනකොට අපි දැක්කා. අරලියගහ මන්දිරයේ කාමර ඇතුළේ ඉඳගෙන තමයි එදා නඩු දමන්න සාකච්ඡා කරලා තිබෙන්නේ. අපි එහෙම මොකුත් කරන්නේ නැහැ. සාධාරණ පරීක්ෂණයක් කරලා වැරදිකරුවන්ට දඬුවම් ලබා දීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මා දන්නා තරමින් මේ ප්‍රශ්නය මුලින් මතු කළේ, ගරු අනුර දිසානායක මැතිතුමායි. එය නිවැරදි ද? ඒ කාරණය පිළිබඳ තවත් අතුරු ප්‍රශ්නයක් අහනවා නම්, ඒ සඳහා ඒ මන්ත්‍රීවරයාට හැර වෙනත් මන්ත්‍රීවරයකුට ඉඩ දෙන්න මට බැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක මගේ ප්‍රශ්නයට පිළිතුර තමයි. ඒ බව පසුවයි තේරුම් ගත්තේ. මොකද, කිච්චේ අමාත්‍යාංශ නිවේදන කියලායි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට එක කාරණයක් නිවැරදි කරන්න ඉඩ දෙන්න.

මේ ගැන පළමුවැනි වාර්තාව ආවේ 2017 වසරේ. 2016 වසරේ තමයි UK Export Finance එක විශේෂයෙන්ම ලංකාවට දෙන්න ගිය සමහර මුදල් ගැන දැනගෙන තිබෙන්නේ. එයාර්බස් සමාගමේ එවකට සිටි ප්‍රධාන විධායක නිලධාරි එන්ඩර්ස් මේ ටික දුන්නා. නමුත් අපි ළඟ කරුණු තිබුණේ නැහැ. ඒත් CID එකේ තිබුණා. ඊට පසුව මේ කරුණු කොමිසමට එව්වේ Transparency International Sri Lanka එකයි. ඒ කරුණුමයි. මේ කරුණු ගැන ඇමතිතුමිය කියයි. අපි ඒ රටවල්වලිනුයි, සිංගප්පූරුවෙනුයි කරුණු ඉල්ලුවා. අන්තිමට සමාගමේ නම තිබුණා. අයිති කාටද කියලා තිබුණේ නැහැ.

මේ කරුණු ඔක්කොම නොවැම්බර් 07වැනි දින ලංකා ආණ්ඩුවට ලැබුණා. එතැන ඉඳන් ගත් ක්‍රියා මාර්ග මොනවාද කියලා අපි දන්නේ නැහැ. ඔබතුමාට ඒක කියන්න පුළුවන් නම් කියන්න, ගරු ඇමතිතුමනි. ඒක හොඳයි. මෙතැන අප සලකා බැලිය යුතු කාරණා දෙකක් තිබෙනවා. එකක් තමයි, Serious Fraud Office එකෙන් ඒ අය ලබා ගත් සියලු තොරතුරු අපි ලබා ගන්න ඕනෑ. Serious Fraud Office එක UK Export Finance එකෙන් සම්පූර්ණ තොරතුරු ලබා ගෙන තිබෙනවා. දෙවනුව, අපට බලන්න තිබෙන්නේ අපි අනාගතයේදී airbus ගන්නවාද කියලායි. විශේෂයෙන් අල්ලස් චෝදනාවක් ඔප්පු වෙලා තිබෙනවා නම්, ඒක පිළිගන්න වෙනවා නම් අපට අනාගතයේ airbus ගන්න බැරි වෙනවා. මේ ගත් airbus වෙනුවෙන් අපි වන්දියක් ඉල්ලනවාද කියලා බලන්න ඕනෑ. එංගලන්තය බිලියන ගණන් වන්දි ගත්තේ, අපි වෙනුවෙන්. අපිත් දැන් අපේ කොටස ගන්න ඕනෑ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මෙතැනින් එහාට ඒ ගැන කථා කරන්න අවස්ථාව දෙන්න බැහැ. බොහොම කනගාටුයි.

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම් දීම. Item No. 1.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එච්චර සැර වෙන්න එපා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මෙක ස්ථාවර නියෝග 27(2) යටතේ මතු කළ ප්‍රශ්නයක්. එම නිසා ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න අහන්න ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
What I am going to raise is not regarding that, Sir. I just want to make a point.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
SriLankan Airlines සමාගම සම්බන්ධයෙන්, වැලිඅමුණ මැතිතුමාගේ Report එකට පස්සේ Report එකක් පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා. එය table කරලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එය table කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. "දවස් පනස් ගණනේ" ආණ්ඩුව කාලය තුළ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට එය ලැබුණා. හැබැයි, එය පාර්ලිමේන්තුවට ලැබුණත් table කරලා නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ගැන ගරු කථානායකතුමා දැනුවත් කරන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කාරණයක් අහන්න අවස්ථාවක් ලබාදෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මේ කාරණය සම්බන්ධයෙන් ප්‍රශ්න අහන්න මට ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි. මොකද, මේක ස්ථාවර නියෝග 27(2) යටතේ මතු කළ කාරණයක්. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ සම්බන්ධයෙන් මා ප්‍රකාශයක් කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මට ඒකට ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (විදේශ සබඳතා අමාත්‍ය, නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - வெளிநாட்டு உறவுகள் அமைச்சரும் திறன்கள் அபிவிருத்தி, தொழில்துறை மற்றும் தொழில் உறவுகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Foreign Relations, Minister of Skills Development, Employment and Labour Relations and Leader of the House of Parliament)
ගරු මන්ත්‍රීතුමා, එය පසුව -භවසට- ඉදිරිපත් කරන්න.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත
### துறைமுக,விமானநிலைய அபிவிருத்தி அறவீடு (திருத்தம்) சட்டமூலம்
### PORTS AND AIRPORTS DEVELOPMENT LEVY (AMENDMENT) BILL

"2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා විසිනි.***

***2020 පෙබරවාරි 18 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சரும் புத்தசாசன, கலாசார மற்றும் சமய அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி, நீர் வழங்கல் மற்றும் வீடமைப்பு வசதிகள் அமைச்சருமானவர் சார்பில் மாண்புமிகு தினேஷ் குணவர்தன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2020 பெப்ருவரி 18, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Dinesh Gunawardena on behalf of the Prime Minister, Minister of Finance, Economy and Policy Development, Minister of Buddhasasana, Cultural and Religious Affairs and Minister of Urban Development, Water Supply and Housing Facilities ; to be read a Second time upon Tuesday, 18th February, 2020 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කිරීම.

Order, please! ඊට පෙර ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* SPEAKER [THE HON. KARU JAYASURIYA] *took the Chair.*

## ශෝක ප්‍රකාශ: ගරු සී. නන්ද මැතිව් මහතා, ගරු (වෛද්‍ය) රංජිත් අතපත්තු මහතා, ගරු ප්‍රින්ස් කාසිනාදර් මහතා සහ ගරු එම්.එස්. තේමිස් මහතා

## அனுதாபத் தீர்மானங்கள்: மாண்புமிகு சீ. நந்தா மெத்தியூ, மாண்புமிகு (வைத்திய கலாநிதி) ரஞ்சித் அத்தபத்து, மாண்புமிகு பிரின்ஸ் காசிநாதர், மாண்புமிகு எம். எஸ். தேமிஸ்

## VOTES OF CONDOLENCE: HON. C. NANDA MATHEW, HON. (DR.) RANJITH ATAPATTU, HON. PRINCE CASINADER AND HON. M.S. THEMIS

[පූ.භා.11.34]

**ගරු මහින්ද රාජපක්ෂ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ - பிரதம அமைச்சரும் நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சரும் புத்தசாசன, கலாசார மற்றும் சமய அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி, நீர் வழங்கல் மற்றும் வீடமைப்பு வசதிகள் அமைச்சரும்)
(The Hon. Mahinda Rajapaksa - Prime Minister, Minister of Finance, Economy and Policy Development, Minister of Buddhasasana, Cultural and Religious Affairs and Minister of Urban Development, Water Supply and Housing Facilities)

ගරු කථානායකතුමනි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අභාවප්‍රාප්ත ගරු සී. නන්ද මැතිව් මහතාගේත්, අභාවප්‍රාප්ත ගරු (වෛද්‍ය) රංජිත් අතපත්තු මහතාගේත්, අභාවප්‍රාප්ත ගරු ප්‍රින්ස් කාසිනාදර් මහතාගේත්, අභාවප්‍රාප්ත ගරු එම්.එස්. තේමිස් මහතාගේත් ශෝක ප්‍රකාශ යෝජනා මා ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී නන්ද මැතිව් මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මා පළමුවෙන්ම ඉදිරිපත් කරනවා.

රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින්, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හා ගරු අමාත්‍යවරයකු වශයෙන් මේ උත්තරීතර සභාවේ බොහෝ කාලයක් කටයුතු කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නන්ද මැතිව් මහතාගේ අභාවය පිළිබඳව අපගේ ශෝකය මේ අවස්ථාවේදී පළ කරනවා. නන්ද මැතිව් මැතිතුමා පෞද්ගලිකවත් මාගේ මිත්‍රයෙක්.

හිටපු අමාත්‍ය ගරු සිරිල් මැතිව් මැතිතුමාගේ සහ ආර්. රෝස්මන්ඩ් මැතිව් මැතිනියගේ පුතණුවන් වූ කළුවා දේවගේ නන්ද මැතිව් මැතිතුමා 1940 පෙබරවාරි 02 වැනි දින කොළඹදී මෙලොව එළිය දුටුවා. එතුමා උපතින්ම බෞද්ධයෙක්. ප්‍රකට ඉඩම් හිමියෙකු වූ එතුමා වැවිලි කර්මාන්තයේ ප්‍රවීණයෙක්. එතුමා අධ්‍යාපනය ලැබුවේ ගුරුතලාව ශාන්ත තෝමස් විද්‍යාලයෙන් හා ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයෙන්.

ඉන්දිරා කුලතිලක මෙනවිය සමඟ අතිනත ගත් එතුමා නන්දිතා මැතිව් දියණිය මෙලොවට දායාද කළා. 1965 වර්ෂයේ දී එක්සත් ජාතික පක්ෂයට බැඳුණු එතුමා එම වර්ෂයේ පැවැති මහා මැතිවරණයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ආසනයෙන් තරග වැදී ජයග්‍රහණය කොට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තේරී පත් වූයේ එම පාර්ලිමේන්තුවේ ළා බාලම මන්ත්‍රීවරයා වශයෙන්. නැවත 1970 වර්ෂයේ මැතිවරණයට ඉදිරිපත් වුවද, ඉන් ජයග්‍රහණය කිරීමට අපොහොසත් වූ එතුමා 1977 වර්ෂයේ පැවැති මහා මැතිවරණයෙන් නැවතත් පාර්ලිමේන්තුවට තේරී පත් වූ අතර, එම රජයේ නාවික ගුවන් සේවා හා සංචාරක නියෝජ්‍ය අමාත්‍ය ධුරය ද, ඉන් අනතුරුව ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ධුරය ද, ඊටත් පසුව මහවැලි සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ධුරය සහ අනතුරුව දිස්ත්‍රික් අමාත්‍ය ධුරය ද දරමින් එතුමා රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවට විශාල සේවයක් ඉටු කළා. එම දිස්ත්‍රික්කයට විතරක් නොවෙයි, එතුමා රටටත් විශාල සේවයක් කළා. නැවතත් 1989 වර්ෂයේ පැවැති මහා මැතිවරණයෙන් ජයග්‍රහණය කොට එතුමා තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය ධුරය හෙබවූවා.

1994 මහ මැතිවරණයෙන් ද පාර්ලිමේන්තුවට තේරී පත් වූ එතුමා විශේෂ කාර්යයන් පිළිබඳ අමාත්‍ය ධුරය ද, පසුව නාවික හා නාවික සංවර්ධන අමාත්‍ය ධුරය ද දරමින් ශ්‍රී ලංකා ආර්ථිකය ශක්තිමත් කිරීමට කටයුතු කළා. 2003 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ඌව පළාත් ආණ්ඩුකාර ධුරය දැරූ එතුමා වසර 79ක් ආයු වළඳා විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික් ජනතාවගේ සෝ සුසුම් මැද 2019 අගෝස්තු 23 වැනි දින අභාවප්‍රාප්ත වුණා.

ගරු කථානායකතුමනි, 1965 වර්ෂයේ සිට 1970 වර්ෂය දක්වාත්, පසුව 1977 වර්ෂයේ සිට 2000 වර්ෂයේ ඔක්තෝම්බර් මාසය දක්වාත්, අවුරුදු 27කට අධික කාලයක් මෙම පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරයකු සහ ගරු අමාත්‍යවරයකු ලෙස කටයුතු කළ අභාවප්‍රාප්ත ගරු නන්ද මැතිව් මැතිතුමාට අපි නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. මේ උත්තරීතර සභාවේ සාතිශය සංවේගය එතුමාගේ දයාබර භාර්යාව සහ දියණිය ප්‍රමුඛ ඥාතීන් හා හිතවතුන් වෙත දන්වා යවන ලෙස යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, ඒ එක්කම, මේ අවස්ථාවේදී මා මතක් කරන්න ඕනෑ, එතුමාගේ අභාවය සිදු වුණාට පසුව මා ඒ පිළිබඳව ඔබතුමාට දන්වනතුරු පාර්ලිමේන්තුව දැනුවත් වෙලා තිබුණේ නැහැ කියන කාරණය. පාර්ලිමේන්තුවේ යම් මන්ත්‍රීවරයකු මිය ගිය අවස්ථාවක දී පාර්ලිමේන්තුවට එය දන්වන ක්‍රමයක්, එය පාර්ලිමේන්තුව දැන ගන්නා ක්‍රමයක් තිබෙන්න ඕනෑ කියලායි මා විශ්වාස කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අගමැතිතුමනි, සාමාන්‍ය විධියට නම් එකී දැනුම් දීම් සිදු වෙනවා. ඔබතුමා කියන පරිදි, මොකක් හෝ හේතුවක් නිසා ඒ අවස්ථාවේදී පාර්ලිමේන්තුව දැනුවත් වුණේ නැහැ. ඔබතුමා කියන කරුණ මා පිළිගන්නවා.

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)

ගරු කථානායකතුමනි, ඒ නිසා ඒ පිළිබඳව පියවරක් ගැනීමට අවශ්‍ය කටයුතු කරන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නන්ද මැතිව් මහතා මාගේ පෞද්ගලික මිත්‍රයෙක්. එතුමාත් එක්ක මාගේ පෞද්ගලික හිතවත්කමක් තිබුණා. එතුමා නොයෙක් අවස්ථාවල දී අපට මුණ ගැසුණා. හැම අවස්ථාවක දීම දේශපාලන භේදයකින් තොරව කටයුතු කරන්න එතුමා පියවර

[ගරු මහින්ද රාජපක්ෂ මහතා]

ගත්තාය කියන එකත් මම මේ අවස්ථාවේ දී මතක් කරන්න ඕනෑ. එම නිසා එතුමාගේ පවුලේ අය වෙත මගේ ශෝකය මේ අවස්ථාවේ දී පළකරනවා.

ගරු කථානායකතුමනි, හම්බන්තොට දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය රංජිත් අතපත්තු මැතිතුමාගේ අභාවය පිළිබඳවත් මේ අවස්ථාවේ දී මගේ ශෝකය පළ කරනවා.

එතුමා මුලින්ම 197 දී බෙලිඅත්ත ආසනයෙන් තරග කර එම මැතිවරණයේදී පරාජය ලැබුවත්, 1977දී පැවැති මහ මැතිවරණයට තරග කරලා ජයග්‍රහණය ලැබුවා. එතුමා හම්බන්තොට ජනතාවට විශාල සේවාවක් කරපු මන්ත්‍රීවරයෙක්. එතුමාගේ අභාවය පිළිබඳව අපේ ශෝකය මේ අවස්ථාවේ දී ගරු සභාවට මා ඉදිරිපත් කරනවා.

1933 වර්ෂයේ අප්‍රේල් මස 29 වන දින තංගල්ලේ දී ජන්මලාභය ලැබූ එතුමාගේ පියා වූයේ, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ රාජ්‍ය කටයුතු පිළිබඳ උපඅමාත්‍ය ගරු දොන් පීටර් අතපත්තු මැතිතුමායි. මව ලීලා අතපත්තු මැතිනියයි.

උපතින්ම බෞද්ධයකු වූ එතුමා කොළඹ රාජකීය විද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරා ලංකා විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට ඇතුළත්ව වෛද්‍ය උපාධිය ලබා වෛද්‍යවරයකු ලෙස ජනතා සේවයේ නියුක්ත විය. එතුමා ඩේඩා මාලනී ද සිල්වා මෙනවිය සමඟ අතිනත ගත්තේය. එම විවාහයෙන් ඩ්‍රවින්ද්‍ර ප්‍රමිත් අතපත්තු පුතණුවන් මෙලොවට දායාද කරන ලදී. ඔහුද වෛද්‍යවරයකු ලෙස සේවය කරමින්, බෙලිඅත්ත ආසනයේ එක්සත් ජාතික පක්ෂ සංවිධායකවරයකු ලෙස ද කලක් කටයුතු කළා. රංජිත් අතපත්තු මැතිතුමා 1970 වර්ෂයේ පැවැති මහ මැතිවරණයට බෙලිඅත්ත ආසනයෙන් ඉදිරිපත් වී ඉන් ජයග්‍රහණය නොලැබුවත්, 1977දී පැවැති මහ මැතිවරණයෙන් බෙලිඅත්ත ආසනයේ මන්ත්‍රීවරයා ලෙස මෙම පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට තේරී පත් වුණා. 1978 වර්ෂයේ කැබිනට් නොවන අමාත්‍ය ධුරයක් දැරූ රංජිත් අතපත්තු මැතිතුමා පසුව කොළඹ රෝහල් හා පවුල් සෞඛ්‍ය ව්‍යාපෘති ඇමතිවරයා ලෙසද, 1982 වර්ෂයේ දී සෞඛ්‍ය අමාත්‍යවරයා ලෙසද කටයුතු කරමින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා විශාල මෙහෙවරක් ඉටු කළා. 1989 වර්ෂයේ පැවැති මහ මැතිවරණය ජයගෙන නැවත පාර්ලිමේන්තුවට තේරී පත්වූ එතුමා කම්කරු හා සමාජ ක්‍රම සම්පාදන අමාත්‍යවරයා වශයෙන් කළ සේවයද අනුපමේයයි.

බෙලිඅත්ත රෝහලේ සංවර්ධිත සේවා රැසක් ඉටු කළ එතුමා කියුබා මිත්‍රත්ව සංගමයේ සභාපති ලෙසත්, ලෝක සෞඛ්‍ය සංවිධානයේ උප සභාපති ලෙසත් කටයුතු කර මහඟු සේවයක් රට ජාතිය වෙනුවෙන් ඉටු කළා. අනතුරුව 1990 ජනවාරි මස 05 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉවත් වී ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂවරයකු වශයෙන් 1995 වර්ෂය දක්වා සේවය කළා.

එතුමා 2018 ජනවාරි මස 08වැනි දින අප අතරින් සදහටම සමු ගත්තා. 1977 වර්ෂයේ සිට 1990 වර්ෂය දක්වා අවුරුදු 12කට වැඩි කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් ගරු මන්ත්‍රීවරයකු, ගරු අමාත්‍යවරයකු වශයෙන් ඉමහත් ජනතා මෙහෙවරක් ඉටු කළ රංජිත් කනිෂ්ක පරාක්‍රම අතපත්තු මැතිතුමන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ අභාවය පිළිබඳව මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමන්ගේ ආදරණීය බිරිඳ, පුතණුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙස යෝජනා කරනවා.

රංජිත් අතපත්තු මැතිතුමා අපේ මිත්‍රයෙක්. අපේ ඥාතියෙක්; හිතවතෙක්. එතුමා මුලින්ම පාර්ලිමේන්තුවට එන්න තරග වැදුණේ මාත් එක්කයි. එතුමා හැම අවස්ථාවක දීම නිහතමානීව කටයුතු කළ කෙනෙක්. එතුමා වෛද්‍යවරයකු වශයෙන් කටයුතු කරමින් විශාල සේවයක් ඒ ප්‍රදේශයට සිදු කළා. ඒ වාගේම මන්ත්‍රීවරයකු වශයෙනුත්, ඇමතිවරයකු වශයෙනුත් එතුමා එම ප්‍රදේශයට විශාල සේවයක් කළා. රංජිත් අතපත්තු මැතිතුමාගේ පියාත් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරපු කෙනෙක්. එතුමා අස්වෙලා යනකොට ජනතාව අතර මතයක් තිබුණා, එක්සත් ජාතික පක්ෂයෙන් එතුමාට සාධාරණයක් සිදු වුණාද කියන එක පිළිබඳව. මේ අවස්ථාවේ දී මා ඒකත් මතක් කර දෙමින්, එතුමාගේ පවුලේ ඥාතීන් වෙත අපගේ ශෝකය පළ කර සිටිනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට මඩකලපුව දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාව නියෝජනය කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ප්‍රින්ස් ගුනරාසා කාසිනාදර් මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාව මේ අවස්ථාවේ දී මා මෙම ගරු සභාවට ඉදිරිපත් කරනවා. 1926 වර්ෂයේ ජූලි මස 21වැනි දින වාල්ස් බ්‍රවුන් කාසිනාදර් මහතාගේ සහ එම මහත්මියගේ පුත්‍රරත්නයක් වශයෙන් මඩකලපුවේදී උපත ලද ප්‍රින්ස් ගුනරාසා කාසිනාදර් මැතිතුමාට වෙස්ලි කාසිනාදර්, බර්ට්‍රම් කාසිනාදර්, නෝබල් කාසිනාදර් සහ කිංස්ලි කාසිනාදර් ලෙසින් සහෝදරයන් සිවුදෙනෙක් සිටිනවා. ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා ඈන් කාසිනාදර් මෙනවිය සමඟ අතිනත ගත් අතර, ප්‍රේමිනී කාසිනාදර් සහ ශර්මිනී කාසිනාදර් එම දෙපළගේ දියණියන් දෙදෙනායි. එම දියණියන් දෙදෙනා ඕස්ට්‍රේලියාවේ සහ ජර්මනියේ පදිංචි වී සිටිනවා. වින්සන්ට් බාලිකා උසස් පාසලින්ද, ශාන්ත සිසිලියා බාලිකා විද්‍යාලයෙන් හා මඩකළපුවේ මෙතෝදිස්ත මධ්‍ය මහා විද්‍යාලයෙන්ද අධ්‍යාපනය හැදෑරූ එතුමා මෙතෝදිස්ත මධ්‍ය මහා විද්‍යාලයේ එවකට සිටි විදුහල්පතිතුමාගේ බලවත් ඉල්ලීම මත එම පාසලේ ගුරු හිඟය මැඬලීම සඳහා තාවකාලික ස්වේච්ඡා ගුරුවරයකු ලෙස සේවය කිරීමට ඉදිරිපත් වුණා. ඉන්පසු මහරගම රජයේ ගුරු පුහුණු පාසලෙන් පුහුණුව ලබා ගුරුවරයකු ලෙස මෙතෝදිස්ත මධ්‍ය මහා විද්‍යාලයේම කටයුතු කළා. පසුව නියෝජ්‍ය විදුහල්පති ධුරයද, ඉන්පසුව එම විද්‍යාලයේම විදුහල්පති ධුරයද දරමින් එම පාසලේ අධ්‍යාපන කටයුතු හා අනෙකුත් ක්‍රියාකාරකම් වර්ධනය කරමින් ප්‍රදේශයේ ජනප්‍රියතම පාසල බවට පත් කළා. එතුමා මඩකළපුව සිවිල් කමිටුවේ සභාපති ලෙසත්, සාම දූතයෙකු ලෙසත්, ගැලවීමේ හමුදා හටයකු ලෙසත්, මඩකළපුව පා පන්දු සම්මේලනයේ සභාපති ලෙසත් කටයුතු කර ඇති අතර, රජයේ පුහුණු ගුරු සංගමයේ මඩකළපු ශාඛාවේ සභාපති ලෙසද කටයුතු කරමින් අග්නිදිග විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ සාමාජිකයකු ලෙසද අධ්‍යාපන ක්ෂේත්‍රයට කළ සේවය ඉමහත්ය.

1986 වර්ෂයේ සේවයෙන් විශ්‍රාම ගිය එතුමා 1989 වර්ෂයේ පැවති මහ මැතිවරණයේ දී මඩකළපු දිස්ත්‍රික්කයට ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණෙන් ඉදිරිපත් වී ජය ගෙන, පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත් වුණා.

උතුරු නැඟෙනහිර යුද්ධය පැවති දුෂ්කර කාලයේ දී මඩකළපුව දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් විශාල සේවයක් කරමින් විශේෂයෙන් තරුණ තරුණියන්ගේ ජීවිත බේරා ගැනීමට කටයුතු කළ ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා 2018 දෙසැම්බර් මස 12 වැනි දින අවුරුදු 92ක් ආයු වළඳා මඩකළපුව දිස්ත්‍රික්කයේ ජනතාව ඉමහත් ශෝකයට පත් කරමින් මෙලොවින් සමුගත්තා.

1989 වර්ෂයේ සිට 1994 දක්වා අවුරුදු 5කට වැඩි කාලයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කළ ප්‍රින්ස්

ගුනරාසා කාසිනාදර් මැතිතුමාට මොක් සුව ප්‍රාර්ථනා කරමින් මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමාගේ දියණියන් දෙදෙනා ප්‍රමුඛ ඥාතීන් හා හිතවතුන් වෙත දන්වා යවන ලෙසත් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ මැද කොළඹ ආසනය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත් වූ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්.එස්. තේමිස් මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාවද මා මේ අවස්ථාවේ දී මෙම ගරු සභාවට ඉදිරිපත් කරනවා.

1931 වර්ෂයේ අප්‍රේල් මස 10 වැනි දින ගම්පහ දිස්ත්‍රික්කයේ තිහාරියේ දී උපත ලැබූ මැනුවෙල් සේවරි අප්පුගේ තේමිස් මැතිතුමාගේ පියා වූයේ එම්. නිකුලස් අප්පුහාමි මහතායි. එතුමාගේ මව වූයේ තෙන්නකෝන් හාමිනේ මහත්මියයි.

1957 වර්ෂයේ දී එතුමා එම්. සීතා ද සිල්වා මෙනවිය සමඟ අතිනත් ගත්තා. ශ්‍රීමා දර්ශනී තේමිස් දියණිය එම දෙපළගේ දියණියයි.

උපතින්ම බෞද්ධයකු වූ එතුමා වේයන්ගොඩ දඩගමුව කනිෂ්ඨ විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හදාරා පසුව වැල්ලම්පිටිය ගෞතම ශාස්ත්‍රාලයට ඇතුළත් වී වැඩිදුර අධ්‍යාපනය හැදෑරුවා. කුඩා කාලයේ සිටම පොත් පත් කියැවීමට ඉමහත් උනන්දුවක් දැක්වූ එම්.එස්. තේමිස් මැතිතුමා විවිධ පොත් පත් සහ සඟරා එක් රැස් කර පුස්තකාලයක්ද පවත්වාගෙන යමින් දැනුම බෙදා දීමට කටයුතු කළා.

තැපැල් හා විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ ටෙලිග්‍රෑම් පණිවුඩකරුවෙකු වශයෙන් සේවයට බැඳුණු එතුමා කාගේත් හොඳ හිත දිනා ගනිමින් සේවය කළ අතර, වෘත්තීය අයිතිවාසිකම් දිනා ගැනීම උදෙසා කැප වී කටයුතු කර තැපැල් වෘත්තීය සමිතියේ සභාපති ධුරයද, පසුව ප්‍රධාන ලේකම් ධුරයද හොබවන ලදී. එම්.එස්. තේමිස් මැතිතුමා, තැපැල් වෘත්තීය සමිතියේ වෘත්තීමය අයිතිවාසිකම් වෙනුවෙන් දිගින් දිගටම හඬ නඟමින්, අරගල දියත් කළා. ඉතා දක්ෂ කථිකයකු වූ එතුමා, රටේ ප්‍රබලතම වෘත්තීය සමිතිය ලෙස "තැපැල් සේවකයන්ගේ සංගමය" ඉදිරියට ගෙන ඒමට නායකත්වය දුන්නා. සඟ, වෙද, ගුරු, ගොවි කම්කරු යන පංචා මහා බලවේගයෙන් සැදුම්ලත්, ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ගරු පිලිප් ගුණවර්ධන මැතිතුමාගේ නායකත්වයෙන් යුත් විප්ලවකාරී සම සමාජ පක්ෂය ප්‍රමුඛව ගරු ඩබ්ලිව්. දහනායක මැතිතුමා, ගරු අයි.එම්.ආර්.ඒ. ඊරියගොල්ල මැතිතුමා, ගරු එල්.එච්. මෙත්තානන්ද මැතිතුමා ඇතුළු පක්ෂ නායකයන් විසින් ගොඩ නඟන ලද මහජන එක්සත් පෙරමුණේ අපේක්ෂකයකු වශයෙන් එතුමා 1956 වර්ෂයේ පැවති මහා මැතිවරණයට තරග කළේ සැබෑ කම්කරු නායකයකු වශයෙන්.

මැද කොළඹ ආසනයට මහජන එක්සත් පෙරමුණෙන් ඉදිරිපත් වූ එම්.එස්. තේමිස් මැතිතුමා එම ආසනයේ තෙවන මන්ත්‍රීවරයා ලෙස පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. සමාජවාදී අදහස් දැරූ එම්.එස්. තේමිස් මැතිතුමා "බොරළුගොඩ සිංහයා" ලෙස විරුදාවලිය ලත් පිලිප් ගුණවර්ධන මැතිතුමාගේ අදහස්වලට ගරු කරමින්, එතුමා සමඟ එක් වී එදා ආණ්ඩුවෙන් වෙන්ව මහජන එක්සත් පෙරමුණ වශයෙන් වෙනම කටයුතු කළා. හැම ජන හදකම, විශේෂයෙන්ම කම්කරු ජනතාවගේ හදවත් තුළ සදාකල් පවතින ආකාරයට මහඟු සේවයක් කළ, ගරු එම්.එස්. තේමිස් මැතිතුමා 2017 මැයි මස 05වන දින වයස අවුරුදු 86ක් ආයු වළඳා අප අතරින් සදහටම සමු ගත්තා.

ගරු කථානායකතුමනි, 1956 අප්‍රේල් මාසයේ සිට 1959 දෙසැම්බර් මස දක්වා අවුරුදු තුනකුත් මාස අටක කාලයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කළ මැනුවෙල් සේවරි අප්පුගේ තේමිස් මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමින්, මෙම උත්තරීතර සභාවේ සාතිශය සංවේගය, එතුමාගේ දියණිය ප්‍රමුඛ ඥාතීන් වෙත දන්වා යවන ලෙස මා ඉල්ලා සිටිනවා.

[පූ.භා.11.49]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**

(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Sajith Premadasa -Leader of the Opposition)

ගරු කථානායකතුමනි, දිවංගත ගරු සී. නන්ද මැතිව්, ගරු (වෛද්‍ය) රංජිත් අතපත්තු, ගරු ප්‍රින්ස් කාසිනාදර් සහ ගරු එම්.එස්. තේමිස් යන විශිෂ්ට ජනතා සේවකයන්ගේ අභාවය පිළිබඳ ශෝක යෝජනා අද මෙම උත්තරීතර සභාවට ඉදිරිපත් කර තිබෙනවා. ජනතා සේවා රැසක් ඉෂ්ට කළ එතුමන්ලා හතරදෙනාගේ නිර්මල දේශපාලන චරිත පිළිබඳව අදහස් කීපයක් ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

දිවංගත නන්ද මැතිව් මැතිතුමා, අපේ රටේ එදා දවසේ දුෂ්කරතම මැතිවරණ කොට්ඨාසයක් වූ කොලොන්න ආසනය තමයි නියෝජනය කළේ. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ මායිමේ පිහිටා තිබුණු දුෂ්කර කොලොන්න මැතිවරණ කොට්ඨාසය ශක්තිමත් සංවර්ධනයකට ලක් කරමින්, එතුමා එම ප්‍රදේශයේ ප්‍රජාවට අතිවිශිෂ්ට, ඓතිහාසික සේවාවක් ඉටු කළ ආකාරය අපට දැන් දැන් මතක් වෙනවා. එතුමා ශ්‍රේෂ්ඨ ජන නායකයකු වූ සිරිල් මැතිව් මැතිතුමාගේ පුත්‍රයෙක්. නන්ද මැතිව් මැතිතුමා, පොදු ජනතාවගේ සිතුම් පැතුම් හඳුනාගෙන, පුළුවන් හැම ආකාරයකින්ම කොලොන්න මැතිවරණ කොට්ඨාසය දියුණු කරන්න අප්‍රතිහත ධෛර්යෙන් යුතුව කටයුතු කළා.

එතුමා පිළිබඳව සෘජුවම මා තුළ මතක සටහන් දෙකක් තිබෙනවා. ඉන් එක මතක සටහනක් තමයි, කිසිම සංවර්ධනයකට ලක් නොවුණු ඇඹිලිපිටිය පුරවරය, දියුණු නගරයක් බවට පත් කිරීමට ගම්උදා වැඩ පිළිවෙළ හරහා කටයුතු කිරීම. පොදු ජනතාවගේ සුබසිද්ධිය උදෙසා, මුළුමහත් කොලොන්න මැතිවරණ කොට්ඨාසයේත්, රත්නපුර දිස්ත්‍රික්කයේත් ග්‍රාම නිලධාරි වසමක් පාසා, කුඩා ගම්මානයක් පාසා, ගම්උදා වැඩසටහනේ ඒ සංවර්ධන ක්‍රියාදාමය ක්‍රියාත්මක කිරීමට නන්ද මැතිව් මැතිතුමා අසමසම නායකත්වයක් ලබා දුන්නා. එතුමා සෑම අවස්ථාවකදීම පොදු ජනතාවට සමීප වෙලා, ඔවුන්ගේ දුක සැප විමසා බැලුවා. ඒ ජනතා ආශිර්වාදය හා අනුග්‍රහය තුළින් එතුමාට ලැබුණු සියලු තානාන්තර, බලතල පොදු ජනතාවගේ සුබසිද්ධිය උදෙසාම කැප කළ අභීත නායකයකු හැටියට අපට එතුමා හඳුන්වන්න පුළුවන්.

රණසිංහ ප්‍රේමදාස මැතිතුමාට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙන ආ අවස්ථාවේදී, නන්ද මැතිව් මැතිතුමා එතුමාගේ දකුණු අත වාගේ ඉඳගෙන ඒ දෝෂාභියෝගය පරාජය කරන්න දැවැන්ත මෙහෙයක් ඉෂ්ට කළ ආකාරය අපට අදටත් මතකයි. තමන්ගේ දේශපාලන කාලය තුළ සෑම අවස්ථාවකදීම එතුමා කටයුතු කළේ ජනතාවගේ උන්නතිය උදෙසායි. එතුමාගේ අභාවය පිළිබඳව අප සියලුදෙනාම කනගාටු වෙනවා. එතුමාගේ අභාවය වෙනුවෙන්, මේ අවස්ථාවේදී ඒ පවුලේ සියලුදෙනාට අපගේ සාතිශය සංවේගය පළ කර සිටිනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට, දිවංගත ගරු රංජිත් අතපත්තු මැතිතුමා ගැන කථා කරන්න මා බලාපොරොත්තු වෙනවා. දේශපාලන සමාජයේ නොකිලිටි -පවිත්‍ර- මහත්මා චරිතයක් හැටියට ගරු රංජිත් අතපත්තු මැතිතුමා අපට හඳුන්වන්න පුළුවන්.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මහත්මා දේශපාලනයේ ප්‍රතිමූර්තියක් හැටියට, ශිෂ්ට සම්පන්න දේශපාලන රටාවක් ක්‍රියාත්මක කරමින්, සුපිරිසිදු ජන සමාජයක් නිර්මාණය කිරීම උදෙසා එතුමා උත්තුංග ජනතා සේවාවක් ඉටු කළා. වෛද්‍ය රංජිත් අතපත්තු මැතිතුමා, දකුණු බල ප්‍රදේශයේ ගිරුවාපත්තුවෙන් බිහි වුණු අභීත ජනතා පුත්‍රයෙක්.

සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට එතුමා මුළු රටේම රෝහල් පද්ධතිය දියුණු කරන්නට කටයුතු කළා. ඒ විතරක් නොවෙයි, එතුමා රෝග ප්‍රතිකාරක වාගේම රෝග නිවාරණය පැත්තට ලොකු අවධානයක් යොමු කරලා කටයුතු කළා. විශේෂයෙන් ග්‍රාමීය සහ නාගරික මට්ටමේ සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන, පවුල් සෞඛ්‍ය නිලධාරි ක්ෂේත්‍ර කේන්ද්‍ර කරගෙන ඒ රෝග නිවාරණ වැඩ පිළිවෙළේ පුරෝගාමියා හැටියට එතුමා දැවැන්ත සේවාවක් ඉෂ්ට සිද්ධ කළා.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ආසනය මුල් කරගෙන එතුමා ලොකු සේවාවක් ඉෂ්ට කළා. එතුමාගේ ඒ සේවා කාලය තුළ විරැකියාවෙන් පෙළෙන දස දහස් ගණනකට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රැකියා ලබා දෙමින් යොවුන් පරපුරට දෙපයින් නැඟී සිටින්නට අවස්ථාව උදා කර දුන්නා. මහත්මා ගුණාංගයන් තුළ මනුෂ්‍යකමට මුල් තැන ලබා දෙමින් කටයුතු කළ එතුමාට එල්ල වුණු හැම අභියෝගයකදීම, සාමයේ හස්තය දිගු කරමින් කටයුතු කිරීම තුළ ඒ අභියෝග ජය ගන්නට අවස්ථාව ලැබුණා.

විශේෂයෙන්ම ගරු රංජිත් අතපත්තු මැතිතුමා එතුමාගේ දේශපාලන ගමන අවසන් කරලා විදේශීය රැකියාවකට යොමු වුණු අවස්ථාවේ, එතුමාගේ ඒ ඉවත් වීම එදා සියලුදෙනා දුටුවේ, පිරිසිදු දේශපාලන ගමනකට ලොකුම ආදර්ශය ලබා දුන්නු එම දැවැන්තයාගේ නික්ම යෑම රටේ දේශපාලනයට බරපතළ හානියක් හැටියටයි.

ගරු කථානායකතුමනි, ගරු රංජිත් අතපත්තු මැතිතුමාගේ අභාවය, වියෝව පිළිබඳව අපගේ සාතිශය සංවේගය එම පවුලේ සියලු දෙනාටම මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

ගරු කථානායකතුමනි, මඩකළපුව දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මැති සබයට පැමිණි ගරු ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා විටෙක ගුරුවරයකු හැටියටත්, විටෙක නියෝජ්‍ය විදුහල්පතිවරයකු හැටියටත්, තවත් විටෙක විදුහල්පතිවරයකු හැටියටත් අධ්‍යාපන ක්ෂේත්‍රය කේන්ද්‍ර කර ගනිමින් වෘත්තීමය වශයෙන් කටයුතු කළා. ඉන් පසුව 1989දී පාර්ලිමේන්තු නියෝජනය නැඟෙනහිර පළාතේ මඩකළපුව දිස්ත්‍රික්කයෙන් ලබාගෙන මඩකළපුව බල ප්‍රදේශයේ ජනතාවට ලොකු සේවාවක් කරන්නට දැඩි අධිෂ්ඨානයකින් කටයුතු කළ සමාජ සේවකයකු හැටියට අපට එතුමා හඳුන්වන්නට පුළුවන්. හැම අවස්ථාවකදීම පාර්ලිමේන්තුව සතුව තිබෙන ඒ සියලු බලතල උපයෝගී කරගෙන විශේෂයෙන්ම උපදේශක කාරක සභා ක්‍රමවේදය හරහා, මඩකළපුව දිස්ත්‍රික්කයේ දුකෙන් පෙළෙන ජනතාව සුවපත් කරන්නට එතුමා සෑම උත්සාහයක්ම ගත්තා. එතුමාගේ හදිසි වියෝව පිළිබඳව අපේ බලවත් ශෝකය සහ කනගාටුව ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමාගේ පවුලේ සෑම සියලු දෙනාටම මේ අවස්ථාවේදී පළ කර සිටිනවා.

ගරු කථානායකතුමනි, එම්.එස්. තේමිස් මැතිතුමා මගේ පියාණන් නියෝජනය කළ මැද කොළඹ මැතිවරණ කොට්ඨාසයෙන් දේශපාලන ක්ෂේත්‍රයට පිවිස දැවැන්ත පෙරළියක් කළ යුග පුරුෂයකු හැටියට අපට හඳුන්වන්නට පුළුවන්. ධන බලය, පවුල් බලය හරහා මහජන නියෝජනත්වය තීන්දු වුණු කාලවකවානුවක සාමාන්‍ය පවුලකින් බිහිවුණු පොදු ජනතාවගේ පොදු ජන හඬ වෙනුවෙන් සටන් කළ පුද්ගලයකු හැටියටත් අපට එතුමා හඳුන්වන්නට පුළුවන්. මැද කොළඹ මැතිවරණ කොට්ඨාසයේ තුන්වන මන්ත්‍රීවරයා හැටියට එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළින් සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු බලවේගය මුදුන්පත් කරගෙන මැති සබය නියෝජනය කරමින් වැඩකටයුතු කළා.

එතුමාගේ පසුබිම දිහා බැලුවාම පෙනෙනවා, එතුමා බොහොම පුංචි තැනකින් ආව පුද්ගලයකු බව. තැපැල් ක්ෂේත්‍රයේ සාමාන්‍ය රැකියාවක් කරමින් කම්කරු ප්‍රජාවගේ වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් එතුමා සටන් වැදුණා. බලපුළුවන්කාරකම් උපයෝගී කර ගනිමින් කම්කරු අයිතීන් මර්දනය කරන්නට බලවතුන් උත්සාහ දැරූ හැම අවස්ථාවකදීම ඒවාට විරුද්ධව බල අරගළ ක්‍රියාත්මක කරලා, ඒ බල අරගළ නිසාම, ඒ කම්කරු අරගළ නිසාම සිරගතවෙමින් සැබැවින්ම පොදු ජනතාව නියෝජනය කළ පුද්ගලයකු විධියට අපට එතුමා හඳුන්වන්නට පුළුවන්. ඒ අන්දමට සාමාන්‍ය ජනතාව වෙනුවෙන් දැවැන්ත කාර්යභාරයක් එම්.එස්. තේමිස් මැතිතුමා ඉෂ්ට සිද්ධ කළා.

පොත පත කියවන්නට එතුමා තුළ ලොකු උනන්දුවක් තිබුණා. පොත පත කියවීම තුළින් විශේෂයෙන්ම කම්කරු නීති රීති පිළිබඳව හොඳ අවබෝධයක් එතුමා ලබා ගත්තා. ඒ ලබා ගත්ත දැනුම හරහා ප්‍රවීණ නීතිඥවරුන්ට එරෙහිව ප්‍රබල තර්ක විතර්ක ඉදිරිපත් කරමින් කම්කරු ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂා කරමින් අභිමානවත් සේවාවක් එතුමා ඉෂ්ට කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් මැති සබයේ ගමන ආරම්භ කරලා, 1959 වෙනකොට ඒ ගිය ක්‍රමවේදය පිළිබඳව කලකිරීමට පත්වෙලා එතුමා මහජන එක්සත් පෙරමුණත් සමඟ, පිලිප් ගුණවර්ධන මැතිතුමාත් සමඟ අත්වැල් බැඳගන්නට යෙදුණා. හෘදය සාක්ෂියට එකඟව අවංක දේශපාලන ගමනක් ගිය එම්.එස්. තේමිස් චරිතය වර්තමාන දේශපාලනයේ නිරතවී සිටින සෑම සියලුදෙනාටම වැදගත් ආදර්ශයක් ලෙස මම දකිනවා.

එතුමාගේ වියෝව, අභාවය නිසා දුකට පත් වී සිටින පවුලේ සියලුදෙනා වෙත අපගේ බලවත් ශෝකය, සාතිශය සංවේගය පුද කරනවා.

සී. නන්ද මැතිව් මැතිතුමා, රංජිත් අතපත්තු මැතිතුමා සහ ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමාගේ වියෝව පිළිබඳවත් මේ සභාවේ අප සියලුදෙනාගේම කනගාටුව ඒ පවුල්වලට සම්බන්ධ සෑම සියලුදෙනා වෙත පළ කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

[පූ.භා.12.05]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
**(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)**
**(The Hon. Ranil Wickremesinghe)**

ගරු කථානායකතුමනි, පරණ මිත්‍රයන් දෙන්නෙක් ගැන අද මට කථා කරනන්ට සිදු වෙනවා. නන්ද මැතිව් මැතිතුමා මම දැනගත්තේ එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට ඉඳලා පරාජය වුණු අවස්ථාවේදීයි. ඇත්ත වශයෙන්ම ඊට පෙර මම එතුමාගේ පියා දැනගෙන හිටියා. එතුමාගේ පියා වූ සිරිල් මැතිව් මැතිතුමාත්, මගේ පියාත් හොඳ මිත්‍රයෝ. සිරිල් මැතිව් මැතිතුමා 1960 ඉඳන් එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් වැඩ කටයුතු කළා. නමුත්, මම නන්ද මැතිව් මැතිතුමා දැනගත්තේ 1972දීයි. නන්ද මැතිව් මැතිතුමාත්, අපේ ගාමිණී අතුකෝරල මැතිතුමාත්, මාත් ඒ කාලයේ ඉඳන්ම හොඳ මිත්‍රයන්. 1977 ඡන්දයට ඉස්සෙල්ලා, අතුරු මැතිවරණයට සහභාගි වූ අවස්ථාව මම විශේෂයෙන්ම මේ වෙලාවේ මතක් කරන්නට වුවමනායි.

ඒ කාලයේ රත්නපුරය දිස්ත්‍රික්කය වෙනුවෙන් එක්සත් ජාතික පක්ෂය වැඩ කටයුතු කළා. ඒ වාගේම ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ නායකත්වය තහවුරු කරන්න එතුමන්ලා දෙදෙනා ගත් පියවර මා අලුතින් කියන්න වුවමනා නැහැ. 1977න් පස්සේ නන්ද මැතිව් මැතිතුමා නියෝජ්‍ය ඇමතිවරයකු වශයෙන් පත් වූ අතර එතුමාගේ පියා කැබිනට් ඇමතිවරයකු වශයෙන් පත්වුණා. පියාත්, පුතාත් දෙදෙනාම ජීවත් වුණේ එකම නිවසකයි. අපි ඒ නිවසට යන විට සමහර විට පියා මුණ ගැහෙනවා, එහෙම නැත්නම් පුතා මුණ ගැහෙනවා. නන්ද මැතිව් මැතිතුමාගේ පියා - සිරිල් මැතිව් මැතිතුමා- ගැන මා කියන්න ඕනෑ. සාකච්ඡා කරන්න රාත්‍රියට එතුමාගේ නිවසට එන්න කියලා අපට කියනවා. බිරියානි කාලා තමයි ඒ සාකච්ඡා අවසන් වුණේ. වෙන මොකක්වත් එතැන සිද්ධ වුණේ නැහැ. නන්ද මැතිව් මැතිතුමා හැම වෙලාවේම පියාගේ මතය අනුමත කළේ නැහැ. නමුත් නන්ද මැතිව් පියාට කීකරුව ඒ වැඩ කටයුතු කරගෙන ගියා.

සිරිල් මැතිව් මැතිතුමා ගැනත් විශේෂයෙන් කියන්න ඕනෑ. එතුමා විශාල සේවාවක් කළා. එහෙත් 1984දී හිටපු ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගෙන් වෙන්වීම නිසා එතුමා කැබිනට් මණ්ඩලයෙන් ඉවත් කරන්න සිදු වුණා. එතුමා ඉවත් වුණාට පසුවත් නන්ද මැතිව් මැතිතුමා තමන් හිටපු ස්ථාවරය වෙනස් කළේ නැහැ. එකම ස්ථාවරයේ ඉඳගෙන එතුමා ක්‍රියා කළා. විශේෂයෙන්ම ආර්. ප්‍රේමදාස මැතිතුමා ජනාධිපති අපේක්ෂකයකු කරන්න ක්‍රියා කරලා, අමාරු කාලයකදීයි මැතිවරණය පැවැත්වුවේ. මේ හැම අවස්ථාවකදීම නන්ද මැතිව් මැතිතුමා මා හම්බ වෙනවා. එහෙම නැත්නම් මා නන්ද මැතිව් මැතිතුමා හම්බ වෙනවා. රූපා කරුණාතිලක මැතිතුමාත්, චන්ද්‍රා ගන්කන්ද මැතිතුමාත් අපත් එක්ක එකතු වුණා. අපි සියලුදෙනාම එකට එකතුවෙලා ඒ ගමන ගියා.

ආර්. ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ නන්ද මැතිව් මැතිතුමා මා හිටපු යෞවන කටයුතු අමාත්‍යාංශය භාර ගත්තා. මමයි පළමුවන යෞවන කටයුතු ඇමතිවරයා හැටියට කටයුතු කළේ. එතුමා දෙවන යෞවන කටයුතු ඇමතිවරයා හැටියට ඒ වැඩ කටයුතු භාරගෙන, ක්‍රීඩා අමාත්‍යාංශයත් භාරගෙන ඉදිරියට ගියා. ඒ කාලයේදීත් අපි මුහුණ දුන් හැම ප්‍රශ්නයකදීම එතුමා අපි සියලුදෙනා එක්ක එකට සිටියා, ජනාධිපතිතුමා එක්කත් සිටියා.

හිටපු නන්ද මැතිව් ඇමතිතුමා පෞද්ගලිකව මගේ දේශපාලන ගමනට විශාල ලෙස උදවු කළා. ඒ කාලයේ මට ශක්තියක් හැටියට තමයි එතුමා හැම වෙලාවේම සිටියේ. අපි මැතිවරණයෙන් පරාජය වුණාම විපක්ෂයේයි සිටියේ. නමුත් එතුමා ඒ විධියටම ක්‍රියා කළා. විශේෂයෙන්ම මා කනගාටු වුණේ, 1999දී එතුමා අපෙන් වෙන් වෙන්න තීරණය කළ නිසායි. එතුමා දේශපාලනයේ සිටියා නම් තවත් උසස් තනතුරක් ලබාගන්න තිබුණා. විශේෂයෙන්ම කොලොන්න ආසනය පාලනය කිරීමට එතුමාට තමයි දැනුම තිබුණේ. අපි එතුමාට හිනා වෙනවා, එතුමාට කොලොන්න ආසනයේ ගෙයක් නැහැයි කියලා. එතකොට එතුමා හිනාවෙලා කියනවා, "මට කොලොන්න ආසනයේ ගෙයක් නැති වුණාට, මට ආසනය දිනන්න පුළුවන්. ආසනය දිනන්න බැරි නම් ගෙයක් තියාගෙන වැඩක් නැහැ"යි කියලා.

ඊට පසුව එතුමාට ආණ්ඩුකාර ධුරය ලැබුණා. ආණ්ඩුකාරවරයා හැටියට එතුමා කිහිප වතාවක් මට කථා කළා. විශේෂයෙන්ම ඌව පළාතේ ආණ්ඩුකාරවරයා හැටියට කටයුතු කරන්න එතුමා කැමැති වුණා. එතුමා මිය ගියා කියලා අපි දැනගෙන සිටියේ නැහැ. ඒ ගැන පසුවයි අපි දැන ගත්තේ. ඒ ගැන අපි විශේෂයෙන් කනගාටු වෙනවා. අපි ඒ ගැන දැනගත්තා නම් මිත්‍රයකු හැටියටත්, හිටපු ඇමතිවරයකු හැටියටත් එතුමාට යුතුකම් ඉෂ්ට කරන්න අපට හැකියාව තිබුණා. මා හිතන හැටියට නන්ද මැතිව් මැතිතුමා හොඳ උදාහරණයක්. එතුමා මන්ත්‍රීවරයකු හැටියට තමන්ගේ වැඩ කටයුතු කරලා පක්ෂයත් සමඟ සහයෝගයෙන් කටයුතු කළ පුද්ගලයෙක්. එතුමා ගැන කථා කරනවා නම් දීර්ඝ වශයෙන් කථා කරන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, රංජිත් අතපත්තු මැතිතුමා ගැනත් වචන ස්වල්පයක් කථා කරන්න ඕනෑ. රංජිත් අතපත්තු මැතිතුමා මට මුණ ගැසුණේ දේශපාලනයට ඇතුළු වීමට පෙරයි. එතුමාගේ පියා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ රජයේ රාජ්‍ය කටයුතු පිළිබඳ නියෝජ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කළා. මා විටින් විට එතුමා හම්බ වුණා. ඊට පස්සේ එතුමාගේ පුතාත් හම්බ වුණා. සෑම් විජේසිංහ මැතිතුමාගේ ගෙදරදීයි අපි හම්බ වෙන්නේ. රංජිත් අතපත්තු මැතිතුමා එතැනට එනවා. විශේෂයෙන්ම රංජිත් අතපත්තු මැතිතුමා දේශපාලනයට ගෙනෙන්න සෑම් විජේසිංහ මැතිතුමාත් විශාල සේවාවක් කළා. එවකට තරුණ මන්ත්‍රීවරයකු වශයෙන් සිටි වර්තමාන අගමැතිතුමා බෙලිඅත්ත ආසනය නියෝජනය කළා. අනික් පැත්තෙන් තවත් තරුණයකු ඉදිරිපත් කරන්න වුවමනාය කියලා තමයි රංජිත් අතපත්තු මැතිතුමා මැතිවරණයට ඉදිරිපත් කළේ. නිවාඩ් කබ්රාල් කියන හැටියට මේ සියලුදෙනාම පවුල නමැති ගහක අතු. ඒ ගැන කියන්න මා දන්නේ නැහැ. මාත් ඒකට සම්බන්ධ කරලා තිබෙනවා. එහෙම නම් මා ඒ අත්ත කපා දමා තිබෙනවාය කියන එක හොඳයි. දිරපු අතු තබාගෙන වැඩක් නැහැ.

කොහොම වුණත්, 1977දී තමයි රංජිත් අතපත්තු මැතිතුමා අන්තිමට දේශපාලනයට ආවේ. ඊට ඉස්සෙල්ලා අපි ඔක්කෝම එකට වැඩ කරලා තිබෙනවා. මට මතකයි, මුල්කිරිගල ආසනයේ තමයි පළමුවැනි වතාවට අපි දෙන්නා ඡන්ද ව්‍යාපාරය කළේ. අනෙක් පැත්තෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමා ඡන්ද ව්‍යාපාරය කළා. එතුමා 1977දී මුල්කිරිගල ආසනයෙන් දිනලා ඇවිල්ලා සේවය කළා. විශේෂයෙන්ම කාර්මික විද්‍යාලය හදන්න, තවත් පහසුකම් අරගෙන බෙලිඅත්ත දියුණු කරන්න එතුමා විශාල උනන්දුවක් ගත්තා. නොරාඩ් සංවිධානයෙන් ආධාර ගත්තා. වික්‍රම වීරසූරිය මැතිතුමා ඒ ප්‍රදේශයට විශාල ලෙස පහසුකම් ලබා දුන්නා. ඒ වාගේම එතුමා සෞඛ්‍ය ඇමතිවරයා හැටියට පත් වුණා. සෞඛ්‍ය ඇමතිවරයා හැටියට එතුමා ඒ ප්‍රදේශයට විශාල සේවයක් කළා. ජපන් ආධාර අරගෙන රෝහල ඉදි කිරීම වාගේ සියලු කටයුතු භාර අරගෙන කටයුතු කළා වාගේම, ඒවා නවීකරණය කරන්නත් එතුමාට අවස්ථාව ලැබුණා.

ගරු රංජිත් අතපත්තු මැතිතුමා ඉන් පසුව කම්කරු ඇමතිවරයා හැටියට ක්‍රියා කළා. ඇමතිකමින් ඉවත් වෙලා ජීවිතය යන්න ඕනෑ කියලා ගරු රංජිත් අතපත්තු මැතිතුමා මට කිව්වාම, මම කිහිප වතාවක්ම එතුමාට කිව්වා, "ඇයි එහෙම කරන්නේ, ඔබතුමා මේ දේශපාලනය තුළ ඉන්න" කියලා. එතකොට එතුමා කිව්වා, "මගේ පුතා එහේ ඉන්නවා. ඔහුගේ අධ්‍යාපනය ගැන බලන්න ඕනෑ. ඒ නිසා මම ඇමතිකමින් ඉවත්වෙලා යනවා" කියලා.

සමහර අය කියනවා, ඇමතිවරු හම්බ කරනවා කියලා. ඇත්ත වශයෙන්ම එහෙම නොවන බවට එතුමා හොඳ උදාහරණයක්. එතුමා ඒ අවස්ථාවේ ඇමතිකමත් දීලා ගියා. එතුමාට මැතිවරණයකට තරග කරන්න බලාපොරොත්තුවක් තිබුණේ නැහැ. නමුත්, එතුමා අපිත් එක්ක එක්සත් ජාතික පක්ෂය තුළ ක්‍රියා කළා. එතුමාගේ පුතාත් කාලයක් පක්ෂයේ සිටියා. මට නම් ඊට පසුවත් එතුමා දේශපාලනය තුළ පමණක් නොවෙයි, සමාජය තුළදීත් මුණ ගැසුණා. එතුමාගේ අන්තිම කාලය වනතුරු මේ එකක්වත් අමතක නොකර එතුමා හොඳ ජීවිතයක් ගත කළා. මා එතුමා ගැන ඒ කරුණු කෙටියෙන් සඳහන් කළේ.

ගරු කථානායකතුමනි, ගරු එම්.එස්. තේමිස් මැතිතුමා ගැන මම නොදැන සිටියත්, අපි එතුමා ගැන පාසලේදීත් අසා තිබුණා. එතුමා පාර්ලිමේන්තු ආවේ තරුණ මන්ත්‍රීවරයකු හැටියටයි. ඒ කාලයේ සිටි තරුණම මන්ත්‍රීවරයා නිකවැරටියේ තෙන්නකෝන්

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

මැතිතුමායි. එතුමා වයස අවුරුදු 21න් පාර්ලිමේන්තුවට ආවේ. දෙවනුව ආවේ ගරු එම්.එස්. තේමිස් මැතිතුමායි. එතකොට එතුමාගේ වයස අවුරුදු 23යි. මම නියෝජනය කරන්නේ මැද කොළඹ ආසනය. එතුමන්ලා එතැන වාර්තාවක් තිබ්බා. එම ආසනයට මන්ත්‍රීවරුන් තුන් දෙනාම පත් වුණේ මහජන එක්සත් පෙරමුණෙන්. එදා කලීල් මැතිතුමාත් පරාජයට පත් වුණා. ඇත්ත වශයෙන්ම තේමිස් මැතිතුමා මා ජීවිතය ආරම්භ කළේ රුපියල් 20ක පඩියක් ලබා ගෙනයි. පාර්ලිමේන්තු එනකොට හම්බ වුණේ රුපියල් 750යි. එච්චරයි එදා දුන්න වේතනය.

පසුව එතුමා අපේ ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ පියා වන පිලිප් ගුණවර්ධන සමඟ මහජන එක්සත් පෙරමුණට එකතු වුණා. ඊට පසුව එතුමා 1965දී හෝ 1966දී පමණ අලුතින් ව්‍යාපාරයක් පටන් ගත්තා, "රෝයල් මේල්හවුස් ප්‍රයිවට් ලිමිටඩ්" කියලා. ඊට පසුව එතුමා ව්‍යාපාරිකයකු හැටියට තමයි ක්‍රියා කළේ.

Then, Sir, I knew the Hon. Prince Casinader when he was in Parliament from 1989 to 1994. He came from the Batticaloa District, from a well-known family, the Casinader family, and had been a teacher there. He came to Parliament with the late Hon. Sam Tambimuttu. It was a loss for the Hon. Casinader when the Hon. Sam Tambimuttu and his wife were killed outside the Canadian Embassy. The Hon. Sam Thambimuttu was succeeded by the Hon. Joseph Pararajasingham. We all knew that the Hon. Sam Tambimuttu was killed by the LTTE. The LTTE also killed the Hon. A. Amirthalingam and the Hon. V. Yogeswaran. That was a very difficult time. The other victims included the late Hon. Gamini Dissanayake, the late Hon. Ranjan Wijeratne, the late President Premadasa and the late Prime Minister Rajiv Gandhi. Those were the years in which we had the biggest setback with the LTTE. Later, the Hon. Joseph Pararajasingham was also assassinated. Unfortunately, the Hon. Joseph Pararajasingham's assassins have still not been identified, as to who is responsible for it. But, the late Hon. Prince Casinader took a big interest in it.

Before coming to Parliament, the late Hon. Prince Casinader served in the Citizens' Committee of Batticaloa. He was a very prominent person in putting forward the interests of the Batticaloa citizens and protecting them. I must say that he kept an active interest in Batticaloa until he died and the people of Batticaloa will remember him for the services he had rendered.

Thank you.

[අ.භා.12.17]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (විදේශ සබඳතා අමාත්‍ය, නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**

(மாண்புமிகு தினேஷ் குணவர்தன - வெளிநாட்டு உறவுகள் அமைச்சரும் திறன்கள் அபிவிருத்தி, தொழில்துறை மற்றும் தொழில் உறவுகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Dinesh Gunawardena - Minister of Foreign Relations, Minister of Skills Development, Employment and Labour Relations and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අභාවප්‍රාප්ත ගරු සී. නන්ද මැතිව් මහතා වෙනුවෙන් අද දිනයේ පාර්ලිමේන්තුවේ ශෝක ප්‍රකාශ යෝජනා සිදු කරන මේ අවස්ථාවේදී, අපේ පාර්ලිමේන්තුව ශෝභාවත් කරන්නට එතුමාගේ පාර්ලිමේන්තු කාලය දායාද වුණු බව සඳහන් කරන්න ඕනෑ. අපි තරුණ මන්ත්‍රීවරුන් හැටියට පාර්ලිමේන්තුවට පැමිණි කාලයේ ගරු නන්ද මැතිව් මැතිතුමා අමාත්‍යවරයකු, නියෝජ්‍ය අමාත්‍යවරයකු හැටියට පමණක් නොව, යොවුන් පරම්පරාව සමඟ අලුත් අදහස් ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂයෙන් ක්‍රීඩා ක්ෂේත්‍රය ආදී ක්ෂේත්‍ර රාශියක් භාරව විශාල සේවාවක් කළා.

කොළොන්න මැතිවරණ කොට්ඨාසයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වූ එතුමාට, කොළොන්න මැතිවරණ කොට්ඨාසයේ සෑම ගම් දනව්වකටම විශාල සේවාවක් ඉටු කරන්නට පුළුවන් වූ බව අදත් කොළොන්න මැතිවරණ කොට්ඨාසයේ සිටින අය සිහිපත් කරනවා. එතුමාගේ ආදරණීය පියා වූ සිරිල් මැතිව් මැතිතුමාගේ පවුල අපේ රටේ ජාතික දේශපාලනයේ ප්‍රධාන පවුලක්. අපේ සිංහල බෞද්ධ ජනතාවගේ හඬ, ඒ වෙනුවෙන් වූ ආරක්ෂාව, ඒ වෙනුවෙන් වූ මැදිහත්වීම ඇති කරන්න සිරිල් මැතිව් මැතිතුමා තමන්ගේ ධනය, තමන්ගේ කාලය, තමන්ගේ පදවිය පරිත්‍යාග කර කටයුතු කළ කෙනෙක්ය කියන එක මා ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා. නන්ද මැතිව් මැතිතුමාට එම ක්‍රියාමාර්ගය අලුත් පරම්පරාව හැටියට වඩාත් ප්‍රජාතන්ත්‍රවාදීව, ඒ වාගේම සහයෝගී ක්‍රියාමාර්ගයකින් ඉදිරියට ගෙනෙන්න පුළුවන් වුණේ, එතුමාගේ දැනුමේ තිබුණු පුළුල්භාවය නිසායි. ගරු නන්ද මැතිව් මැතිතුමා එදා විපක්ෂයේ සිටි අප සමඟත් බොහොම සුහදතාවෙන් කටයුතු කරමින්, අපට මඟ පෙන්වූ පාර්ලිමේන්තුවේ සිටි ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් කියලා මම විශේෂයෙන් සඳහන් කරනවා.

එතුමා අමාත්‍යවරයකු හැටියට පත් වුණා, අමාත්‍ය ධුරයෙන් පසුව එතුමා ආණ්ඩුකාර ධුරයට පත් වුණා. එතුමා සක්‍රිය දේශපාලනයෙන් ඉවත් වුණාට පසුවත් මහජනයා වෙනුවෙන් සිදු කරන පොදු කටයුතු රාශියකදී එතුමා සමඟ එකට වැඩ කරන්න අපට පුළුවන් වුණා. එතුමාගේ අභාවය සම්බන්ධව ශෝකය පළ කරන මේ අවස්ථාවේදී අපේ ගෞරවය එතුමාට පුද කරනවා. එතුමා තුළ තිබුණු අත්දැකීම් සම්භාරය අවසන් වූ නිසා එතුමාගේ වියෝව අද අපට විශාල පාඩුවක්. මේ අවස්ථාවේදී එතුමාගේ මැතිනිය ඇතුළු පවුලේ සියලුදෙනා සමඟ එතුමාගේ වියෝව වෙනුවෙන් ශෝකය බෙදා ගනිමින්, එතුමාට අපේ ගෞරවය පුදකර සිටිනවා.

ගරු කථානායකතුමනි, මඩකලපුව දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමාත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට ඉතාම මිත්‍රශීලිව අපට ආශ්‍රය කරන්න ලැබුණා. එතුමා පාර්ලිමේන්තුවට පත් වෙලා එනවිට අපි හිටියේ විපක්ෂයේ. ඒ වාගේම, මගේ ආසනයට පිටුපස ආසනයේයි එතුමා හිටියේ. එතුමා දේහයෙන් යෝධයකු හැටියට පෙනුණා. ඒ වාගේම, එතුමා බුද්ධියෙනුත් යෝධයෙක්; අධ්‍යාපන ක්ෂේත්‍රයේත් යෝධයෙක්. එතුමා මැදිහත් වී මඩකලපුව දිස්ත්‍රික්කයේ පරම්පරා තුනකට පමණ ලබා දුන් අධ්‍යාපන දැනුම නිසා ජනතාව තුළ එතුමා කෙරෙහි තිබුණු ගෞරවය, බැඳියාව දේශපාලන පක්ෂ භේදයෙන් තොරව තිබුණු බැඳියාවක්.

ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට සිටි කාලයේ මම මහරගම ආසනයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හැටියටයි හිටියේ. එතුමා මගේ වාහනයේ නැඟලා එතුමා සිටි පැරණි මහරගම ගුරු විද්‍යාලයට ගිහිල්ලා, පරණ කථා කියමින් අපි දෙදෙනා ඒ අවට ඇවිද්දා. එවැනි බොහොම සුහද මන්ත්‍රීවරයෙක් එතුමා. එතුමා තුළ තිබුණු අත්දැකීම් සම්භාරය නිසා රට පුරා විහිදී සිටි ගුරු පරම්පරාව ගැනත්, මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලය ගැනත් නිතර සිහිපත් කරන්න පුළුවන්කම ලැබුණා. ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා පාර්ලිමේන්තුවට යළි තේරී පත්වුණේ නැති වුණත්, අවසානයට මම එතුමා සමඟ

දුරකථනයෙන් කථා කළේ එතුමා මිය යන්නට මාස දෙකකට කලින්. එතුමා නිතර දෙවේලේ -මාසයකට වතාවක් හෝ,- කථා කරලා පාර්ලිමේන්තුව සම්බන්ධව කුමන හෝ කාරණාවක් කියන්නට දිගටම කටයුතු කළ මන්ත්‍රීතුමෙක් බව සිහිපත් කරනවා. ආදර්ශවත් ජනතා සේවාවක් කළ, පාර්ලිමේන්තුවේ කාරක සභාවලට එතුමාගේ උගත්කම, බුද්ධිමත්කම දායාද කළ ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමාගේ වියෝව පිළිබඳ ශෝක ප්‍රකාශය සිදු කරන මේ අවස්ථාවට එක්වෙමින්, විදේශගතව සිටින එතුමාගේ දියණියන් සමඟ මා ද ශෝකය බෙදාගන්නා බව සඳහන් කරන්නට කැමැතියි.

ගරු කථානායකතුමනි, එම්.එස්. තේමිස් මැතිතුමා 1956 මහ පෙරළියෙන් පාර්ලිමේන්තුවට පැමිණි මන්ත්‍රීවරයෙක්. සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියන බලවේග පහේ ජන අරගළයට නායකත්වය ලබා දුන් එක් අයකු හැටියට තමයි එතුමා පාර්ලිමේන්තුවට පත් වුණේ. ඒ අපේ රටේ තැපැල් සේවය උත්තම අවස්ථාවක තිබුණු කාල පරිච්ඡේදයක්. ඒ, ගෙයින් ගෙට තැපැල ගෙන යන සමයක්. අද ඒ තැපැල් සේවය දියුණු තත්ත්වයකට පත්වී fax machine එක, e-mail ආදිය පැමිණීම නිසා දැන් ලියුම්කරු ගැන තිබෙන අවශ්‍යතාව අඩුවෙමින් පවතිනවා. නමුත්, එම්.එස්. තේමිස් මැතිතුමා තැපැල් සේවකයන්ගේ නායකයා හැටියට ඒ මැතිවරණයට තරග කරලා, බලවතුන් ගණනාවක් අභිභවමින් ඉදිරියට පැමිණ මැද කොළඹ ආසනයේ තුන්වැනි මන්ත්‍රීවරයා හැටියට 1956 වසරේ පත් වුණා. ඒ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ ආණ්ඩුව තුළ පිලිප් ගුණවර්ධන මැතිතුමා සමඟ එතුමා ඉතාම කිට්ටුවෙන් ඇසුරු කළා. එතුමාගේ ශක්තිය තුළින්, එතුමාගේ හඬ පාර්ලිමේන්තුව තුළ හා ජනතාව තුළ රැව්දීම තුළින්, අපේ රටේ වෘත්තීය සමිති ක්ෂේත්‍රයට ප්‍රගතිශීලී අණ පනත් රාශියක් ගෙනැවිත් ඒවා සම්මත කරගන්නට හැකි වුණා. මා ඒ ගැන වැඩිදුර කරුණු සඳහන් කරන්නට යන්නේ නැහැ.

ගරු එම්.එස්. තේමිස් මැතිතුමා ඉතාම දක්ෂතාවෙන් යුතු කථිකයෙක් හැටියට මැද කොළඹ ආසනය පුරා ලොකු-කුඩා සියලු දෙනාගේ මිත්‍රත්වයට, ගෞරවයට, ආදරයට පත් වුණා. එතුමා සෑම ජන කොට්ඨාසයක්ම ආශ්‍රය කළා; සෑම ජන කොට්ඨාසයකම භාෂාව කථා කළා. මා හිතන විධියට, ඒ විශේෂිත දැනුම, එතුමාගේ දීර්ඝ කාලීන දියුණුවට උදව් වූ හේතුවයි. ගරු කථානායකතුමනි, ගරු එම්.එස්. තේමිස් මැතිතුමා පිළිබඳ වාර්තා සටහන් දිහා බැලුවොත් පෙනේවි, එතුමා 1956 වසරේදී යුරෝපයට ගිය, අපේ රටේ පාර්ලිමේන්තු නියෝජිත පිරිසේ -පාර්ලිමේන්තු කණ්ඩායමේ- සාමාජිකයකු ලෙස දෙවරක් ගමන් කළ බව. ඒ ගමන්වලදී ලද අද්දැකීම් මඟින් තමන්ගේ අදහස් තවත් ශක්තිමත් කරගෙන ඒ කාලයේ ඇති වෙච්ච සමාජ පෙරළිවලට එතුමා දැක්වූ දායකත්වය ගැන පසු කාලයක පාර්ලිමේන්තුවේ කළ කථාවලින් පැහැදිලි වෙනවා.

1959 අවුරුද්දේ අපේ රටේ ඇති වෙච්ච අමාත්‍ය මණ්ඩල වැඩ වර්ජනය ලංකා ඉතිහාසයේ පළමුවෙනි අමාත්‍ය මණ්ඩල වැඩ වර්ජනයයි. ඒ අවස්ථාවේ අමාත්‍ය මණ්ඩලයෙන් ඉවත් වෙලා මගේ පියා අනෙක් පැත්තට යනකොට ගරු එම්.එස්. තේමිස් මැතිතුමාත් එතුමා සමඟ එක්ව ගමන් කරලා මහජන එක්සත් පෙරමුණ වෙනුවෙන් විශාල කර්තව්‍යයක් කළා; ජනතා සේවය වෙනුවෙන් කැප වුණා.

ඊට අතිරේක කාරණයක් ගැනත් මා කියන්න ඕනෑ. ගරු එම්.එස්. තේමිස් මැතිතුමා පසුගිය කාල පරිච්ඡේදයේ අපේ රටේ සාර්ථක ව්‍යාපාරිකයෙකු බවට පත් වුණා. හිටපු අග්‍රාමාත්‍ය සහ හිටපු විපක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් ඒ ගැන සඳහන් කළා. පසු කාලයක ගරු එම්.එස්. තේමිස් මැතිතුමා මුද්‍රණ ක්ෂේත්‍රයේ ඉදිරියෙන්ම හිටපු ව්‍යාපාරිකයකු බවට පත් වුණා. එතුමාගේ කාලයේ එතුමා විවිධ අය සමඟ එකතු වෙලා අපේ රටේ මුද්‍රණ කර්මාන්තයේ -එම ක්ෂේත්‍රයේ- දියුණුව පිණිස තම දැනුම එකතු කළා. අපි ඒ කාරණයත් මේ වෙලාවේ සිහිපත් කරනවා. තම දක්ෂතාව පුළුල් ලෙස ජනතාව වෙනුවෙන්, තම ව්‍යාපාරය වෙනුවෙන්, ජාතික මෙහෙය වෙනුවෙන් යෙදවූ ගරු එම්.එස්. තේමිස් මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය එතුමාගේ පවුලේ අය සමඟ බෙදා ගනිමින් අපි එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, ගරු රංජිත් අතපත්තු මැතිතුමාගේ වියෝව පිළිබඳ ශෝක යෝජනාවට ද එක් වෙමින්, එතුමා සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා සඳහන් කරපු කරුණු සමඟ මා ද එකඟ වෙනවා. එතුමාගේ පියා ලංකා දේශපාලනයේ ජ්‍යොෂ්ඨයෙක්. රංජිත් අතපත්තු මැතිතුමා මට නිතර දෙවේලේ හමු වීමට හේතු වූ කාරණයක් තිබුණා. එතුමා උපන්නේ තංගල්ලේ. මගේ මවගේ ගමත් තංගල්ල. ඉතින්, කුමන දේශපාලන ප්‍රතිවිරුද්ධකම් තිබුණත් තංගල්ල නගරය හා ඒ අවට නිතර දෙවේලේ හමු වෙලා එතුමා සමඟ එකට ඉඳගෙන බොහෝ දේවල් ගැන කථා කරන්න පුළුවන්කම මට ලැබුණා.

ගරු රංජිත් අතපත්තු මැතිතුමා ඉතාම ආදර්ශවත් චරිතයක්. කුමන තනතුරක් ලැබුණත් සරල ලෙස ජනයා සමඟ කටයුතු කරන්න, ජනයා ආශ්‍රය කරන්න පුළුවන්කම තිබුණු කෙනකු හැටියට එතුමා පාර්ලිමේන්තුවට ආදර්ශයක් දුන්නා. එතුමා අමාත්‍යවරයකු හැටියට බොහොම සරල ලෙස හැසිරුණා. අප කාරණාවක් කිව්වා නම්, ආණ්ඩුවේ ද, විපක්ෂයේ ද කියලා බලන්නේ නැතිව මැදිහත් වෙලා උදව් කළා. වෛද්‍යවරයකු හැටියට එතුමාට තිබුණු හැකියාව නමැති දායාදය ක්ෂේත්‍රයට ලබා දීම සඳහා එතුමා කටයුතු කළා.

මම විශේෂයෙන් තවත් එක කාරණයක් සඳහන් කරන්න ඕනෑ. 1989 වසරේදී අපි "ශ්‍රී ලංකා - කියුබානු පාර්ලිමේන්තු මිත්‍ර සංගමය" ආරම්භ කළා. මම එහි පළමුවන ලේකම්වරයායි. එතුමා එහි සභාපතිවරයායි. එතුමා ඒ අවස්ථාවේ ගත් තීරණය නිසා කියුබානු රටේ ඉගෙන ගන්නා අපේ වෛද්‍ය ශිෂ්‍යයන්ට එවකට තිබුණු, ලියා පදිංචි වීම පිළිබඳ ගැටලුව නිරාකරණය කරමින් මුළුමහත් සමාජවාදී රටවලින් පැමිණි වෛද්‍යවරුන් සිය ගණනකට ඒ අයිතිවාසිකම ලබා දීමේ දොරටුව විවෘත කරන්න හැකි වුණා. ඒ වෙනුවෙන් එතුමා මැදිහත් වුණු ආකාරය ඉතාම ගෞරවයෙන් සඳහන් කරනවා.

දකුණු පළාතට පමණක් නොව, පොදුවේ බෞද්ධ ජනතාවට, බෞද්ධ කටයුතුවලට ගරු රංජිත් අතපත්තු මැතිතුමා ඉටු කළ සේවය අපි සිහිපත් කරන්න ඕනෑ. එතුමා අමාත්‍යවරයකු හැටියට සිටියදී ඉල්ලා අස් වෙලා යන දවසේ අපි පාර්ලිමේන්තුවේ හිටියා. එතුමා කිව්වා, "මගේ දරුවාට අධ්‍යාපනය ලබා දීම සඳහා මගෙන් ඉෂ්ට විය යුතු යුතුකම් කොටස ඉෂ්ට කරන්නට, මට තිබෙන වගකීම ඉෂ්ට කරන්නට අවශ්‍ය නිසා මම ඇමතිකමෙන් අයින් වෙලා යනවා" කියලා. ඊට පසුව කාලයක් තිස්සේ කොළඹ, තංගල්ල ආදී විවිධ ප්‍රදේශවලදී හමු වෙලා එකට ඉඳගෙන පොදු කටයුතුවලට සම්බන්ධ කරුණු ගැන එතුමා සමඟ සාකච්ඡා කරන්න අපට පුළුවන් වුණා. එසේ මිත්‍රයකු හැටියට අප හා එක්ව කටයුතු කිරීම වෙනුවෙන්, උපදෙස් ලබා දීම වෙනුවෙන්, රටට මහත් සේවාවක් ඉටු කිරීම වෙනුවෙන් අපේ ගෞරවය එතුමාට පුද කරමින් එතුමාට ද නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. එතුමාගේ වියෝව පිළිබඳ ශෝකය එතුමාගේ පවුලේ සියලුදෙනා සමඟ අපි බෙදා ගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුව දිවා භෝජනය සඳහා පස්වරු 1.30 දක්වා අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නියෝජ්‍ය කථානායකතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப.1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed,* DEPUTY SPEAKER *in the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය.

[අ.භා.1.30]

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ උත්තරීතර සභාව නියෝජනය කරපු ගරු සී. නන්ද මැතිව්, ගරු වෛද්‍ය රංජිත් අතපත්තු, ගරු ප්‍රින්ස් කාසිනාදර් සහ ගරු එම්.එස්. තේමිස් යන මැතිතුමන්ලාගේ අභාවය පිළිබඳව ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන මේ වෙලාවේ ඒ සියලු දෙනාගේ අභාවය වෙනුවෙන් පළමුවෙන්ම එතුමන්ලාගේ පවුල්වලට අපේ බලවත් ශෝකය පුද කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරපු, හිටපු අමාත්‍ය ගරු නන්ද මැතිව් මැතිතුමා පිළිබඳව විශේෂයෙන්ම මේ අවස්ථාවේ දී මා සඳහන් කරන්න අවශ්‍යයි. මොකද, එතුමා මගේ සහෝදරයා වූ දිවංගත ගාමිණී අතුකෝරල මහතා සමඟ දැඩි කල්‍යාණ මිත්‍රත්වයකින් කටයුතු කළ අතර, අපේ පවුල් අතරද ඉතා සමීප සම්බන්ධතාවක් පැවතුණා. ප්‍රභූ පවුලක, හිටපු අමාත්‍යවරයකු වන ගරු සිරිල් මැතිව් මැතිතුමාගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රරත්නය වන එතුමා ගුරුතලාව ශාන්ත තෝමස් විද්‍යාලයෙන් සහ ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබුවා. දේශපාලනයට පිවිසෙන්න එතුමා තෝරා ගත්තේ එතුමාගේ පියා ඉස්සෙල්ලාම නියෝජනය කරපු රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න මැතිවරණ කොට්ඨාසයයි. එතුමා 1965 වර්ෂයේ දී පැවැති මැතිවරණයෙන් රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට පත් වුණා.

රත්නපුර දිස්ත්‍රික්කයේ සිංහල බෞද්ධ පදනමක් තිබෙන ප්‍රදේශයක් හැටියට අපට ඇඹිලිපිටිය හඳුන්වන්නට පුළුවන්. ග්‍රාමීය ජනතාව ජීවත් වන ඉතාම දුෂ්කර ප්‍රදේශයක් වූ ඇඹිලිපිටියේ ඇත්තටම නව සංවර්ධනයක් ඇති කරන්න, නව වෙනසක් ඇති කරන්නට කටයුතු කරපු පුරෝගාමියා හැටියට අපට දිවංගත හිටපු අමාත්‍ය ගරු නන්ද මැතිව් ඇමතිතුමාව හඳුන්වන්නට පුළුවන්. අපේ හිටපු අගමැතිතුමා සඳහන් කළා වාගේ, එදා -1977- රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරපු ආසන සංවිධායකවරුන් සියලු දෙනාම ඉතා කුලුපග, කල්‍යාණ මිත්‍රයන් හැටියට කටයුතු කළ ඉතා හොඳ කණ්ඩායමක් වුණා. ඒ තිබුණු සම්බන්ධතා ඒ අය ජීවතුන් අතර සිටි කාලය පුරාවට එලෙසම පවත්වාගෙන යන්නටත් කටයුතු කළා. ඒ සියලු පවුල් සමඟ සමීප සම්බන්ධතාවක් තිබුණු කෙනකු හැටියට අද දක්වා ඒ තත්ත්වය එලෙසම පවතින බව මා දන්නවා. මේ උත්තරීතර සභාව නියෝජනය කරපු ඒ අයගෙන් තවමත් ජීවතුන් අතර ඉන්නේ, සබරගමුව පළාත් සභාවේ හිටපු ඇමතිවරයකු වන අබේරත්න පිලපිටිය මැතිතුමා පමණයි. ඇත්තටම එදා පාර්ලිමේන්තුව නියෝජනය කරපු ඒ හැම කෙනෙකුගේම, විශේෂයෙන්ම නන්ද මැතිව් මැතිතුමාගේ ක්‍රියා කලාපය බලනකොට දේශපාලනඥයන් හැටියට අද අපට ඉගෙන ගන්න ගොඩක් දේවල් තිබෙනවා. අගමැතිතුමා මතක් කළා වාගේ, කොළඹ ඉඳගෙන කොලොන්න දිනන්න ගරු නන්ද මැතිව් මැතිතුමා කටයුතු කළේ කොහොමද? තමන් භාර ගත්ත වැඩේ ඉෂ්ට කරන්නට බොහොම වුවමනාවෙන්, උපරිම කැපවීමකින් වැඩ කරපු ඇමතිවරයකු හැටියට අපට එතුමා මතක් කරන්නට පුළුවන්.

විශේෂයෙන්ම ඇඹිලිපිටිය බස් ඩිපෝ එක එදා ඉතා අබලන් තත්ත්වයේ පැවතුණේ. ලංගම බස් ඩිපෝ එක ඇති කරලා ඇඹිලිපිටිය නව නගරයක් ලෙස ගොඩ නඟන්නට එතුමා කටයුතු කළා. එතුමා මහවැලි නියෝජ්‍ය ඇමතිවරයා හැටියට සිටියදී ඩී.එස්. සේනානායක මැතිතුමාගේ කාලයේ පටන් ගත් 'උඩවලව' කියන ගොවිජනපදය කඩිනම් මහවැලි ව්‍යාපාරය තුළට ඇතුළත් කරන්නට ඉතා වුවමනාවෙන් වැඩ කටයුතු කළාය කියන එකත් මා මතක් කරන්නට ඕනෑ.

මේ වන විට හැම තැනම ක්‍රියාත්මක වන ප්‍රජා ජල ව්‍යාපෘති රත්නපුරය දිස්ත්‍රික්කයට හඳුන්වා දුන්නේ එතුමා දිසා ඇමතිවරයා හැටියට කටයුතු කළ කාලය තුළයි. කොළඹ ජීවත් වුණත්, පවුල් පසුබිම වෙනස් වුණත් ග්‍රාමීය ජනතාවගේ අවශ්‍යතා තේරුම් අරගෙන වැඩ කටයුතු කරන්නට එතුමාට පුදුම හැකියාවක් තිබුණා. එතුමා අපි ඉතා කුඩා කාලයේ සිට ඇසුරු කරපු කෙනෙක්.

මේ අවස්ථාවේ කනගාටුවෙන් වුණත් මතක් කළ යුතු කරුණක් තිබෙනවා. පසුකාලීනව එතුමා රෝගාතුර වෙලා සිටියත්, එතුමාගේ අවමඟුල් කටයුතු සිදු කරන අවස්ථාවේ දී අපි ලංකාවේ නොසිටි නිසා අපට ඒ ගැන දැන ගන්නට ලැබුණේ නැහැ. හැබැයි, ඒ පිළිබඳව දැන ගන්නට ලැබුණු අවස්ථාවේ මම ඇත්තටම කම්පා වුණා.

1999දී එතුමා වෙනත් දේශපාලන මතයක් නියෝජනය කිරීමට කටයුතු කළත්, මම හැම අවස්ථාවකම මගේ සහෝදරයා එතුමාත් සමඟ තියාගෙන හිටපු සම්බන්ධතාව දිගින් දිගටම පවත්වාගෙන ගියා.

එතුමා පසු කාලීනව ආණ්ඩුකාරවරයකු හැටියට ඌව පළාත නියෝජනය කළා. ඌව පළාතට ගිය හැම වේලාවකම එතුමා බැහැදකින්නට අපි කටයුතු කළා. එතුමාට නිල නිවාසක් නැති වුණත්, පසුකාලීනව පෞද්ගලික වතු යායක පිහිටි නිවසක පදිංචි වෙලා සිටියත්, හැමදාම දැකපු නන්ද මැතිව් මහත්මයා තමයි අවසානය වෙනකම්ම අපි දැක්කේ. සැමවිටම සිනාමුසු මුහුණින්, පොඩි ළමයින් වාගේ නිතරම විහිළු තහළු කරමින්, පවුලේ උදවිය වාගේම අප සමඟත් සම්බන්ධතා පවත්වා ගනිමින් කටයුතු කරපු එක ගැන තමයි මම හදවතින්ම මේ අවස්ථාවේ මතක් කරන්නේ. ඇත්තටම එතුමාගේ වියෝව දැන ගත් විට අපි ඉතා කනගාටුවට පත් වුණා. 2014 වර්ෂයේ දී තමයි මම එතුමා අවසාන වශයෙන් දැක්කේ. ඉන් පසුව එක දවසක් අරලියගහ මන්දිරයේ දී මුණ ගැසුණා. එතුමා මුණගැසුණු සැමවිටකම විහිළු තහළු කරමින්, ඉදිරියේ දී දේශපාලනය කළ යුත්තේ කොහොමද කියන එක ගැන නිතරම හොඳ උපදෙස් ලබා දුන්නා.

අපේ පවුලේ කල්‍යාණ මිත්‍රයකු වූ එතුමා නිහතමානී දේශපාලනඥයෙක්. විශේෂයෙන්ම අද මෙන් මුදල් පසුපස හඹායන දේශපාලනයක නොයෙදුණු, සැබැවින්ම අද දවසේ දේශපාලනඥයන්ට ආදර්ශවත් යුග පුරුෂයකු වූ එතුමා මම මේ අවස්ථාවේ දී කෘතවේදීත්වයෙන් සිහිපත් කරනවා. එතුමාගේ දයාබර බිරිඳ ඉන්දිරා මැතිව් මැතිනියටත්, එතුමාගේ එකම දරුවා වන නන්දිතා මැතිව් මෙනෙවියටත්, ඒ වාගේම පවුලේ සහෝදර සහෝදරියන්ටත් මගේ ශෝකය මේ අවස්ථාවේ පුද කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1977දී මේ උත්තරීතර සභාව නියෝජනය කිරීමට හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් පත් වුණු ගරු වෛද්‍ය රංජිත් අතපත්තු මැතිතුමා අපට කවදාවත් අමතක කරන්නට බැහැ. එතුමාගේ දේශපාලනය පිළිබඳව අපි හොඳටම දැනගෙන හිටියා. අපත් සමඟ ඉතා සමීප සම්බන්ධතාවක් නොතිබුණත්, එතුමාගේ පියාත්, එතුමාත් මේ උත්තරීතර සභාව නියෝජනය කරලා නොකැළැල් දේශපාලන උරුමයක් තියා ගත්ත පරම්පරාවක කෙනකු හැටියට අපට රංජිත් අතපත්තු මැතිතුමා මතක් කරන්නට පුළුවන්. අපේ අගමැතිතුමාත්, විපක්ෂ නායකතුමාත්, හිටපු අග්‍රාමාත්‍යතුමාත් සඳහන් කළ පරිදි එතුමා බොහොම වුවමනාවෙන් තමන් දරපු තනතුරුවල ගරුත්වය රැක ගෙන කැපවීමෙන් වැඩ කටයුතු කළ නායකයෙක්. ඒ වාගේම එතුමා 1977 වර්ෂයේ තංගල්ල ආසනය ජයග්‍රහණය කිරීමට -ඒ කාලේත් හම්බන්තොට දිස්ත්‍රික්කය පුරා නොයෙකුත් විධියේ තත්ත්ව තිබුණා- කටයුතු කළා. වෛද්‍ය රංජිත් අතපත්තු මැතිතුමා සෞඛ්‍ය ඇමතිවරයා හැටියට, කම්කරු ඇමතිවරයා හැටියට විශාල වැඩ කොටසක් කළා. ඒ වාගේම එතුමාගේ විශේෂත්වයක් තිබුණා. එතුමා කම්කරු හා සමාජ ක්‍රම සම්පාදන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ කාලයේම ලෝක සෞඛ්‍ය සංවිධානයේ උප සභාපතිවරයා ලෙසත් කටයුතු කළා. ඒක මහා විශේෂිත තත්ත්වයක්. එවැනි තනතුරක් දරන්නටත් එතුමාට පුළුවන්කම සහ අවස්ථාව ලැබී තිබුණා. ඉන්පසුව එතුමා ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂවරයකු හැටියට 1990 සිට 1995 දක්වා කාලය තුළ කටයුතු කළා.

මේ අවස්ථාවේදී ඒ සෑම දෙයක්ම අප කෘතවේදීත්වයෙන් යුතුව මතක් කරනවා. එතුමාටත් ඉන්නේ එකම දරුවායි. ඒ, ධ්‍රුවින්ද්‍ර ප්‍රමිත් අතපත්තු මහතායි. එතුමාත් පියාගේ අඩිපාරේ යමින්, කාලයක් දේශපාලනයට අවතීර්ණ වී වැඩ කටයුතු කළා. එතුමාත් වෛද්‍යවරයෙක්. අග්‍රගණ්‍ය ජනතා සේවකයකු හැටියට එතුමාගේ වෘත්තිය තුළ කටයුතු කරන බව අපට ආඩම්බරයෙන් කියන්න පුළුවන්. රංජිත් අතපත්තු හිටපු ඇමතිතුමා දරුවාගේ අධ්‍යාපනය වෙනුවෙන් කැප වූ නිසාම මෙවන් වෛද්‍යවරයෙකු බිහි වුණාය කියන එකත් මා මතක් කරන්නට ඕනෑ. අභාවප්‍රාප්ත, ගරු රංජිත් අතපත්තු මැතිතුමාට එතුමා ප්‍රාර්ථනය කළ බෝධියකින් නිවන් දකින්නට ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින්, මේ අවස්ථාවේදී අපගේ ශෝකය එතුමාගේ පවුලේ සියලුදෙනා වෙත පළ කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1989 වසරේ පාර්ලිමේන්තුවට පත් වූ ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා මඩකළපුව ප්‍රදේශය නියෝජනය කළ මන්ත්‍රීවරයෙක්. එතුමා ගැන අපට වැඩි අවබෝධයක් නොතිබුණත්, එතුමා සමඟ අපේ වැඩි සම්බන්ධතාවක් නොතිබුණත්, එතුමාගේ හිතවතුන් කිහිප දෙනෙකු එතුමා වෙනුවෙන් මඩකළපුව ප්‍රදේශයේ සිට අද මෙතැනට පැමිණ සිටින්නේ එතුමා සමඟ තිබුණු දැඩි සම්බන්ධතාව නිසා බව අපට පෙනෙනවා. එතුමාගේ මුළු පවුලම අද විදේශගතව සිටියදීත්, තම ගමන් සගයා මතක් කරන්නට එතුමා වෙනුවෙන් ඔවුන් අද මෙම ස්ථානයට පැමිණ සිටිනවා. එතුමා මෙම සභාව නියෝජනය කළේ කෙටි කාලයක් වුණත්, එතුමාගේ අභාවය වෙනුවෙනුත් අපගේ ශෝකය ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම්.එස්. තේමිස් හිටපු ගරු මන්ත්‍රීතුමා ගැනත් අප බොහෝ දේවල් නොදැන සිටියත්, අද කියැවුණු කරුණු අනුව, එතුමා හොඳ ජනතා සේවකයකු හැටියට මේ උත්තරීතර සභාව නියෝජනය කළාය කියන එක අපට දැන ගන්නට ලැබුණා. එතුමාගේ අභාවය වෙනුවෙනුත් මේ අවස්ථාවේදී එතුමාගේ පවුලේ උදවියට ශෝකය ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 1.43]

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යතුමා)**

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - பெருந்தோட்டக் கைத்தொழில் மற்றும் ஏற்றுமதிக் கமத்தொழில் அமைச்சர்)

(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Plantation Industries and Export Agriculture)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ මහජන නියෝජිතයන් කිහිපදෙනෙකුගේ අභාවය පිළිබඳ ශෝක යෝජනා මෙම ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන මොහොතේ, ප්‍රථමයෙන්ම ඒ පවුල්වල අයට මගේ සංවේගය ප්‍රකාශ කර සිටිනවා.

දකුණු පළාත නියෝජනය කරමින්, 1977දී පාර්ලිමේන්තුවට පැමිණි ඉතා විශිෂ්ට සහ කීර්තිමත් නායකයකු වූ වෛද්‍ය රංජිත් අතපත්තු මැතිතුමා ගැන මම පළමුවෙන්ම කථා කරන්න කැමැතියි. අද මේ සභාවේදී ගරු අගමැතිතුමා, විපක්ෂ නායකතුමා ඇතුළු අපේ ගරු මැති ඇමතිතුමන්ලා එතුමා පිළිබඳව ගුණ කථන කළා. එතුමා සම්බන්ධයෙන් වාගේම, අප අතරින් වියෝ වූ ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා, ගරු එම්.එස්. තේමිස් මැතිතුමා, ගරු සී. නන්ද මැතිව් මැතිතුමා පිළිබඳවත් අපේ ගරු මැති ඇමතිතුමන්ලා ගුණ කථන ඉදිරිපත් කළා.

සෞඛ්‍ය ඇමතිවරයා හැටියට රංජිත් අතපත්තු මැතිතුමාගේ නාමය එක්තරා කාල වකවානුවක ලංකාවේ ඉතාම ප්‍රචලිතව තිබුණු බව අප දන්නවා. ඒ, අප කුඩා කාලයේදීයි. 1977දී එක්සත් ජාතික පක්ෂය බලයට පත්වීමෙන් පසුව දකුණු පළාත නියෝජනය කරන්න මැති ඇමතිවරු රාශියක් සිටියේ නැහැ. අපට මතකයි, ඒ කාලයේදී ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කළ එක්සත් ජාතික පක්ෂයේ එම්.එස්. අමරසිරි මැතිතුමා, රූපා කරුණාතිලක මැතිතුමා වැනි අයත් නියෝජ්‍ය අමාත්‍ය ධුර තමයි දැරුවේ. හැබැයි, මොන්ටෙගු ජයවික්‍රම මැතිතුමා, රංජිත් අතපත්තු මැතිතුමා යන දෙපළ කැබිනට් අමාත්‍යවරුන් හැටියට එකල ප්‍රසිද්ධියට පත්ව තිබුණා. පසුකාලීනව දැනගත් කරුණු අනුව, රංජිත් අතපත්තු මැතිතුමා කොයි තරම් අවංක, කීර්තිමත් දේශපාලනඥයෙක්ද කියලා අප සෑම කෙනෙකුටම අවබෝධ වුණා.

එක්සත් ජාතික පක්ෂය විරුද්ධ පක්ෂයේ සිටිමින් අපහසු කාල සීමාවක් ගත කළ 1970 කාල වකවානුවේ, ජේ.ආර්. ජයවර්ධන විපක්ෂ නායකතුමා සමඟ එක්සත් ජාතික පක්ෂය නැවත බලයට පැමිණවීමට, එහි ආගමනය වෙනුවෙන් රුහුණේ, ගිරුවාපත්තුවේ ජනතාව සමඟ එකතුවී එතුමා මහැඟි මෙහෙවරක් කළ බව අප අසා තිබෙනවා. 1977දී පැවති මැතිවරණයෙන් ජයග්‍රහණය කර එතුමා කෙටි කාලයක් බෙලිඅත්ත ආසනයේ මන්ත්‍රීවරයා හැටියටත්, කෙටි කාලයක් කැබිනට් නොවන ඇමතිවරයකු වශයෙනුත් කටයුතු කර තිබෙනවා.

ඉන් පසුව එතුමා සෞඛ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කර තිබෙනවා. එතුමා සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ, අද දකුණේ විශිෂ්ටතම සෞඛ්‍ය කේන්ද්‍රස්ථානය බවට පත් වෙලා තිබෙන කරාපිටිය ශික්ෂණ රෝහල ගොඩ නඟන්නට බොහෝ වෙහෙස මහන්සි වී කටයුතු කළා. දෙවිනුවර ආසනය නියෝජනය කරමින් එවකට මුදල් අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ ගරු රොනී ද මෙල් මැතිතුමා සමඟ එක්ව, එතුමාගේ මූල්‍ය ප්‍රතිපාදන යොදවමින් ඒ සඳහා කටයුතු කර තිබෙනවා. ගරු රංජිත් අතපත්තු මැතිතුමා ගාල්ල දිස්ත්‍රික්කය ඇතුළු දකුණේ ජනතාවට ලබාදුන් ඒ ආයතනය අද ලංකාවේ ශික්ෂණ රෝහලක් හැටියට දියුණු වෙලා, විශිෂ්ට ගණයේ රෝහලක් බවට පත් වෙලා තිබෙනවාය කියන කාරණය අපි එතුමාට කරන ගෞරවයක් වශයෙන් සිහිපත් කරනවා.

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

ගරු රංජිත් අතපත්තු මැතිතුමාගේ සේවය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විවිධ අංශ තුළ පැතිරී තිබුණා. ඒ කාලයේ සෞඛ්‍ය සේවයට සම්බන්ධ වෙලා සිටි වෛද්‍යවරුන්, හෙද හෙදියන් මෙන්ම පරිපූරක සේවය ඇතුළු තවත් ක්ෂේත්‍ර ගණනාවක සේවය කළ අතිවිශාල පිරිසක් අදටත් ඉතාම කෘතවේදිත්වයෙන් යුතුව එතුමා සිහිපත් කරමින් කථා කරනවා. එතුමා ඉතා නිරහංකාරව, මැදහත් සිතින්, දේශපාලන පක්ෂ, පාට භේද බලන්නේ නැතිව, සෞඛ්‍ය සේවාවේ ප්‍රවර්ධනය වෙනුවෙන් කටයුතු කළ බව සැම කෙනකුම අවිවාදයෙන් පිළිගන්නා කාරණයක්.

ගරු රංජිත් අතපත්තු මැතිතුමා, සෞඛ්‍ය සේවාවට වාගේම, ඒ කාලයේ ඉතාම මන්දගාමී සංවර්ධන තත්ත්වයක් පෙන්නුම් කළ ඈත රුහුණේ ගිරුවාපත්තුව ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් ද දායකත්වය ලබා දී තිබෙනවා. විශේෂයෙන්ම, ලුණුගම්වෙහෙර යෝජනා ක්‍රමය සහ කිරම ඔය ව්‍යාපාරය වැනි සංවර්ධන යෝජනා ක්‍රමවලට එතුමාගේ දායකත්වය ලබාදී තිබෙනවා. ඒ වාගේම, බෙලිඅත්ත ප්‍රදේශයේ ජනතාවට සෞඛ්‍ය පහසුකම් සපයන්න, ඒ රෝහල් වැඩි දියුණු කරන්න එතුමා බොහෝ වෙහෙස මහන්සි වී කටයුුතු කළා.

1982දී අපේ රටේ පැවැති ජනාධිපතිවරණය සහ කුප්‍රකට ජනමත විචාරණය ගැන අපි කවුරුත් දන්නවා. "කළගෙඩි-ලාම්පු සෙල්ලම" හැටියටයි අපි ඒ ජනමත විචාරණය හැඳින්වූයේ. මේ මැතිවරණ දෙකේදීම සමහර ආසනවලින් එක්සත් ජාතික පක්ෂය පරාජයට පත් වුණා. ඒ නිසා අතුරු මැතිවරණ 18ක් පැවැත්වූවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආසන හතරටම අතුරු මැතිවරණ පැවැත්වුණා. ඒ අතුරු මැතිවරණවලදී නැවත වතාවක් බෙලිඅත්ත ආසනයෙන් තරග කළ රංජිත් අතපත්තු මැතිතුමාට ජයග්‍රහණය ලබලා පාර්ලිමේන්තුවට එන්න හැකියාව ලැබුණා. ඊට පසුව, එතුමා සෞඛ්‍ය ඇමතිවරයා හැටියට කාලයක් කටයුතු කළ බව අපි දන්නවා. එතුමා යටතේ තිබුණු සමහර ආයතන පසුව වෙනත් අමාත්‍යාංශවලට පැවරී තිබුණු බවත් අපි දන්නවා.

දේශපාලනය කරනකොට අපි සැම කෙනෙකුටම විවිධ සතුටුදායක අවස්ථා, එතරම් සතුටුදායක නොමැති අවස්ථා අත් විඳින්න සිදු වෙනවා. ඒ සැම දෙයකටම එතුමා මැදහත් සිතින් මුහුණ දුන්නා. තමන්ගෙන් රටට විය යුතු සේවාව පිළිබඳව ඉතාම හොඳ හැඟීමෙන් යුතුව එතුමා කටයුතු කළා. එතුමා මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට විශාල සේවාවක් ඉෂ්ට කළ බව අපි දන්නවා. 1989 මැතිවරණය වෙනකොට මේ රටේ විශාල භීෂණයක් පැතිරී තිබුණා. විශේෂයෙන් දකුණේ ඈත ගම් දනව්වල ඒ භීෂණය විශාල ලෙස පැතිරී තිබුණු බව අපි දන්නවා. එවැනි තත්ත්වයක් යටතේදීත්, 1989දී පැවති මැතිවරණයේදී ඉතා ඉහළ මනාප ඡන්ද සංඛ්‍යාවක් ලබා ගෙන පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා, කම්කරු සහ සමාජ ක්‍රම සම්පාදන අමාත්‍යවරයා හැටියට කටයුතු කරන්නට එතුමාට පුළුවන්කම ලැබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෙටි කාලයක් තුළ ජාත්‍යන්තර වශයෙන් එතුමාට ලැබුණු පිළිගැනීම ගැන අපි දන්නවා. ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් එතුමා කරන්නට යෙදුණු ඒ අනුපමේය මෙහෙවර වෙනුවෙන් එතුමාට ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් තනතුරක් ලැබී, එතුමා ලංකාවෙන් පිටව ගියා. හැබැයි, නැවත ලංකාවට පැමිණීමෙන් පසුවත්, එතුමා රුහුණේ ඈත ගම් දනව්වල ජීවත් වන අහිංසක මිනිසුන්ගේ සෞඛ්‍ය තත්ත්වය නඟාසිටුවන්න කටයුතු කළා. සෞඛ්‍ය සේවාවේ ප්‍රවර්ධනය වෙනුවෙන් එතුමාගේ ජීවිත කාලය කැප කළා.

වෛද්‍යවරයකු හැටියට එතුමා ඉතාම කීර්තිමත් ඉතිහාසයකට හිමිකම් කිව්වා. සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් පත් වෙලා ඉඳලා, පසුව ලෝක සෞඛ්‍ය සංවිධානයේ සේවය කර, නැවත තමන්ගේ ගම් පළාතට පැමිණි පසුවත් එතුමා තමන්ගේ සෞඛ්‍ය සේවා පවත්වා ගෙන ගියා. මුදල් අරමුණු කර ගෙන නොවෙයි, ඒ පළාතේ දුක් විඳින ජනතාවට යම්කිසි සේවයක් සැලසීම වෙනුවෙන් තමයි එතුමා ඒ කටයුතු කළේ කියන එක අපි සැම කෙනෙකුම දන්නවා. ඒ නිසා රුහුණේ ජනතාව ඉතාම ආදරයෙන් සහ ගෞරවයෙන් යුතුව එතුමා පිළිබඳව කථා කරනවා.

පරාර්ථකාමීව හිතමින්, ජනතාව පිළිබඳව සැබෑ හැඟීමකින් කටයුතු කළ, මේ රටේ මහ ජනතාවට සේවය කළ රංජිත් අතපත්තු මැතිතුමා වැනි විශිෂ්ට ජනතා නායකයන්, කීර්තිමත් දේශපාලනඥයන් අපේ රටට තවත් අවශ්‍යයි කියන එක අප කවුරුත් පිළිගන්නා කාරණයක්. එතුමාගේ සේවාව ඉතා ඉහළ මට්ටමෙන් ඉටු කළා. අපට එතුමාගේ ජීවිතය පිළිබඳව ආවර්ජනය කර සතුටු වෙන්න පුළුවන් මතකයක් එතුමා ඉතිරි කර ගිහින් තිබෙනවා.

ගරු රංජිත් අතපත්තු මැතිතුමාටත්, අද ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන අනික් මන්ත්‍රීතුමන්ලා වන ගරු ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමාටත්, -එතුමා නම් අපේ ආගමේ නොවෙයි- ගරු එම්.එස්. තේමිස් මැතිතුමාටත්, නන්ද මැතිව් මැතිතුමාටත් අප අදහන බුදු දහම අනුව අජරාමර නිවන් සුව අත්වේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා. විශේෂයෙන්ම, රංජිත් අතපත්තු මැතිතුමන්ගේ ආදරණීය පුතණුවන් වන වෛද්‍ය ධුවින්ද්‍ර ප්‍රමිත් අතපත්තු මැතිතුමා ඇතුළු ඒ පවුලේ සියලුදෙනාටම අපේ ශෝකය ප්‍රකාශ කර සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

[අ.භා.1.50]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන නන්ද මැතිව් මැතිතුමා, රංජිත් අතපත්තු මැතිතුමා, ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා, එම්.එස්. තේමිස් මැතිතුමා ඇතුළු ඒ සියලුදෙනාගේම පවුල්වල උදවියට මේ වෙලාවේදී මා මුලින්ම ශෝකය ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඌව පළාතේ වැඩිම කාලයක් ආණ්ඩුකාර ධුරයේ රැඳී සිටියේ නන්ද මැතිව් මැතිතුමා බව ඔබතුමාත් දන්නවා ඇති. නන්ද මැතිව් මැතිතුමා ආණ්ඩුකාර ධුරයේ රැඳී සිටි අවස්ථාවලදී ඒ පළාතේ ජනතාවට විශාල සේවයක් ඉටු කළා. සාමාන්‍යයෙන් ඡන්දයෙන් පත්වන මන්ත්‍රීවරුන් පැවැත්වූයේ එක් මහජන දිනයක්. නමුත්, එතුමා සතියේ හැම දාම වාගේ මහජන දින පවත්වමින් ඒ පළාතේ ජනතාවගේ එදිනෙදා කටයුතුවලදී ඇතිවන සමහර ප්‍රශ්නවලට පළාත් සභා මට්ටමින් ලබා දෙන්න ඕනෑ විසඳුම් ලබා දෙන්න මැදිහත් වුණා. බොහෝ අවස්ථාවලදී මම එතුමාත් සමඟ එකඟතාවෙන් කටයුතු කළත්, 2015දී පැවැති ජනාධිපතිවරණයෙන් පසුව ඌව පළාත් සභාවේ ප්‍රධාන ඇමති ධුරය සම්බන්ධයෙන් අපේම පක්ෂයේ සමහර උදවිය දිවුරුම් ප්‍රකාශ දීලා හරින් ප්‍රනාන්දු මැතිතුමා මහ ඇමතිතුමා කරන වෙලාවේදී ව්‍යවස්ථානුකූලව එහි තිබෙන දෝෂසහගතභාවය පිළිබඳව අපි එතුමා දැනුවත් කරලා එතුමාත් එක්ක වාද විවාද කළත්, ඒ අවස්ථාවේදී විශාල අරගළ තත්ත්වයක් මැද්දේ එතුමා වැරදි තීන්දුවක් ගත්තත්, ඊට පස්සේ විවිධ අවස්ථාවලදී එතුමා හමු වුණාම ඒ තත්ත්වය පැත්තකට දමලා, එහෙම මොකුත් නොවුණා වාගේ බොහොම සුහදව අපත් සමඟ කථා කළා.

ශ්‍රී ලංකා වොලිබෝල් සංගමයේ හිටපු සභාපතිවරයකු හැටියට මේ රටේ වොලිබෝල් ක්ෂේත්‍රයේ සිටින සියලුදෙනාම එතුමාට

ස්තුතිවන්ත වනවා. එතුමා තරුණ කටයුතු හා ක්‍රීඩා ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ මහාචාර්ය විනී විතාරණ මැතිතුමා පත් කරලා ඒකපුද්ගල කමිටුවකින් ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව හැටියට "වොලිබෝල් ක්‍රීඩාව" නම් කරන්න අවශ්‍ය කරන මහ පැදුවා. ලංකාවේ "ක්‍රිකට්" ක්‍රීඩාවක් පමණක් නොවෙයි, අපේ රටේ ආගමක් බවටත් දැන් පත්වෙලා තිබෙනවා. ඊට අමතරව, මා හිතවනා, අපේ රටේ බොහෝ ගම්දනව්වල ජාති, කුල භේදයෙන් තොරව කරන වොලිබෝල් ක්‍රීඩාව අපේ රටේ ජාතික ක්‍රීඩාවක් බවට පත් කිරීමේ ඒ අනභිභවනීය වැඩ පිළිවෙළට නායකත්වය දුන්නේ නන්ද මැතිව් මැතිතුමාය කියලා. එම නිසා එතුමා කළ සේවයට වොලිබෝල් ක්‍රීඩාලෝලීනුත් එතුමාට හැම දාම ගරු කරනවා.

ඌව පළාතේ වැඩිම කාලයක් ආණ්ඩුකාර ධුරයේ රැඳී සිටිමින් ඒ ආණ්ඩුකාර ධුරය තුළ බොහොම නිහතමානීව හා බොහොම සරලව ඒ කටයුතු කරමින් ඌව පළාතේ ජනතාවට -විශේෂයෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට- එතුමා කළ මෙහෙය සම්බන්ධයෙනුත් මේ වෙලාවේ අගය කිරීමක් කිරීම අත්‍යවශ්‍යයි. අපේ නන්ද මැතිව් මැතිතුමාට මේ වෙලාවේ මාගේ ශෝකයත්, මගේ පවුලේ ශෝකයත්, ඒ වාගේම බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ ශෝකයත් ප්‍රකාශ කරමින් එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු එම්.එස්. තේමිස් මැතිතුමා කියන්නේත් අපේ රටේ ඉතිහාසයේ කම්කරු නායකයකු හැටියට වැඩ කටයුතු කරලා, ඉන් පසුව පාර්ලිමේන්තුවට තේරී පත්වෙලා පාර්ලිමේන්තු ක්‍රමය තුළත් කම්කරු නායකයකු හැටියට එතුමා නියෝජනය කළ කම්කරු පන්තිය වෙනුවෙන් විශාල මෙහෙයක් කළ කෙනෙක්. එදා පැවැති ආණ්ඩුවේදී සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියන පංච මහා බලවේගවල ප්‍රමුඛ බලවේගයක් වන කම්කරු බලවේගය නියෝජනය කළ නායකයා, නියෝජිතයා තමයි, එම්.එස්. තේමිස් මැතිතුමා. එතුමා මේ රටේ ඉතිහාසය පුරාම අධිරාජ්‍යවාදීන්ට එරෙහිව කළ බොහෝ අරගළවලදී නිවැරදි පිලේ සිටිමින් මේ රටේ වාමාංශික ව්‍යාපාරයේ නොමැකෙන නමක් දිනාගත් කෙනෙක්. එතුමා පිලිප් ගුණවර්ධන මැතිතුමා එක්ක බොහොම කිට්ටුවෙන් වැඩ කළ බව අපි දන්නවා.

විශේෂයෙන්ම වර්තමානයේ පවතින කොරෝනා වෛරසය ගත්තත්, ඒ කොරෝනා වෛරසයට වඩා වැඩි වසංගත රෝග ලෝකයේ මීට පෙර පැවතිලා තිබෙනවා; ඒ වාගේම මීට වඩා මිනිසුන් මිය ගිහිල්ලාත් තිබෙනවා. නමුත් කොරෝනා වසංගතය ගැන වැඩි අවධානයක් යොමු කරමින් චීනයට පහරක් එල්ල කරන්න තමයි අද ඇමෙරිකාව වැනි බටහිර රටවල් මාධ්‍ය යොදාගෙන උත්සාහ කරන්නේ. අධිරාජ්‍යවාදීන් හැමතිස්සේම අධිරාජ්‍ය විරෝධී කඳවුරට පහර ගහන්න තමයි උත්සාහ කරන්නේ. අද අපි කොරෝනා වෛරසය පිළිබඳ දකින්නේත් ඒ වාගේ තත්ත්වයක්. චීනය වැනි රටක ඒ ජනතාවත් සමඟ ශ්‍රී ලංකාවාසී සියලුදෙනාම මේ වෙලාවේ එකට සිටගන්නට ඕනෑ. කොරෝනා වෛරසය ලංකාවට ව්‍යාප්තවීම වැළැක්වීමට අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සහ රජය ගත් පියවරටත් අපි මේ වෙලාවේ ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මේ කොරෝනා වෛරසය පිළිබඳ අනවශ්‍ය ප්‍රචාරයක් ලෝකය පුරාම දීලා, චීනයට පහර එල්ල කරන්න උත්සාහ කරන අධිරාජ්‍යවාදී රටවල්වලට අපේ විරෝධයත් පාමින් තමයි අපේ ආදරණීය මිත්‍ර රට වන චීනය සමඟත්, ඒ රටේ ජනතාව සමඟත් අප පෙනී සිටිය යුත්තේ. අද වාගේ දවසක තේමිස් මැතිතුමා හිටියා නම් අනිවාර්යයෙන්ම චීනයේ ඒ වැඩ පිළිවෙළ සමඟ හිටගන්න පාර්ලිමේන්තුවේ ඉන්න මිත්‍රයකු බවට පත් වෙනවා නිසැකයි. තේමිස් මැතිතුමා වැනි කම්කරු නායකයෙක් මේ සභාව තුළ කරපු ඒ උත්තරීතර මෙහෙය අගයමින්, තේමිස් මැතිතුමාගේ පවුලේ උදවියටත් අපේ ශෝකය ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා මම පෞද්ගලිකව හඳුනන්නේ නැති වුණත්, බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාව සමඟ සබඳතා පවත්වන බොහෝ පිරිසක් එතුමා නියෝජනය කරන මඩකළපුව දිස්ත්‍රික්කයේ ඉන්නවා. මොකද, මඩකළපුවේ ඉඳලා අපේ පළාතට ඇවිල්ලා ව්‍යාපාර කටයුතු කරන බොහෝ පිරිසක් අපේ පළාතේ ජීවත් වෙනවා. පක්ෂ පාට භේදයකින් තොරව ඒ අය නිතරම අගය කරන චරිතයක් තමයි ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා. එතුමා දෙමළ ජනතාව නියෝජනය කරන නායකයකු හැටියට කාගේත් හිත් දිනාගෙන වැඩ කරපු ආදරණීය මන්ත්‍රීවරයෙක්. විශේෂයෙන්ම එතුමාගේ දේශපාලන න්‍යාය පත්‍රය තුළ ජාතිවාදය අවුස්සන්නේ නැතිව, තවත් ජාතියකට එරෙහිව වෛරය පතුරුවන්නේ නැතිව, ද්වේශය පතුරුවන්නේ නැතිව කටයුතු කරපු නායකයකු හැටියට ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා ඉතිහාසගත වෙනවා. ඒ පළාත්වල අපි බොහෝ වෙලාවට දකින්නේ ජාතිවාදී පදනම් මත තවත් ජාතියක් කෙරෙහි වෛරය පතුරුවමින්, ද්වේශය පතුරුවමින් දේශපාලනය කරන උදවියයි. නමුත් ඒ අයගෙන් වෙන් වෙච්ච, බොහෝම නිහතමානීව කා සමඟත් මිත්‍රත්වයෙන් හා සුහදව වැඩ කරපු නායකයකු හැටියට කාසිනාදර් මැතිතුමා හඳුන්වා දෙන්න පුළුවන්. එතුමාගේ පවුලේ උදවිය අද මේ රටේ නැති වුණත්, එතුමා කරපු සේවය වෙනුවෙන් එතුමාගේ හිතවතුන් පිරිසක් අද මේ සභාවට පැමිණ සිටිනවා. අපි ඒ අය වෙනුවෙන් ප්‍රින්ස් කාදිනාදර් මැතිතුමා විශ්වාස කරපු ආගම අනුව එතුමාට මෝක්ෂය ලැබේවායි කියා මේ වෙලාවේ ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෛද්‍ය රංජිත් අතපත්තු මැතිතුමා ලංකාවේ පාර්ලිමේන්තුවේ හිටපු මහත්මා දේශපාලනය - gentleman politics - ප්‍රගුණ කරපු මන්ත්‍රීවරයකු; ඇමතිවරයකු හැටියට පක්ෂ විපක්ෂ කා අතරත් බොහොම ප්‍රසිද්ධියට ලක් වෙච්ච කෙනෙක්. මට එතුමා පෞද්ගලිකව හඳුනා ගැනීමට අවස්ථාවක් ලැබුණේ නැහැ. මොකද, මම 1994දී පාර්ලිමේන්තුවට එනකොට එතුමා පාර්ලිමේන්තුවේ හිටියේ නැති නිසා. නමුත්, අපි විවිධ අවස්ථාවලදී මාධ්‍ය හරහා එතුමා පිළිබඳව අසා තිබෙනවා. ඒ වාගේම, අපි පාසල් යන කාලයේ පාර්ලිමේන්තුවට ආපු අවස්ථාවලදී මහජන ගැලරියේ ඉඳලා අපි එතුමාගේ කථා අසා තිබෙනවා. එතුමාගේ ඒ කථා විලාශය අනුව, එතුමා වැඩ කරපු විලාශය අනුව අපි එතුමා ගැන දන්නවා. මහත්මා දේශපාලනයේ ප්‍රතිමූර්තියක් වෙච්ච වෛද්‍ය රංජිත් අතපත්තු හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ, හිටපු ඇමතිතුමාගේ පවුලේ අයටත් අපි මේ වෙලාවේ අපේ ශෝකය පුද කරමින්, මට මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.00]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන මේ අවස්ථාවේ අපේ දොස්තර රංජිත් අතපත්තු මැතිතුමා පිළිබඳව මුලින්ම අදහස් දක්වන්න මම කැමැතියි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ප්‍රදේශයේ සිටි වෛද්‍යවරයකු හැටියට එතුමා විශාල සේවාවක් ඉෂ්ට කළා. එතුමා 1977දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ රජයේ මන්ත්‍රීවරයකු ලෙස පත්වී, පසුව සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට පත්වී ඒ යුගයේ හැටියට අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට විශිෂ්ට සේවාවක් කරපු, අපේ රට වෙනුවෙන් ඉතා වැදගත් කාර්ය භාරයක් ඉෂ්ට කරපු කෙනෙක්.

එතුමා දේශපාලන වශයෙන් සේවාවක් ඉෂ්ට කළා වාගේම ලෝක සෞඛ්‍ය සංවිධානයට සම්බන්ධ වෙලා, ඒ හරහා වසර හතරක විතර කාලයක් ලෝකයටම සේවයක් කරන්න එතුමාට අවස්ථාව ලැබුණා. ඒ නිසා මේ අවස්ථාවේදී අපි එතුමා සිහිපත් කරන්න ඕනෑ.

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

අපට එතුමා ආශ්‍රය කරන්න බැරි වුණත් එතුමා මගේ පියතුමන්ලා සමඟ 1977 පාර්ලිමේන්තු කණ්ඩායමේ හිටියා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ රෝහල් ගණනාවක අවශ්‍යතා ඉෂ්ට කරන්න එතුමා පැමිණි ආකාරය මට මතකයි. එවන් අවස්ථාවලදී ඉතාම නිහතමානී අමාත්‍යවරයකු හැටියට එතුමාගේ කාර්යභාරය ඉතාම ඉහළ මට්ටමින් ඉෂ්ට කරපු නායකයකු හැටියට තමයි මට එතුමා හඳුන්වන්න පුළුවන් වන්නේ. මට මතක හැටියට 1983 ජනමත විචාරණයෙන් පසුව පරාජයට පත් වූ ආසනවල අතුරු මැතිවරණයක් - by-election එකක් - තිබුණා. එම මැතිවරණයෙනුත් ජයග්‍රහණය කරලා, එවැනි දුෂ්කර ප්‍රදේශයක ආසනයකින් නැවත වතාවක් එතුමාට පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව උදා වුණා. එම ප්‍රදේශය තුළ එතුමා ලබා තිබුණු ජනප්‍රියතාව ඒකෙන්ම ඔප්පු වනවා. විශිෂ්ට මහජන නායකයකු හැටියට තමයි අපට අතපත්තු මැතිතුමා හඳුන්වන්න පුළුවන් වන්නේ. එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ සියලුදෙනාටම අපේ බලවත් ශෝකය පුද කරමින්, එතුමාට නිවන් සුව අත්වේවා යි කියා මා ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නන්ද මැතිව් මැතිතුමා ගැනත් මම මේ අවස්ථාවේදී වචනයක් කථා කරන්න ඕනෑ. 1965 තරම් ඈත කාලයේදී තරුණයකු හැටියට පාර්ලිමේන්තුව නියෝජනය කළ එතුමා නැවත 1977 වසරේදීත් පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ආසනය නියෝජනය කරමින් එතුමා ඒ දුෂ්කර ප්‍රදේශයේ ජනතාවට විශිෂ්ට සේවාවක් ඉටු කළා. තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට වාගේම තවත් අමාත්‍යාංශ ගණනාවක අමාත්‍ය ධුර දරමින් එතුමා ඒ ප්‍රදේශයේ ජනතාවට විශාල සේවාවක් ඉෂ්ට කළා. මම 1994 පාර්ලිමේන්තුවට පැමිණි මුල් අවස්ථාවේ ඉඳලා අවුරුදු හයක් මට එතුමා ආශ්‍රය කරන්න ලැබුණා. අප විපක්ෂයේ හිටපු කාලයේ එතුමා ඉතාම නිහතමානී ලෙස අමාත්‍ය තනතුරු දරපු ආකාරය මා දැක්කා. දීර්ඝ කාලයක් පාර්ලිමේන්තුවේ හිටපු නිසා අපට එතුමාගෙන් ආදර්ශ ගණනාවක් ලබා ගන්න පුළුවන් වුණා. ඒ නිසා මේ අවස්ථාවේදී එතුමාත් සිහිපත් කරනවා. එතුමා දේශපාලනයෙන් ඉවත් වෙලා ආණ්ඩුකාරවරයකු හැටියට කටයුතු කළා. එතුමාගේ පියා වූ සිරිල් මැතිව් මැතිතුමා වාගේම එතුමාත් දේශපාලන ජීවිතය තුළදී ඒ ප්‍රදේශයේ ජනතාවට වාගේම රටේ ජනතාවට යම් සේවාවක් ඉෂ්ට කළා. දේශපාලනයේ නියැලුණු ඉතාම වැදගත් පුද්ගලයකු හැටියට වාගේම මන්ත්‍රීවරයකු, අමාත්‍යවරයකු, ආණ්ඩුකාරවරයකු හැටියටත් එතුමා ඒ සේවාව නිසියාකාරයෙන් ඉෂ්ට කළාය කියන කාරණයත් මම මේ අවස්ථාවේදී මතක් කරමින් එතුමාගේ අභාවය වෙනුවෙන් මගේ ශෝකය එතුමාගේ පවුලේ සියලුදෙනාටම පුද කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීතුමන්ලා හතර දෙනෙකුගේ ශෝක ප්‍රකාශ යෝජනා පිළිබඳව කථා කරන මේ අවස්ථාවේදී එම්.එස්. තේමිස් මැතිතුමා ගැනත් මම යමක් කිව යුතුයි. එම්.එස්. තේමිස් මැතිතුමා 1956 තරම් අතීතයේදී පාර්ලිමේන්තුව නියෝජනය කළා. 1956 බණ්ඩාරනායක මැතිතුමා ගෙනා සමාජ විප්ලවයත් සමඟ එතුමා සාමාන්‍ය ජනතාව අතරින් ආපු වෘත්තීය සමිති කටයුතු කළ නායකයකු වුණා. ඒ යුගයේ හැටියට එවැනි පුද්ගලයන්ට පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව තිබුණේ නැති වුණත් ඇති වූ ඒ පරිවර්තනයත් සමඟ තමයි අපේ තේමිස් මැතිතුමාට පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව උදා වුණේ. සාමාන්‍ය ජනතාව නියෝජනය කරමින් ඒ කාර්යභාරය නිසියාකාරයෙන් ඉෂ්ට කරපු මන්ත්‍රීවරයකු හැටියට එතුමා හඳුන්වන්න පුළුවන්. එතුමාගේ අභාවය පිළිබඳවත් එතුමාගේ පවුලේ උදවියට අපේ ශෝකය මේ අවස්ථාවේදී පුද කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමාත් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් තම ප්‍රදේශයේ ජනතාවට වාගේම සියලු ජාතීන්ට එක හා සමානව කටයුතු කළ නායකයෙක්. එතුමාගේ අභාවය පිළිබඳවත් එතුමාගේ පවුලේ උදවියට අපේ ශෝකය පුද කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව නියෝජ්‍ය කථානායකතුමාටත් ස්තුතිය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා.2.05]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
**(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)**
**(The Hon. (Dr.) Rajitha Senaratne)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයකු වූ රංජිත් අතපත්තු මැතිතුමාගේ අභාවය වෙනුවෙන් අපි අද දින ශෝක ප්‍රකාශ ඉදිරිපත් කරනවා. එතුමා 1977 ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ ජයග්‍රහණයත් එක්ක මහින්ද රාජපක්ෂ මැතිතුමා පරාජය කරමින් බෙලිඅත්ත ආසනය ජයග්‍රහණය කරලා, 1977 වර්ෂයේ මුලින්ම පාර්ලිමේන්තුවට ආවා. ඊට පස්සේ එතුමා වරෙක කම්කරු ඇමති වෙලා හිටියා; වරෙක සෞඛ්‍ය ඇමති වෙලා හිටියා. එතුමා සෞඛ්‍ය අමාත්‍ය ධුරයේ ඉන්නකොට, මම සෞඛ්‍ය අමාත්‍යාංශයේ දන්ත වෛද්‍යවරයකු ලෙස රාජකාරි කළා. ඒ වාගේම වෘත්තීය සමිති නායකයකු වශයෙන් නොයෙකුත් වෘත්තීය ක්‍රියාමාර්ග පිළිබඳව, වෘත්තීය ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා බොහෝ විට මා එතුමා හම්බ වෙලා තිබෙනවා. මොන දේශපාලන මතිමතාන්තර තිබුණත්, එතුමා ඒ හැම අවස්ථාවකදීම ඉතා සාවධානව අපට සවන් දීලා, ඉතාම වැදගත් විධියට, වෛද්‍යවරයකු විධියට හැමෝම එක්ක ඉතාම හොඳින් කටයුතු කරමින් හැමෝටම සාධාරණ විධියට වැඩ කළා. වමේ දේශපාලනඥයකු වශයෙන් මා ඒ වෙලාවේ එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව දැඩි ලෙස දේශපාලනය කළා. මා රජයේ දන්ත වෛද්‍ය සංගමයේ ලේකම් වශයෙනුත්, වෛද්‍ය සුනිල් රත්නප්‍රිය මැතිතුමා වෛද්‍ය සංගමයේ ලේකම්වරයා වශයෙනුත් සිටියදී අප දෙදෙනාම වමේ දේශපාලන ව්‍යාපාරයේ එකට වැඩ කළා. මට මතකයි, විජය කුමාරණතුංගයන් මිය යන්නට පෙර 1988 ජනවාරි 28වැනි දා ශ්‍රී ලංකා මහජන පක්ෂයේ අවසාන රැලිය පැවැත්වුණා. ඒක තමයි විජය කුමාරණතුංගයන් ඇමතූ අවසාන රැලිය. එම රැලියේ මූලාසනය දැරුවේ මායි. ඒ පින්තූර ඊට පහුවෙනි දා පුවත් පත්වල පළ වුණා. රංජිත් අතපත්තු මැතිතුමා මගේ අධ්‍යක්ෂවරයාට කථා කරලා කියලා තිබුණා, "මේ බලන්න, මේ මනුස්සයා මේකේ ප්‍රසිද්ධියේම දේශපාලනය කරනවා නේ. ටිකක් පරිස්සම් වෙලා මේවා කරන්න කියලා මෙයාට කියන්න" කියලා. අන්න ඒ වාගේ ප්‍රතික්‍රියා දැක්වීමක් එතුමාට තිබුණා. තවත් වරෙක 1989 වර්ෂයේ වමේ අපේක්ෂකයා විධියට, එක්සත් සමජවාදී පෙරමුණේ අපේක්ෂකයා විධියට ඔසී අබේගුණසේකර මැතිතුමා නාම යෝජනා දුන්නාම, ඒ පින්තූරය මුලින්ම "Daily News" පත්තරයේ පළ වුණා. ඔසී අබේගුණසේකර මැතිතුමා නාම යෝජනා දුන් පසුව මම අතක් උස්සාගෙන, සටන් පාඨ කියාගෙන, එතුමාගේ පිටුපසින් එළියට එනවා. එතකොට රංජිත් අතපත්තු මැතිතුමා කියලා තිබුණා, "මේ බලන්න, රාජිත දිගින් දිගටම මෙහෙම කරනවා. ඔහුට දේශපාලන අයිතිය නැහැ. අඩු ගණනේ ඔහු නිවාඩු දමලා තිබෙනවාද බලන්න" කියලා. ඒ වෙලාවේ ගිහිල්ලා බලලා ඇවිල්ලා කියලා තිබුණා, "නිවාඩු දමලා තිබෙනවා" කියලා. නමුත් ඒ විධියට එතුමාගේ ප්‍රතික්‍රියා දැක්වීමක් තිබුණා. එතුමා එක්සත් ජාතික පක්ෂයේ හිටියා. මම එක්සත් ජාතික පක්ෂයට දැඩිව විරුද්ධව හිටියා. ඒ වුණත්, එතුමා ඉතාම වැදගත් විධියට ඒ හැම අවස්ථාවකදීම ක්‍රියා කළා. ඒ විතරක් නොවෙයි, 1989 වර්ෂයේ දී එතුමා හම්බන්තොට දිස්ත්‍රික්කයෙනුත්, මම කොළඹ දිස්ත්‍රික්කයෙනුත් නාම යෝජනා දුන්නා. එතුමා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් හිටියා. මම එක්සත් සමාජවාදී පක්ෂය නියෝජනය කරමින් හිටියා. අපේ college එකේ function එකක් එදින රාත්‍රියේ ගලධාරි

හෝටලයේ තිබුණා. එතුමා එතැනට ආපු හැටියේ අහලා තිබුණා, "රාජිත ආවාද" කියලා. එතකොට කියලා තිබුණා, " සර්, රාජිත එනවා. හැබැයි ටිකක් පරක්කු වෙලා එන්නේ" කියලා. මම මුල් දවසේ මගේ මැතිවරණ ව්‍යාපාරය පටන් අරගෙන, රෑ 8.00, 8.30 වෙනකොට එතැනට ගියා. ඒ යද්දි එතුමා හිටියා. එතුමා මගේ ඇමතිවරයා. එතුමා මගෙන් ඉස්සෙල්ලාම ඇහුවා, "හා මචං, ඔයාගේ මැතිවරණය කොහොමද? කියලා. නමුත් මම එතුමාට පිළිතුරු දුන්නේ "සර්" කියලා. ඊට පස්සේ එතුමා මාත් එක්ක හුඟක් වෙලා කථා කර කර හිටියා. එතුමා කිව්වා,"ඔයගොල්ලන්ට නම් මැතිවරණ ව්‍යාපාරය තිබෙනවා. අපේ පැත්තේ මැතිවරණ ව්‍යාපාරයක් නැහැ. අපට මේ වතාවේ සල්ලි යන්නෙත් නැහැ" කියලා. ඒ මැතිවරණ කාලයේ ඒ තරම්ම තදබල භීෂණයක් තිබුණා. ඒ වාගේ ඉතාම නිරහංකාර අන්දමින් එතුමා අමාත්‍ය ධුරය වාගේම අනෙක් සියලු තනතුරුත් දැරුවා.

එතුමා කාලයක් ලෝක සෞඛ්‍ය සංවිධානයේ රාජකාරි කළා. ඊට පස්සේ ඇවිල්ලා මන්ත්‍රී ධුරය නැතුව විශ්‍රාම සුවයෙන් ඉන්නකොට එතුමාට ඡන්ද ඕනෑ නැති වුණත්, එහෙම ඉන්න කාලයේත් බොහෝ විට මට කථා කළා. මම ධීවර ඇමතිවරයා, ඉඩි කිරීම් ඇමතිවරයා, ඉඩම් ඇමතිවරයා සහ අවසානයේදී සෞඛ්‍ය ඇමතිවරයා වෙලා ඉන්නකොට බොහෝ වෙලාවට හම්බන්තොට දිස්ත්‍රික්කයේ නොයෙකුත් ප්‍රශ්න ගැන එතුමා මට කථා කළා. නොයෙකුත් අයට පත්වීම් ලබා දීම, ස්ථාන මාරුවීම් ලබා දීම වැනි සාධාරණ ඉල්ලීම් සම්බන්ධයෙන් මා හමුවීමට එතුමා පුද්ගලයන් එව්වා. එතුමා එවපු හැම එක්කෙනාගේම ඉල්ලීම් එතුමා වෙනුවෙන් මා ඉෂ්ට කළා. සමහර වෙලාවට අපේ වෘත්තීය සමිති එතුමා එවපු දේවල්වලට විරුද්ධ වුණාම මම කිව්වා, "නැහැ. මේක මගේ පෞද්ගලික ප්‍රශ්නයක්. මගේ හිටපු ඇමතිවරයා මේ ඉල්ලන්නේ. මේක මට කරන්නම සිදු වෙනවා" කියලා. එහෙම කියලා මම ඒවා ඉටු කරලා දුන්නා. එතුමා ඉතා වැදගත් මහත්මයෙක්. එතුමාගේ අභාවය සිදුවන කාලය වන කල්ම මම ඉතා කිට්ටුවෙන්ම එතුමා ආශ්‍රය කළා. ඒක නිසා මම කියනවා, රංජිත් අතපත්තුලා වැනි වැදගත් මහත්වරු තව තවත් මේ පාර්ලිමේන්තුවට එන්නට ඕනෑ කියලා. එතුමාගේ අභාවය ගැන මගේ කනගාටුව එතුමාගේ දරුවන් ඇතුළු පවුලේ සියලු සාමාජිකයන්ට පළ කරමින්, එතුමාට නිවන්සුව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී කථා කරන්න ඕනෑ, ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා ගැනත්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1988දී සහ 1989දී පැවැත්වූ ජනාධිපතිවරණයේදී සහ මහ මැතිවරණයේදී එක්සත් සමාජවාදී පෙරමුණේ උතුර සහ නැඟෙනහිර භාරව සිටියේ මායි. මා සතියකට දෙවරක් මැතිවරණ ව්‍යාපාරයේ රැස්වීම් සංවිධානය කරන්න උතුරටත්, නැඟෙනහිරටත් ගියා. ඒ වෙලාවේ ඒ පළාතේ තිබුණේ, ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණයි. අමිර්තලිංගම් මහත්තයාගේ නායකත්වයෙන් තමයි ඒ පෙරමුණ තිබුණේ. නමුත් එතුමන්ලාගෙන් බොහෝ අය හිටියේ ඉන්දියාවේ. ඒ කට්ටිය හැංගිලා හිටියේ, LTTE එකේ මරණ තර්ජන නිසා. නමුත් ඒ වෙලාවේදී EPRLF එක, TELO එක ඇතුළු එදා ඉන්දු ලංකා ගිවිසුම යටතේ ප්‍රජාතන්ත්‍රවාදයට ආපු සංවිධාන ටික එකතු වෙලා LTTE ත්‍රස්තවාදයට මුහුණ දුන්නා. ඒ වාගේම අපිත් LTTE ත්‍රස්තවාදයටත්, දකුණේ අනෙක් ත්‍රස්තවාදයටත් මුහුණ දෙමින් හිටියේ. ඒක නිසා අපි ඒකාබද්ධවයි සිටියේ. මා බොහෝ වෙලාවට මඩකළපුව, ත්‍රිකුණාමලය, අම්පාර දිස්ත්‍රික්කයේ සමහර කොටස්වල EPRLF එකේ සාමාජිකයන් සමඟ වැඩ කළා. ඒ වැඩ කරන වෙලාවේ මට මුණ ගැසුණු දෙන්නෙක් හිටියා. 1989 මහ මැතිවරණයේදී වැදගත් කෙනෙක් උතුරින්, නැඟෙනහිරින් දේශපාලනයට එන්නේ නැති කාලයේ ද්‍රවිඩ සටන්කාමීන් විතරයි මැතිවරණය ව්‍යාපාරයේ සිටියේ. ඔවුන්ගෙන් බොහෝ අයට මම තමයි මැතිවරණය කරන හැටි කියලා දුන්නේ. මොකද, සන්නද්ධ ව්‍යාපාරයේ හිටියාට ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ ඒ තරුණයන් හිටියේ නැති නිසා. ඒ අවස්ථාවේදී මට විශේෂ දෙන්නෙක් හම්බ වුණා. ඔවුන් බොහොම වයෝවෘද්ධ, බොහොම වැදගත් පවුල්වලින් ආපු දෙන්නෙක්. EPRLF එකත් ඒ වෙලාවේ මැතිවරණ සටනට ආවා. එයින් එක්කෙනෙක් තමයි ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා; අනෙක් කෙනා තමයි සැම් තම්බිමුත්තු මැතිතුමා. ඒ දෙන්නාම ප්‍රසිද්ධ, හොඳ සමාජ මට්ටමක් තිබුණු, මිනිස්සු පිළිගත් දෙන්නෙක්. ඒක නිසා 89 මැතිවරණයේදී ඒ දෙන්නාම ජයග්‍රහණය කරලා පාර්ලිමේන්තුවට ආවා. අමිර්තලිංගම් මහත්මයා 1989 කාලයේ ඉන්දියාවේ ඉඳලා ලංකාවට ආවා. ඒ වෙලාවේ රජය විසින් එතුමන්ලා නවත්වලා හිටියේ තැප්‍රොබේන් හෝටලයේ. වරක් මට එන්න කියලා මාත්, මගේ පක්ෂයේ ලේකම් වයි.පී. ද සිල්වා මැතිතුමාත් ගිහිල්ලා අමිර්තලිංගම් මැතිතුමා සමඟ සාකච්ඡා කළා, උතුරු සහ නැඟෙනහිර ඒ මැතිවරණ වැඩ පිළිවෙළ ක්‍රියා කරන්නේ කොහොමද කියලා. ඒ වෙලාවේ එතුමා කියපු දේශපාලන වැකියක් මට කවදාවත් අමතක වෙන්නේ නැහැ.

එතුමා මට කිව්වා, "රාජිත, උතුරේ ප්‍රජාතන්ත්‍රවාදයේ දොර තනිකරම වැහුවා. ඒ දොර අරින්න අපට බැරි වුණා. අපි ඒ දොරට තට්ටු කළා; තට්ටු කළා; තට්ටු කළා. නමුත් ඒ ප්‍රජාතන්ත්‍රවාදය දොරටුව උතුරට හා නැඟෙනහිරට හම්බ වුණේ නැහැ. නමුත් මට විශාල ගෞරවයක් තිබෙනවා, මේ අලුත් ද්‍රවිඩ සටන්කාමීන් ගැන; EPRLF එක, TELO එක, EPDP එක ඇතුළු මේ සියලු සංවිධාන ගැන. අපි තට්ටු කරන කොට ඇරෙන්නේ නැති වහලා තිබුණ දොරට ඔවුන් පයින් ගහලා ඇරියා. ඒ ගොල්ලන් ඒ දොර ඇරපු හින්දා තමයි අද අපි ලංකාවට ඇවිල්ලා ඒ දොරෙන් ඇතුළට එන්නේ" කියලා. අන්න ඒ ප්‍රජාතන්ත්‍රවාදී දොර උතුරට සහ නැඟෙනහිරට අරින්නට ඒ ද්‍රවිඩ තරුණ සටන්කාමීන් සමඟ එකතු වුණු දෙන්නාගෙන් එක්කෙනෙක් තමයි ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා. ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා එදා 1989දී ගත්තු තීන්දුව කවදා හෝ උතුරේ සහ නැඟෙනහිර ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය පිළිබඳව ලියන පොතේ විශේෂ සඳහනක් තිබිය යුතුයි. ඓතිහාසික කාර්යභාරයක් ප්‍රින්ස් කාසිනාදර් සහ සැම් තම්බි මුත්තු මැතිතුමන්ලා එදා කළා.

සැම් තම්බිමුත්තු මැතිතුමා කොළඹ කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලය ඉදිරිපිටදී LTTE එකෙන් ඝාතනය වුණා. ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා කෙසේ හෝ දිවි ගලවා ගත්තා. 2018 වසර වන තෙක්ම එතුමා ජීවත් වෙලා හිටියා. මා මේ අවස්ථාවේදී ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය එතුමාගේ පවුලේ අයට ප්‍රකාශ කර සිටිනවා. ඒ වාගේම එතුමාගේ ආගමානුකූලව පරලොව ජීවිතය සුගතිමත් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට, එම්.එස්. තේමිස් මැතිතුමා සම්බන්ධයෙන් කියනවා නම්, එතුමා 1956 සමාජ විප්ලවයේදී මැද කොළඹ ආසනය ජයග්‍රහණය කරලා පාර්ලිමේන්තුවට ආවා. ප්‍රධාන තැපැල් කන්තෝරුවේ වෘත්තීය සමිති නායකයා විධියට ක්‍රියා කරලා, එදා මහජන එක්සත් පෙරමුණෙන් නාම යෝජනා ලබා, පාර්ලිමේන්තුවට ඇවිල්ලා බණ්ඩාරනායක රජයේ වාඩි වුණා. 1956 වසරේදී එම්.එස්. තේමිස් මැතිතුමා පාර්ලිමේන්තුවට පැමිණීම තමයි කම්කරු පන්තියේ නියෝජිතයෙක් පාර්ලිමේන්තුවට පැමිණි පළමුවන අවස්ථාව. ඒ අනුව එම්.එස්. තේමිස් මැතිතුමා මේ පාර්ලිමේන්තු ඉතිහාසයට නව පිටුවක් එක් කළා. නිර්ධන පන්තිය වෙනුවෙන් හැමෝම කෑ ගැසුවත්, එම්.එස්. තේමිස් සහෝදරයා තමයි නිර්ධන පන්තියේ කම්කරු පන්ති ව්‍යාපාරයක නියෝජිතයකු වශයෙන් පළමුවෙන්ම ඇවිල්ලා මේ පාර්ලිමේන්තු සභාවේ වාඩි වුණේ. එම්.එස්. තේමිස්

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

මැතිතුමා මා සමඟ ඉතා මිත්‍ර වුණා, 1994 වසරේදී මා පාර්ලිමේන්තුවට ආවාට පසුව. එතුමා වරින් වර මට කථා කළා. මගේ කථා අහලා එතුමා මා සමඟ සාකච්ඡා කළා. එතුමා මට නොයෙකුත් පොත් එව්වා. එතුමා මට නොයෙකුත් ලිපි ලියා එව්වා. කම්කරු පන්තියෙන් ආවාට, දේශපාලනය පිළිබඳ ඉතා ඉහළ අවබෝධයක් එම්.එස්. තේමිස් මැතිතුමාට තිබුණා. එතුමා නොයෙක් වර මට උපදෙස් දුන්නා; නොයෙක් වර ඓතිහාසික කරුණු ඉදිරිපත් කළා; නොයෙක් වර මගේ කථාවලට විද්‍යාත්මක සමාජවාදයේ අඩංගු කරුණු කියා දුන්නා. එම නිසා අපි ඉතා මිත්‍ර වුණා. එතුමා වයසින් බොහොම වැඩි වුණත්, එතුමාට මා සමඟ සමීප සම්බන්ධතාවක් තිබුණා. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්මයා ඝාතනය කළ වෙලාවේ, එතුමාගේ දේහය ගෙනැල්ලා රොස්මීඩ් පෙදෙසේ පිහිටි නිවසේ තැන්පත් කරනකොට එම්.එස්. තේමිස් මැතිතුමා එතැනට ගියා. එතුමාත් පසු කලෙක බණ්ඩාරනායක මහත්මයාට විරුද්ධව කම්කරු පන්තියේ වැඩ වර්ජන කරමින්, ඒවාට නායකත්වය දෙමින්, රජය තුළම සිටිමින් නොයෙකුත් ක්‍රියා කළා. එතුමා මට කිව්වා, බණ්ඩාරනායක මැතිනිය අඬ අඬා කිව්වා ලු, "තේමිස්, ඔය ගොල්ලන් කළ වැඩේ නිසා නේද මගේ මනුස්සයාට මේ ඉරණම අත් වුණේ? මේ මනුස්සයාට වෙච්ච දේට ඔය ගොල්ලන් වග කියන්න ඕනෑ" කියලා. එතුමා මට කිව්වා, "ඩොක්ටර්, ඒ වෙලාවේ මගේ ඇස්වලින් කඳුළු කඩාගෙන වැටුණා. මම පැත්තකට වෙලා කල්පනා කළා, ඇත්ත නේ, අපි නිසා නේ බණ්ඩාරනායකට මෙහෙම අකල් මරණයක් සිදු වුණේ, අපිත් මේකට වග කියන්න ඕනෑ නේද?" කියලා. අන්න ඒ වාගේ දේශපාලනයේ බොහෝ ඇසූ පිරූ දේ දන්නා, දේශපාලන ඉතිහාසය ගැන හොඳ අවබෝධයක් තිබුණු, නිර්ධන පන්ති ව්‍යාපාරයෙන් ඇවිල්ලා අවසානයේදී මේ පාර්ලිමේන්තුව වර්ණවත් කළ චරිතයක් තමයි එම්.එස්. තේමිස් මැතිතුමා. එතුමාගේ අභාවය ගැන පවුලේ අයට අපේ කනගාටුව ප්‍රකාශ කරමින් එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.2.19]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන්නේ, මෙම පාර්ලිමේන්තුව තුළ ගරු මන්ත්‍රීවරුන් වශයෙන් ඒ වාගේම ගරු ඇමතිවරුන් වශයෙන් විශාල සේවාවක් කළ හතර දෙනෙකු සම්බන්ධවයි. අභාවප්‍රාප්ත ගරු සී. නන්ද මැතිව් මැතිතුමා, අභාවප්‍රාප්ත වෛද්‍ය ගරු රංජිත් අතපත්තු මැතිතුමා, අභාවප්‍රාප්ත ගරු ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා, අභාවප්‍රාප්ත ගරු එම්.එස්. තේමිස් මැතිතුමා යන හතරදෙනා පිළිබඳවම මේ රටේ ජනතාවට විශේෂයෙන් සඳහන් කිරීම අවශ්‍ය කාරණයක් නොවෙයි. මොකද, ඒ හතරදෙනා පිළිබඳවම මේ රටේ ජනතාවට සෑහෙන දැනුමක් තිබෙන නිසා.

විශේෂයෙන්ම මෙහිදී අභාවප්‍රාප්ත ගරු වෛද්‍ය රංජිත් අතපත්තු මැතිතුමා ගැන යමක් සඳහන් කරනවා නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා 1976-1977 වකවානුවේ අපගේ ගිරුවාපත්තුවේ අල්ලපු ආසනය විධියට තිබූ මුල්කිරිගල ආසනයෙනුත් කොටසක් එකතු කරලා තමයි බෙලිඅත්ත ආසනය නැවතත් ප්‍රතිනිර්මාණය වුණේ. ඒ කාලයේ -1976 අවුරුද්දේ- හිටපු ධීවර සහ සෞඛ්‍ය ඇමති ගරු ජෝර්ජ් රාජපක්ෂ මැතිතුමා අභාවප්‍රාප්ත වීම නිසා මුල්කිරිගල ආසනයට අතුරු මැතිවරණයක් පවත්වන්න සිද්ධ වුණා. නොයෙකුත් හේතු මත, මුල්කිරිගල ආසනය අතුරු මැතිවරණ සම්බන්ධයෙන් සුවිශේෂි නාමයක් දරන ආසනයක් බවටත් පසු කාලයක පත් වුණා. කොහොම නමුත්, ගරු වෛද්‍ය රංජිත් අතපත්තු මැතිතුමා, 1976 අතුරු මැතිවරණය අවස්ථාවේ එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් මුල්කිරිගල ආසනයේ ද යම් නායකත්වයක් දරමින් ඒ මැතිවරණ සටන මෙහෙයවපු නායකයෙක්. ඒත් එක්කම, 1977 වර්ෂයේ පවත්වපු මහා මැතිවරණයේදී බෙලිඅත්ත ආසනයට තරග කරලා විශිෂ්ට ජයග්‍රහණයක් ලබා පසු කාලීනව නියෝජ්‍ය අමාත්‍ය ධුරයක් වාගේම සෞඛ්‍ය අමාත්‍ය ධුරය ද දැරූ එතුමා මේ රටේ ජනතාවට සුවිශාල සේවාවක් කරපු ගෞරවනීය දේශපාලන නායකයකු විධියට අපි පිළිගන්නවා.

එතුමා ක්‍රියාකාරි දේශපාලනයට එන්න කලින් අපේ ප්‍රදේශයේ ඉතාම ජනප්‍රිය වෛද්‍යවරයෙක්. පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන ගිය එතුමා ප්‍රසිද්ධ වෙලා සිටියේ, විශේෂයෙන්ම දරුවන්ගේ, එනම් බාල වයස්කරුවන්ගේ රෝගවලට - pediatrics - ප්‍රතිකාර කිරීම සම්බන්ධවයි. දරුවන්ට ප්‍රතිකාර කිරීමෙහිලා සුවිශේෂ දක්ෂතාවක් තිබුණු වෛද්‍යවරයකු විධියට මුළු ගිරුවාපත්තුවේම නම් දරාපු වෛද්‍යවරයෙක් තමයි, ගරු රංජිත් අතපත්තු මැතිතුමා.

එතුමා සෞඛ්‍ය අමාත්‍ය ධුරය දරපු කාල සීමාවේ මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනය වෙනුවෙන් අතිවිශාල දායකත්වයක් ලබා දුන්නා. කොහොම නමුත්, එතුමාටත් දේශපාලනය රෝස මල් යහනාවක් බවට පත් වෙලා තිබුණේ නැහැ. බොහොම කටුක, අමිහිරි අත් දැකීම්වලටත් එතුමාට මුහුණ දෙන්න සිද්ධ වුණා. අවසානයේ එතුමාට ඒ ගැන යම් කලකිරීමකුත් ඇති වුණා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඉහළ තනතුරක් ලැබිලා එතුමාගේ වෘත්තීය ඥානයෙන් ජාත්‍යන්තර වශයෙනුත් මුළු ලෝකයටම සේවය කරන්න එතුමා අවස්ථාවක් ලබා ගත්තා. නැවතත් එතුමා දේශපාලන කටයුතුවල නිරත වුණත් ඒ තරම් ක්‍රියාකාරිව එම කටයුතුවල යෙදුණේ නැහැ.

දීර්ඝ කාලයක් තිස්සේ අපේ ගිරුවාපත්තුවට වාගේම මේ රටට කළ සේවය අගයමින් එතුමාට උපහාර දැක්වීම පිණිස බෙලිඅත්ත ආසනයේ ජනතාව මීට වසර දෙකකට විතර ප්‍රථම විශාල උත්සවයක් සංවිධානය කර තිබුණා. මටත් අවස්ථාව ලැබුණා, ඒ උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා විධියට සහභාගි වෙන්න. එදා අපි එතුමා එක්ක පැය ගණනක් ගත කළා. එදා එතුමා ඉතාම සතුටට පත් වුණා. එතුමා ඒ වාගේ උපහාර කවදාවත් බලාපොරොත්තු වුණේ නැහැ. නමුත්, ඒ වාගේ කටයුත්තක් කිරීම පිළිබඳව එතුමා අපට ස්තුතිය පුද කළා. ඒ සම්බන්ධයෙන් එතුමා සතුටට පත් වෙලා සිටි බව අපි දැන ගත්තා. අපේ ගිරුවාපත්තුවේ ජනතාවට වාගේම මේ රටේ සුවහසක් ජනතාව වෙනුවෙන් කළ සේවාවේ පින් බල මහිමයෙන් එතුමාට නිවන් සුව අත් වේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම, වෛද්‍යවරයකු වන එතුමාගේ පුත්‍ර රත්නය ඇතුළු පවුලේ සියලුදෙනාටත්, ඥාතීන්ටත් මගේ ශෝකය මේ අවස්ථාවේදී පුද කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ද දන්නා පරිදි අපේ මුල්කිරිගල ආසනයේ එක පැත්තක් මායිම් වෙන්නේ බෙලිඅත්තටයි; අනෙක් පැත්ත මායිම් වෙන්නේ -මීද්දෙනියේ ඉඳලා- කොලොන්න ආසනයටයි. අභාවප්‍රාප්ත ගරු සී. නන්ද මැතිව් හිටපු අමාත්‍යතුමා නියෝජනය කළේ, කොලොන්න ආසනයයි. 1977 මැතිවරණයේදී එතුමා, සුවිශේෂ ජයග්‍රහණයක් ලබා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව නිර්මාණය කරන්න සබරගමුවෙන් විශාල හයියක්, දායකත්වයක් දීපු නායකයෙක්. මා එතුමාත් ආශ්‍රය කළේ, බොහොම ළඟින්. 1976 අතුරු මැතිවරණය පැවැත්වූ අවස්ථාවේදී අපේ ගම භාරව දේශපාලන සංවිධාන කටයුතු කළේ, ගරු නන්ද මැතිව් මැතිතුමා සහ ගරු ගාමිණී අතුකෝරල මැතිතුමායි. ඒ දෙපළ බොහොම ළඟ, සුහද මිත්‍රයන් විධියට තමයි ආශ්‍රය කළේ.

එතුමා හුඟක් ළඟින් ආශ්‍රය කරන්න මට අවස්ථාව ලැබුණා. එතුමා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ වාගේම ගරු ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේත් සුවිශේෂ වගකීම් දරමින් නියෝජ්‍ය අමාත්‍ය තනතුරු, අමාත්‍ය තනතුරු ආදියත් දරා, පසු කාලීනව දීර්ඝ කාලයක් ඌව පළාතේ ආණ්ඩුකාර තනතුරත් දරා එතුමාගේ පූර්ණ ජීවිත කාලය තුළ මේ රටේ ජනතාවට විශාල සේවයක් කළා. එතුමා, එතුමාගේ පියා වන හිටපු අමාත්‍ය ගරු සිරිල් මැතිව් මැතිතුමා ගිය අඩිපාරේ යමින් දේශීයත්වය, අපේකම, අපේ අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් හොඳ ප්‍රතිපත්තියක් මත කටයුතු කරපු දක්ෂ දේශපාලන නායකයෙක්. එතුමා කරපු සේවාවල පුණ්‍ය බල මහිමයෙන් එතුමාටත් නිවන් සුව අත්වේවායි කියලා ප්‍රාර්ථනා කරන ගමන්ම එතුමාගේ බිරිඳ, දරුවන් ඇතුළු පවුලේ සියලුදෙනාට මගේ ශෝකය මේ අවස්ථාවේදී පුද කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා ගැනත් මා කියන්න ඕනෑ. එතුමා ආශ්‍රය කරන්න අපට කවදාවත් අවස්ථාවක් ලැබිලා නැහැ. නමුත් එක් පොදු කරුණක් අපි දන්නවා. ඒ තමයි, එතුමා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙකු වාගේම, උතුර පළාතේ ප්‍රශ්න තිබුණු යුගයේ සාමය ඇති කිරීම සඳහා විශාල දායකත්වයක් දරපු මහජන නියෝජිතයෙක් කියන කාරණය. එතුමාගේ ආගමට අනුකූලව එතුමාගේත් පරලොව ජීවිතය සුගතිමත් වේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු එම්.එස්. තේමිස් මැතිතුමා ගැනත් මා කියන්න ඕනෑ. එතුමා අපේ රටේ දේශපාලන ඉතිහාසය වෙනස් කරපු නායකයෙක්. එතුමා 1956 වර්ෂයේ මැද කොළඹ ආසනයෙන් පාර්ලිමේන්තුවට තරග කරලා සුවිශේෂී ජයග්‍රහණයක් ලබපු කම්කරු නායකයෙක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම් අවස්ථාවකදී මා යම් ග්‍රන්ථයක් පරිශීලනය කරන කොට එතුමා ගැන එහි සඳහන් වෙලා තිබුණු සටහනක් පිළිබඳව මට මතකයි. එදා 1956 මැතිවරණයෙන් පසුව ලන්ඩන් නුවර ප්‍රධාන පුවත් පතක මුල පිටුවක එතුමාගේ ඡායාරූපය පළ කරලා තිබුණා, ලංකාවේ කම්කරු නායකයෙක් ඇමතිවරයෙකු, නගරාධිපතිවරයෙකු සහ මහකොමසාරිස්වරයෙකු පරාජය කළා කියලා. එතුමා තරග කරපු ඒ මැතිවරණයේදී ඒ කියන සුවිශාල දැවැන්ත චරිත තුන පරාජය කරලා තමයි එතුමා ජයග්‍රහණය ලබා තිබෙන්නේ. ඒ අතර කොළඹ නගරාධිපතිතුමා වූ වී.ඒ. සුගතදාස මැතිතුමා හිටියා; ඒ.ඊ. ගුණසිංහ මැතිතුමා හිටියා. තේමිස් මැතිතුමා දැවැන්ත කම්කරු නායකයෙක්. මට මතක විධියට මැලේසියාවේ මහ කොමසාරිස් තනතුර දරලා ඇවිල්ලා එතුමා ඒ මැතිවරණයට තරග කළා. ඒ වාගේම, තවත් අමාත්‍යවරයෙක් එම්.එස්. තේමිස් මැතිතුමා එක්ක ඒ මැතිවරණයට ඉදිරිපත් වෙලා තරග කරලා තිබුණා. පසු කාලයකදී මට එතුමා බොහොම ළඟින් ආශ්‍රය කරන්න ලැබුණා. මගේ සේවාදායකයකු විධියට එතුමාගේ ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් නීති උපදෙස් දීමේ කර්තව්‍යවලදී මා එතුමා ළඟින් ඇසුරු කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා දේශපාලන ජීවිතයෙන් සමුගත්තාට පස්සේ ඉතාම සාර්ථක ව්‍යාපාරිකයකු බවට පත් වුණා. එතුමාට දේශපාලනය විතරක් නොවෙයි, ව්‍යාපාරික ඥානයත් බොහොම හොඳට තිබුණා. එතුමා බොහෝ මුදල් උපයා ඒ මුදල් බොහෝ සමාජ සේවා කටයුතුවලට වියපැහැදම් කළා. ඒ අනුව ගත්තාම, ගරු එම්.එස්. තේමිස් මැතිතුමා එක පැත්තකින් කම්කරු නායකයෙක්; තවත් පැත්තකින් දේශපාලනඥයෙක්, ව්‍යාපාරිකයෙක්, ඒ වාගේම, සමාජ සේවකයෙක්. ඒ හැම අංශයෙන්ම එතුමා විශාල කාර්යභාරයක්, සේවයක් අපේ රටට කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් අපේ කෘතවේදිභාවය පළ කරමින් එතුමාගේ පරලොව ජීවිතය සුවපත් වේවායි කියා අපි ප්‍රාර්ථනා කරනවා. එතුමාගේ පවුලේ ඥාති මිත්‍රාදීන් සියලුදෙනාට අපේ ශෝකය මේ අවස්ථාවේදී පුද කරමින් මම මගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කාලය ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතියි.

[2.30 p.m.]

**ගරු සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මහතා**
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)

*Bismillahir Rahmanir Raheem.*

Hon. Deputy Speaker, we are here today to pay tribute to four of our Hon. Members of Parliament with these Votes of Condolence.

One among them is the late Hon. Prince Casinader. Sir, it is with a deep sense of sorrow that I rise in this House to speak on the Vote of Condolence on the passing away of my dear and respected mentor from my younger days in Batticaloa. I consider it a privilege to pay my highest tribute to a person of the calibre of the late Hon. Prince Casinader, who was much more than a popular personality as far as Batticaloa is concerned, and he himself was an institution for more than half a century. As an educationist, a civil society leader cum human rights activist and a legislator, he served Batticaloa with immense passion and distinction.

He was born on 21$^{st}$ July, 1925. As one of the five siblings and like many other children of that era, Prince started his primary education at the St. Vincent Girls' High School, Batticaloa and had a stint at the St. Cecilia's Convent before settling in at the Methodist Central College. Hailing from a well-distinguished family in Batticaloa, the late Hon. Casinader had a great pride in his family heritage. He always loved and cherished his childhood memories and the times he spent with relatives and friends. His father Charles Brown Casinader wanted his bright son to pursue a legal career. However, fate designed a much nobler career path for Prince Casinader. Between 1948 to 1949, with the departure of the British, the newly independent Ceylon had a severe shortage of competent teachers of the English language. The then Principal of the Methodist Central College, late Mr. S.V.O. Somanader, impressed upon young Prince Casinader to join his teaching staff on a voluntary basis. Having started as a volunteer teacher, Prince Casinader then entered the Government Training College at Maharagama and returned to the Methodist Central College as a trained, qualified teacher in 1952. He dedicated his life and career to his Alma Mater and also to the public of Batticaloa. He had been serving as a teacher for four decades, except for a short stint at the Arasadi Methodist Mission, the Mahajana College of Batticaloa.

Under his purview, the Methodist College was transformed into the most disciplined school not only in Batticaloa, but was also considered as the most reputed school in the entire Island. It would not be an

exaggeration if one were to claim that it was under the late Hon. Prince Casinader that the accurate vision of Methodist missionaries, who were the founders, significantly materialized. In contrast to the elaborate establishment of the colonial era, the missionaries of Methodist Central College had a diverse concept and a different notion of grandeur. The missionaries were content with humble beginnings in simple buildings in order to produce great intellectuals. Sir, during his tenure, a rapid improvement and expansion of the school took place whilst continuing to maintain the tradition built up by an illustrious line of principals, dedicated teachers and loyal students of the school.

One of the activities that kept alive the spirit of school service and which helped instill discipline in boys was the Pathfinder Club, which functioned under the guidance of the Hon. Prince Casinader. The parents had the confidence that their children would come out as well-rounded citizens who will be productive in serving the future generation under Prince Casinader's nurturing. He was the ultimate disciplinarian, whose brand of tough love won over many hearts.

The Hon. Prince Casinader instilled a sense of pride and mindfulness towards duty in teachers and students alike. He was a strict disciplinarian led by example. His students ought to be proud that he devoted 35 years to the Methodist Central College as a teacher, a Deputy Principal and finishing off as the Principal of it. Sir, while reminiscing about his past career, I must mention the fact that the Hon. Casinader himself had admitted that he never dreamt that one day, he would be called upon to serve his Alma Mater as its Principal. But, when he was given the opportunity, he proved worthy of following the noble steps of illustrious men of that generation who did not merely sat on that chair, but adorned it with dedication and service.

During his tenure as Principal, he simultaneously wrote articles on a wide variety of topics for Sri Lankan dailies and the "Asiaweek". He was one of the delegates who represented Sri Lanka at the world conference of the Amnesty International held in Amsterdam and he had travelled around the world.

In one of his interviews to the BBC Radio 4 about Batticaloa, the Land of the Singing Fish, he described the research done on singing fish by Jesuit Fathers, the Swami Vipulananda Institute of Aesthetic Studies and the Science Navigators with the help of local fishermen in the muddy Lagoon of Batticaloa in the moonlight. The Hon. Casinader was of the view that the singing fish is a reality and not a myth and he took pride of this ancient historic symbol, the singing fish that emanated aquatic music.

Finally, when he retired in 1986, the Methodist Central College lost one of its brightest beacons. After his retirement, the Hon. Prince Casinader joined the Batticaloa Citizens' Committee which served the people of Batticaloa at the height of political disturbances. He was a human rights defender who served people in dire times. He also served as a member of the Board of Governors of the Eastern University of Sri Lanka.

Sir, in 1989, the Hon. Prince Casinader was elected as a Member of Parliament for the Batticaloa District and served Batticaloa with his usual charisma and devotion. In Parliament, he was truly an eloquent gentleman. His Parliamentary speeches on varied subjects were evidence of his extensive knowledge and he deployed his educational expertise to a great extent in the Parliamentary Consultative Committees, more specifically in steering the Committees on education towards improvement.

He was well known for his oratory skills in English and spoke his mother tongue with equal passion. His speeches were always combined with wit and humour, which kept his audience spellbound. Thus, the Parliamentary speeches he delivered were full of sense and substance. Sir, it is noteworthy that he had chaired Parliament occupying the Speaker's Chair, where you are now seated, Sir, which was an honourable Privilege he officiated in a just and impartial manner and which was appreciated by the Hon. Members of the House on both sides.

It was during his tenure as a Member of Parliament that he still helped his school with the activities of the School Development Society, the Parent-Teacher Association, the Past Pupils' Association, the teachers and students. In celebrating the 175th Anniversary of the College, he gave his valuable advice and guidance to plan that anniversary programme to be a success and also made sure that a commemorative postage stamp was issued to mark that 175th Anniversary.

He lived amidst us fruitfully for 93 years and was called to eternal rest on the 12th of December, 2018. Although the late Hon. Prince Casinader was affectionately called "Prince" by his friends and Colleagues, he was a simple and humble man with unassuming ways and his qualities of geniality, generosity and humanness endeared him to all and sundry. His greatness lays in the fact that he was accessible to anyone at any time. He took a personal interest in his relationship with his friends and all those who sought his advice and guidance. His life was exemplary and was a blessing to all who associated with him. I have had the opportunity of associating with him during my school days while I was studying for GCE Advanced Level at St. Michael's College, Batticaloa as I got acquainted with his cousin, the late Mr. Kingsley Somanader, who was the then Principal of St. Michael's College.

Further, I closely associated with him in the 1980s as he was campaigning for civil rights and working towards creating peace and understanding among all communities and we had a mutual admiration towards each other. He served the multiethnic communities around him with great commitment and compassion, earning their honour and respect despite being rooted in the Christian faith. During this time, he gave leadership and voiced the plight of the innocent people many a time bringing solace.

I happened to visit the Hon. Prince Casinader at his residence at Love Lane, Batticaloa with the late Hon. Alhaj A.H.M. Azwer, before the latter's demise, who was one of his contemporaries and another great admirer of his. There, I witnessed the exchange of pleasantries by these two retired Parliamentarians and the accurateness of their memories of many years interspersed with much wit and humour. As usual, he wittily said, "I am a poor pensioner with a limited income. Though I am wrongly called 'Prince Casinader', I have no '*kaasi*'." In Tamil, "*kaasi*" means money.

"Prince" had a lively mind even in his old age, though in the last few months before he passed away, he was feeling lonely and his health was deteriorating. As his daughters were domiciled overseas, his past students and relatives looked after him with much care and kept his spirits up until he left to his eternal abode.

The representatives of the Old Boys' Association of the Methodist Central College, Mr. Ebenezer Darshan, President of the Old Boys' Association, Mr. Paramasivan Muralitharan, Member of the Old Boys' Association, Engineer D.A. Pragash, ex-President of the OBA and Mr. Sangarapillai Sashidaran, ex-President of the OBA are present here in the Gallery today on behalf of his family to witness this paying of tribute. The late Hon. Prince Casinader's daughters Praemini Gersmann and Sharmini Upasiri, who are domiciled overseas, could not be present in Parliament today.

I must put on record today that when I was there to pay my last respects to dear Prince Casinader, I witnessed a large representative gathering of mourners from all communities and from different walks of life - religious leaders, Parliamentarins, ex-Parliamentarians, provincial councillors, members of local government bodies, the past and present community of the Methodist Central College and loved ones from here and abroad - who came to pay thier last respects at his residence, at Cartman Hall of the Methodist Central College and also at the Alyadycholai Methodist Cemetery, and it was ample testimony of the affection they all had for him.

Let me express once again my heartfelt condolences to his daughters Praemini and Sharmini and all his loved ones. May the Alimighty God, the Greatest Comforter give strength to all of them to bear this immense loss!

With a deep appreciation of the life, career, leadership and contributions of the late Hon. Prince Casinader, I wish to conclude saying that he will be remembered in the annals of history of Sri Lanka and more specifically, in Batticaloa. He was Prince Casinader and will always remain the "Prince of Batticaloa" in our hearts.

Before I conclude, Sir, let me express my sincere condolences to the family members of the late Hon. C. Nanda Mathew, ex-Member of Parliament, the late Hon. (Dr.) Ranjith Atapattu, ex-Member of Parliament and also of the late Hon. M.S. Themis, ex-Member of Parliament. May these souls atain eternal peace!

Thank you, Sir.

[අ.භා.2.45]

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ උත්තරීතර සභාව නියෝජනය කරමින්, මේ රටට විශාල සේවාවක් ඉටු කළ ගරු මැති ඇමතිතුමන්ලා කිහිප දෙනෙකුගේ අභාවය වෙනුවෙන් අද අපගේ ශෝකය ප්‍රකාශ කරනවා. විශේෂයෙන් අප දන්නවා, ගාල්ල දිස්ත්‍රික්කය ප්‍රමුඛව දකුණු පළාතේ සෞඛ්‍ය ක්ෂේත්‍රය නඟා සිටුවන්න ගරු රංජිත් අතපත්තු මැතිතුමා අමිල වූ මෙහෙවරක් ඉටු කළ බව. අපි මුලින්ම, එතුමා කළ ඒ සේවය සිහිපත් කරන්න ඕනෑ. අපි එය ඉතාම අගය කොට සලකනවා.

මා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයට එවකට තිබුණු විශාල අඩු පාඩුවක් තමයි, ශික්ෂණ රෝහලක්, එහෙම නැත්නම් පහසුකම්වලින් සමන්විත රෝහලක් නොමැතිකම. ඒ අඩු පාඩුව පිරිමහන්න එතුමා ගත් උත්සාහය ගැන අපි සතුටු වෙන්න ඕනෑ. එදා, ශ්‍රීමත් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මුදල් අමාත්‍යවරයා හැටියට සිටි යුගයේ මුදල් වෙන් කරගෙන, රංජිත් අතපත්තු මැතිතුමා ගාල්ල දිස්ත්‍රික්කයේ ඇති කළ ඒ රෝහල අද වන විට ලංකාවේ ඉහළම පහසුකම්වලින් යුතු රෝහලක් බවට පත්වෙලා තිබෙනවා. එතුමා මේ රෝහලේ ස්නායු වෛද්‍ය අංශයක් ආරම්භ කිරීමට කටයුතු කිරීම අපි දකින වැදගත්ම දෙයක්. අද වෙනකොට මේ රෝහල ඉතාම දියුණු තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. එහි අඩු පාඩුවකට තිබෙන්නේ අක්ෂි වෛද්‍ය ඒකකයක් නැතිකම පමණයි. මේ වන විට එහි ළමා වෛද්‍ය ඒකකයක්, දන්ත වෛද්‍ය ඒකකයක්, මහාචාර්ය ඒකකයක්, හෘදය රෝග ඒකකයක් ආදී වශයෙන් විවිධ ඒකක ස්ථාපිත කරන්නට හැකිවෙලා තිබෙනවා. පසුගිය රජයේ සෞඛ්‍ය අමාත්‍ය ධුරය දැරූ රාජිත සේනාරත්න මැතිතුමාත් මේ ඒකක නවීකරණය කරමින්, රංජිත් අතපත්තු මැතිතුමා කළ ඒ සේවය ඉදිරියට ගෙන යන්නට කටයුතු කළා.

රංජිත් අතපත්තු මැතිතුමා, 1977දී බෙලිඅත්ත ආසනයෙන් මැතිවරණයට ඉදිරිපත් වෙලා, වත්මන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා පරාජයට පත් කරමින් පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. එතුමා අමාත්‍ය ධුර ගණනාවක් දරා තිබෙනවා. එතුමා, කොළඹ රෝහල් හා පවුල් සෞඛ්‍ය ව්‍යාපෘති ඇමතිවරයා හැටියටත්, සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියටත්, කම්කරු හා සමාජ ක්‍රමසම්පාදන අමාත්‍යවරයා හැටියටත් කටයුතු කර තිබෙනවා. එතුමාගේ පියා වන ඩී.පී. අතපත්තු මැතිතුමා, හිටපු අග්‍රාමාත්‍ය ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ කාලයේ මේ රටේ උප අමාත්‍යවරයකු හැටියට කටයුතු කළා. පියාගේ ඇවෑමෙන් පසුව, - අද පවතින මේ මනාප ක්‍රම පැමිණෙන්න පෙර- එතුමා බෙලිඅත්ත ආසනය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත් වුණා.

ගරු රංජිත් අතපත්තු මැතිතුමා, සෞඛ්‍ය ක්ෂේත්‍රයට විශාල සේවාවක් කළ බව අප දන්නවා. ඒ වාගේම එතුමා රටේ අනිකුත් ක්ෂේත්‍ර වෙනුවෙන්ද එවැනිම සේවාවක් ඉටු කළා. අපි දන්නවා, කිරම ඔය ව්‍යාපෘතිය, කෝංගල්ආර ව්‍යාපෘතිය, එවකට ජේ. ආර්. ජයවර්ධන රජය යටතේ දකුණු පළාතට ලැබුණු බහුකාර්ය යෝජනා ක්‍රමයක් වන ලුණුගම්වෙහෙර යෝජනා ක්‍රමය වැනි ඒවා ක්‍රියාත්මක කරන්නත් එතුමා මැදිහත් වූ බව. ඒ විතරක් නොවෙයි, බෙලිඅත්ත ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් එතුමා බොහෝ දේවල් කළා. බෙලිඅත්ත ක්‍රීඩාංගණය හා රෝහල් සංකීර්ණය හදන්නත් එතුමා මූලික වී කටයුතු කළා. අදටත් දකුණු පළාතේ තිබෙන විශාලතම ආයුර්වේද රෝහල ඉතාම දියුණු තත්ත්වයකට ගෙන එන්න එතුමා කටයුතු කළා. ඒ වාගේම, පළමුවැනි ශ්‍රේණියේ කාර්මික විද්‍යාලයක් පිහිටුවලා, බෙලිඅත්ත ආසනයට ඉතාම වටිනා සම්පතක් එතුමාගේ කාල පරිච්ඡේදය තුළ ලබා දුන්නා.

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

ගරු රංජිත් අතපත්තු මැතිතුමාගේ දේශපාලන දිවිය තුළ සටන්කාමී ස්වරූපයක් තිබුණාය කියන කාරණයත් අපි සඳහන් කරන්නට ඕනෑ. එවකට තිබුණු රජයට එරෙහිව විවිධ උද්ඝෝෂණ, පිකටින් වැනි දේවල් මෙහෙයවමින් තරුණ නායකයකු විධියට එතුමා කටයුතු කළ ආකාරය අපට එදා පුවත් පත්වලින් දැක ගන්නට ලැබුණා. එතුමා අවසාන කාලයේදී දේශපාලනය ගැන කලකිරුණාද කියලාත් මට හිතෙනවා. කෙසේ වෙතත්, එතුමා 1995 දක්වා ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂවරයකු හැටියට කටයුතු කළා.

එතුමාගේ ජීවිතයෙන් අපට උගත හැකි ඉතා වැදගත් දේවල් රාශියක් තිබෙනවා. ගාල්ල දිස්ත්‍රික්කයේ අපටත්, බෙලිඅත්ත ප්‍රදේශයටත්, හම්බන්තොට දිස්ත්‍රික්කයටත්, පොදුවේ ගත්තාම සමස්ත දකුණු පළාතටත් සදානුස්මරණීය මතක සටහන් ඉතිරි කළ නායකයකු හැටියටයි මා එතුමා දකින්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම, ගරු නන්ද මැතිව් මැතිතුමාත් ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ යුගයේ ඉඳලා මේ රටේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවල සිටි ඉතාම ප්‍රබල ඇමතිවරයකු හැටියට අපි දැක්කා. පසුව එතුමා ආණ්ඩුකාරවරයකු හැටියට ඉතා කැපී පෙනෙන සේවාවක් ඉෂ්ට කළා. එතුමාගේ අභාවය පිළිබඳවත් අපේ ශෝකය පළ කරනවා.

කම්කරු සටන් වෙනුවෙන් විශාල කැප කිරීමක් කළ නායකයකු හැටියට අපේ ගරු එම්.එස්. තේමිස් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා හඳුන්වන්න පුළුවන්. මා හිතන හැටියට එතුමාත් ඉතාම කැප වීමෙන් කටයුතු කළ, සදා මතකයේ රැඳුණු, ඉතාම වැදගත් දේශපාලන භූමිකාවක් මේ සමාජයටත්, මේ රටටත් තිළිණ කළ කෙනෙක්.

ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමාත් ද්‍රවිඩ ජනතාව වෙනුවෙන්, ද්‍රවිඩ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් විතරක් නොවෙයි, මේ රටේ සහජීවනය වෙනුවෙන් සියලු ජාතීන් අතර සමඟිය ස්ථාපිත කරන්න වෙර දැරූ නායකයකු හැටියට අපේ මතකයේ රැඳෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි ශ්‍රේෂ්ඨ නායකයන් වර්තමාන පාර්ලිමේන්තුවට විශාල පූර්වාදර්ශයක්. අද පාර්ලිමේන්තුව තුළ කෙරෙන කටයුතු සහ යම් යම් අවස්ථාවලදී ඇතිවන ඉතාම අකාරුණික තත්ත්ව දිහා බලනකොට, මේ පාර්ලිමේන්තුව ප්‍රභාවත් කළ රංජිත් අතපත්තු මැතිතුමා, නන්ද මැතිව් මැතිතුමා වැනි ඉතා ශ්‍රේෂ්ඨ නායකයන් අද අපට පූර්වාදර්ශයක් වෙනවා. ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තුව තුළ අද අපි දකින ඉතා අකාරුණික තත්ත්වය එදා පාර්ලිමේන්තුව තුළ තිබුණේ නැහැ. පාර්ලිමේන්තුවේ ගෞරවය, පාර්ලිමේන්තු සම්ප්‍රදායයන් ආරක්ෂා කරගෙන සදාචාරාත්මක ලෙස පාර්ලිමේන්තුවේ කටයුතු කරන්න එතුමන්ලාට විශාල ශක්තියක් තිබුණා. ඒ කාලයේ හැන්සාඩ් වාර්තා කියවනකොට එතුමන්ලාගේ කථා විලාසය පිළිබඳවත්, එතුමන්ලා විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග තුළින් මේ රටට සිදු වූ සේවය පිළිබඳවත් අපට සතුටු වෙන්න පුළුවන්. එවන් වූ ශ්‍රේෂ්ඨ නායකයන් කිහිපදෙනෙකු අද අප අතර නැති වුණත්, එතුමන්ලා පාර්ලිමේන්තුව තුළත්, ඉන් බැහැරවත් ක්‍රියා කළ ආකාරය දිහා බලනකොට, විවිධ ක්ෂේත්‍ර තුළින් මේ රටට යම්කිසි සංවර්ධනයක් ගෙන එන්නත්, දේශපාලන භූමිකාව තුළින් ඉතා සහජීවනයෙන් කටයුතු කරන්නත් පුළුවන් ශක්තියක් එතුමන්ලාට තිබුණු බවත් සඳහන් කරන්න ඕනෑ.

අභාවප්‍රාප්ත ශ්‍රේෂ්ඨ නායකයන් වූ නන්ද මැතිව් මැතිතුමාටත්, රංජිත් අතපත්තු මැතිතුමාටත්, ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමාටත්, එම්.එස්. තේමිස් මැතිතුමාටත් එක්සත් ජාතික පක්ෂයේත්, එක්සත් ජාතික පෙරමුණ ඇතුළු අපේ කණ්ඩායමේත් සාතිශය සංවේගය මේ අවස්ථාවේදී නැවත වරක් පුද කරමින්, එතුමන්ලාට අප ප්‍රාර්ථනා කරන අජරාමර සංඛ්‍යාත අමා මහ නිවන් සම්පත්තිය උදා වේවා!යි කියා ප්‍රාර්ථනා කරමින්, ඒ පවුල්වල සියලු ඥාති හිතවතුන්ටත් අපේ ශෝකය ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාටත් බොහොම ස්තුතියි.

[පි.ව. 2.53]

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் நான்கு முன்னாள் பாராளுமன்ற உறுப்பினர்கள் பற்றிய அனுதாபத் தீர்மானம்மீது விவாதம் இடம்பெறுகின்றது. இந்தச் சந்தர்ப்பத்தில் விசேடமாக மட்டக்களப்பைச் சேர்ந்த முன்னாள் பாராளுமன்ற உறுப்பினர் பிரின்ஸ் குணராசா காசிநாதர் அவர்கள் பற்றி நான் குறிப்பிட வேண்டும். இவர் 1989ஆம் ஆண்டு எமது கட்சியான ஈழமக்கள் புரட்சிகர விடுதலை முன்னணி - EPRLF சார்பில் பாராளுமன்றத் தேர்தலிலே போட்டியிட்டு வெற்றி பெற்றார். குறித்த தேர்தலில் மட்டக்களப்பு மாவட்டத்திலிருந்து பிரின்ஸ் காசிநாதர் அவர்களும் சாம் தம்பிமுத்து அவர்களும் எமது கட்சி சார்பில் பாராளுமன்றத்துக்குத் தெரிவானார்கள். 1989ஆம் ஆண்டு பாராளுமன்றத் தேர்தலானது சுமுகமான சூழ்நிலையிலே நடைபெறவில்லை. ஏனெனில், அப்பொழுது வடக்கு, கிழக்கில் பாரிய யுத்தம் நடைபெற்றுக் கொண்டிருந்தது. அந்த யுத்த நெருக்கடிகளுக்கு மத்தியிலும் பிரின்ஸ் காசிநாதர் அவர்கள் தன்னுடைய உயிரைப் பணயம் வைத்து எமது கட்சி சார்பில் தேர்தலில் போட்டியிட முன்வந்தார்.

உண்மையிலேயே இவர் மட்டக்களப்பு மக்களால் பெரிதும் நேசிக்கப்பட்ட ஒரு மாமனிதர்; ஒரு கல்விமான்; புத்திஜீவி; அம்மாவட்ட மக்களின் பேரன்பையும் மதிப்பையும் பெற்றவர்; எல்லோராலும் பெரிதும் மதிக்கப்பட்டவர். ஓர் ஆசிரியராக, மட்டக்களப்பு மெதடிஸ்ற் மத்திய கல்லூரியின் அதிபராக இருந்து கல்வித் துறைக்கு 40 வருட காலம் மட்டக்களப்பு மண்ணிலே அளப்பரிய சேவையாற்றிய இவர், ஓர் ஆங்கில ஊடகத்தின் ஊடகவியலாளராகவும் இருந்தார். இவர் தான் வாழ்ந்த காலத்தில் கிழக்கு மாகாணத்தில் கல்விமான்களையும் அரசியல்வாதிகளையும் உருவாக்குவதில் பெரும் பங்குவகித்திருக்கிறார் என்பதை மறக்க முடியாது. மீன் பாடும் தேன் நாடான மட்டக்களப்பு சம்பந்தமாகப் பெரியதோர் ஆய்வைச் செய்து, அந்த ஆய்வை உரிய இடங்களுக்குச் சமர்ப்பித்திருக்கிறார். இவருடைய ஆங்கிலப் புலமையைப் பாராளுமன்றத்திற்கு உள்ளேயும் வெளியேயும் மற்றும் பல்வேறு இடங்களிலேயும் உணர முடிந்தது.

இவர் பாராளுமன்ற உறுப்பினராக இருந்த காலகட்டத்தில்தான்ர் பா கிழக்கு மாகாணத்தில் இராணுவத்தினராலும் படையினராலும் பல இளைஞர்கள் கைது செய்யப்பட்டார்கள்; சுட்டுக்கொலை செய்யப்பட்டார்கள். நெருக்கடியான இந்தக் காலகட்டத்தில் துணிச்சலோடு நேரடியாகச் சென்று படைத்தரப்பினரோடும் பொலிஸாரோடும் கதைத்து, கைது செய்யப்பட்டிருந்த இளைஞர்களை விடுவித்து வந்தார். இவ்வாறு பல இளைஞர்களுடைய உயிரை பாதுகாத்திருக்கிறார். அப்படிப்பட்ட ஒரு பெரிய மனிதனுடைய மறைவையொட்டிய அனுதாபத் தீர்மானத்தின்மீது உரையாற்றுவதையிட்டு நான் பெருமையடைகின்றேன்.

அமரர் பிரின்ஸ் காசிநாதர் அவர்கள் மிகவும் துணிச்சலான ஒருவர். தனக்குச் சரி என்று பட்டதை முகத்திற்கு நேரே சொல்லக்கூடியவர்; எதையும் மறைவாகப் பேசமாட்டார். நேர

முகாமைத்துவத்தில் தனக்கென ஒரு தனித்துவமான நடைமுறையைப் பின்பற்றி வந்தார். இவரைச் சந்திக்க வருகின்ற பொதுமக்களாக இருக்கலாம், அதிகாரிகளாக இருக்கலாம், வேறு யாராகவும் இருக்கலாம், குறித்த நேரத்தில் அவர்களைச் சந்திப்பதை வழமையாகக் கொண்டிருந்தார். அந்த வகையில் நேர முகாமைத்துவத்தை மிக இறுக்கமாகக் கடைபிடித்து வந்தார். அமரர் பிரின்ஸ் காசிநாதர் அவர்கள் அந்த மக்களுக்கு நிறைவேற்றுவதற்குத் தேவையான எந்த விடயங்களை விட்டுச் சென்றாரோ, அந்த விடயங்களை நிறைவேற்றி வைப்பதற்குக் கல்விமான்கள், புத்திஜீவிகள், அரசியல் தலைவர்கள் எனப் பல்வேறுபட்ட துறைசார்ந்தவர்களை உருவாக்கிச் சென்றிருக்கின்றார்.

அமரர் பிரின்ஸ் காசிநாதர் அவர்கள் ஒரு நெருக்கடியான காலகட்டத்தில் எங்களுடைய கட்சி சார்பிலே மிகத் துணிச்சலோடு தேர்தலில் போட்டியிட்டு, அந்த மாவட்ட மக்களுக்கு ஆற்றிய சேவைக்காக ஈழமக்கள் புரட்சிகர விடுதலை முன்னணி என்ற EPRLF கட்சியின் சார்பில் அவருடைய குடும்பத்தினருக்கும் மற்றும் இந்த விவாதத்தைப் பார்வையிட இங்கு வந்திருக்கும் மெதடிஸ்ற் மத்திய கல்லூரியினுடைய பழைய மாணவர்கள் உட்பட சம்பந்தப்பட்டவர்கள் அனைவருக்கும் எங்களுடைய அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றோம். விசேடமாக, பிரின்ஸ் காசிநாதர் அவர்களின் மறைவையொட்டி இங்கு அனுதாபம் தெரிவித்த அத்தனை பாராளுமன்ற உறுப்பினர்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம்.

அதேபோல், மறைந்த முன்னாள் பாராளுமன்ற உறுப்பினர்களான திரு. சீ. நந்தா மெத்தியூ, டாக்டர் ரஞ்சித் அத்தபத்து, திரு. எம். எஸ். தேமிஸ் ஆகியோர் இந்த நாட்டுக்கும் நாட்டு மக்களுக்கும் ஆற்றிய சேவைக்காக அவர்களின் குடும்பத்தாருக்கும் இந்த நேரத்திலே எங்களுடைய கட்சியின் சார்பில் ஆழ்ந்த அனுதாபத்தைத் தெரிவித்துக் கொண்டு, அவர்களுடைய ஆத்மா சாந்தியடையப் பிரார்த்தித்துக் கொண்டு, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා.2.59]

**ගරු සමන් රත්නප්‍රිය මහතා**
(மாண்புமிகு சமன் ரத்னபிரிய)
(The Hon. Saman Rathnapriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කෙටියෙන් අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්නේ දේශපාලනඥයකු වාගේම ආණ්ඩුකාරවරයකු විධියට කටයුතු කළ නන්ද මැතිව් මැතිතුමා ගැනයි. එතුමා ජන්ම ලාභය ලබන්නේ 1940දීයි. එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ 1965දීයි. එතුමා 1965දී එක්සත් ජාතික පක්ෂයත් එක්ක එකතුවෙලා කොලොන්න ආසනයෙන් මැතිවරණයට ඉදිරිපත්වෙලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු බවට පත්වුණා. ඊට පසුව 1977දීත්, 1989දීත් එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරමින්- විවිධ තනතුරු දරමින්- නියෝජ්‍ය අමාත්‍ය ධුර දරමින්, අමාත්‍ය ධුර දරමින් දේශපාලනය ජනතාවට ළඟා කළා. ඒ වාගේම ජනතාවගේ සිතුම්-පැතුම් වෙනුවෙන්, අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටියා. කොලොන්න කියන්නේ දුෂ්කර ප්‍රදේශයක්, අග හිඟකම්වලින් පිරුණු ප්‍රදේශයක්. එවැනි ප්‍රදේශයක දේශපාලන නායකයකු විධියට ඉස්මතුවෙලා මිනිසුන්ගේ හද ගැස්මත් එක්ක එකට හිඳිමින්, වැඩ කරමින් තමයි එතුමා කටයුතු කළේ. කොලොන්න විතරක් නොවෙයි, ඉන් එහාට ගිහින් රත්නපුර දිස්ත්‍රික්කයේම දේශපාලන නායකයකු බවට එතුමා පත්වුණා. එතුමා සිරිල් මැතිව් මැතිතුමාගේ පුත්‍රයායි. ඒ පියතුමාගේ ආභාසයත් නන්ද මැතිව් මැතිතුමාට හේතුවක් වුණා එතුමාගේ දේශපාලන කටයුතු ඉදිරියට අරගෙන යන්න. 1977දී තමයි එතුමා ප්‍රථම වතාවට නියෝජ්‍ය ඇමතිවරයකු වශයෙන් පත් වුණේ. ඊට පස්සේ මහවැලි ක්ෂේත්‍රය, ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රය වාගේම සංචාරක ක්ෂේත්‍රය නියෝජනය කරමින් නියෝජ්‍ය අමාත්‍යධුර දැරුවා. 1989දී එතුමා ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමතිවරයා බවට පත් වුණා. ඒ වාගේම 1994දී වරාය සංවර්ධන අමාත්‍යවරයා විධියට පත්වෙලා, එතුමාගේ දැනුම උපයෝගී කර ගනිමින් ඒ ක්ෂේත්‍රවල වෙනස්කම් ඇති කරන්න, සංවර්ධන කටයුතු කරන්න, මිනිසුන්ගේ පැත්තේ ඉඳගෙන කටයුතු කරන්න විශාල මහන්සියක් ගත්තා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම එතුමා මා සමඟ සම්බන්ධ වුණේ ඒ ඉතිහාසය තුළ නොවෙ, එතුමා ආණ්ඩුකාරවරයකු විධියට පත් වූ අවස්ථාවේයි. එතුමා වසර 12ක් ඌව පළාතේ ආණ්ඩුකාර ධුරය දැරුවා. එම වසර 12ක කාලය තුළ වෘත්තීය සමිති නායකයන් විධියට තමයි අපි එතුමාත් එක්ක සමීප වුණේ, වැඩ කටයුතු කළේ සහ සාකච්ඡා කළේ. එම සාකච්ඡාවලදී එතුමා වෘත්තීය සමිති නායකයන් සමඟ ඉතාම සමීපව කටයුතු කළා. ඌව පළාත කියන්නේ දුෂ්කර පළාතක්. ඒ දුෂ්කර පළාතේ සෞඛ්‍ය ක්ෂේත්‍රය නඟා සිටුවන්න, අහිංසක දුප්පත් මිනිසුන්ට සෞඛ්‍ය පහසුකම් දෙන්න, අධ්‍යාපන පහසුකම් දෙන්න එතුමා මහන්සි වෙලා කටයුතු කළා. අපි සාකච්ඡා සඳහා වාඩි වුණාම නිලධාරින්ගේ පැත්ත නොවෙයි, එතුමා නිතරම අපේ පැත්ත තමයි ගත්තේ. සාමාන්‍යයෙන් වෘත්තීය සමිති නායකයන් විධියට අපි නිලධාරින් එක්ක හැප්පුණා, වාද විවාද කර ගත්තා. ඒ හැම වෙලාවකම එතුමා අපේ පැත්ත අරගෙන මිනිසුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන්, ඕනෑ එපාකම් වෙනුවෙන්, පහසුකම් වෙනුවෙන් කටයුතු කළා. ඒ ඉතිහාසය මට හොඳින් මතකයි. මට එතුමාත් එක්ක තිබෙන ඒ ඉතිහාසය මිහිරි ඉතිහාසයක්. රටේ ආණ්ඩුකාරවරු 9දෙනෙක් සිටියා. ආණ්ඩුකාරවරු අතර ප්‍රශ්නයක් විසඳාගන්න ඕනෑ වුණාමත් සී. නන්ද මැතිව් මැතිතුමා තමයි අපට මතක් වෙන්නේ. එතුමාත් එක්ක තමයි අපි කථා කළේ. එතුමා හරහා තමයි අපි අපේ අදහස් ආණ්ඩුකාරවරුන්ගේ සම්මේලනයටත් ඉදිරිපත් කළේ. ඒ අනුව එතුමා මේ රටේ බිහි වුණු හොඳ දේශපාලන නායකයකු බව අපට කියන්න පුළුවන්. ඒ වාගේම එතුමා කෘතහස්ත දේශපාලන නායකයෙක්. රටට වැඩක් කරපු නායකයෙක්. එවැනි මහත්මයෙක් තමයි අපෙන් වෙන්වෙලා තිබෙන්නේ. ගරු සී. නන්ද මැතිව් මැතිතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ පවුලේ අයට මගේ ශෝකය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා.3.02]

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශපාලනඥයන් අතරේ සිටි වැදගත් හා කීර්තිමත් දේශපාලනඥයන් සිව්දෙනකු පිළිබඳව ශෝකය පළ කරන මේ අවස්ථාවේ, එතුමන්ලා වෙනුවෙන් මහනුවර දිස්ත්‍රික් ජනතාවගේ ශෝකය පළ කරන්නට අවස්ථාව සලසා දීම පිළිබඳව ඔබතුමාට පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු වෛද්‍ය රංජිත් අතපත්තු මැතිතුමාගේත්, ගරු සී. නන්ද මැතිව් මැතිතුමාගේත්, ගරු ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමාගේත් ඒ වාගේම ගරු එම්.එස්. තේමිස් මැතිතුමාගේත් අභාවය පිළිබඳව තමයි අද මේ උත්තරීතර සභාවේ ශෝකය පළ කරන්නේ. මේ රටේ හිටපු වැදගත් හා කීර්තිමත් දේශපාලනඥයන් වශයෙන් මේ සිව්දෙනාම හඳුන්වා දෙන්නට පුළුවන් කියන එක මා ඉතාම සතුටින් සිහිපත් කරනවා. එතුමන්ලාගේ අභාවය පිළිබඳව අපගේ සාතිශය සංවේගය පළ කරන අතර, එතුමන්ලා අදහන ආගම් අනුව එතුමන්ලාගේ අපේක්ෂා ඉටු වේවායි කියාත් ප්‍රාර්ථනා කරනවා.

[ගරු ලකී ජයවර්ධන මහතා]

විශේෂයෙන්ම දකුණු පළාතෙන් දේශපාලනයට පිවිසුණු ගරු වෛද්‍ය රංජිත් අතපත්තු මැතිතුමා, එක්සත් ජාතික පක්ෂයෙන් ක්‍රියාකාරී දේශපාලනයට පිවිස, 1977දී පාර්ලිමේන්තුවට තේරී පත්වෙලා අවුරුදු ගණනාවක් මේ රටට, ජාතියට, සමාජයට අතිමහත් සේවාවක් ඉටු කළ උදාර දේශපාලනඥයකු විධියට හඳුන්වන්නට පුළුවන්. ගරු රංජිත් අතපත්තු මැතිතුමා දකුණු පළාතේ සංවර්ධනය වෙනුවෙන් විශාල දායකත්වයක් ලබා දුන් නායකයෙක් කියන එක අපි දන්නවා. 1977දී දේශපාලනය කළ මන්ත්‍රීවරු මේ රටේ වාසනාවන්තම පිරිසක්. එතුමන්ලාට මේ රටට වැඩියෙන් වැඩ කරන්න අවස්ථාව උදා වුණා. එක්සත් ජාතික පක්ෂය තුළින් මේ රටේ සංවර්ධනය වෙනුවෙන් කළ විශාල සේවාවට ඒ අයගෙන් විශාල දායකත්වයක් ලැබුණා. විශේෂයෙන් දකුණු පළාතේ සංවර්ධනය වෙනුවෙන් එතුමා විශාල දායකත්වයක් ලබා දුන්නාය කියන එක අද දවසේ මේ පාර්ලිමේන්තුවේ එතුමා පිළිබඳව ගුණ කථනය කරන අවස්ථාවේ පක්ෂ විපක්ෂ සෑම කෙනෙක්ම ප්‍රකාශ කරන්නට යෙදුණා. මේ රටට අවශ්‍ය අවස්ථාවක එවන් නායකයන් අපෙන් වෙන්වීම අපට විශාල පාඩුවක්.

කෙසේ වෙතත් ගරු රංජිත් අතපත්තු මැතිතුමා විවිධ ක්ෂේත්‍රවලට අදාළව අමාත්‍යාංශ ගණනාවක අමාත්‍යධුර දැරුවා. විශේෂයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය තුළින් එතුමා කළ සේවය ඉතාම වැදගත් කියන එක මතක් කරන්නට ඕනෑ. දකුණු පළාතේ කරාපිටිය රෝහල වැඩිදියුණු කරන්න එතුමා කටයුතු කළ අතර, මහනුවර ප්‍රදේශයේ මහනුවර රෝහල වෙනුවෙනුත් එතුමා විශාල සේවාවක් ඉටු කර තිබෙනවාය කියන එක අපි ඉතාම සන්තෝෂයෙන් මේ අවස්ථාවේදී මතක් කරනවා. මම මේ අවස්ථාවේදී ගරු රංජිත් අතපත්තු මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කරන අතර, එතුමාට උතුම් වූ නිවන් සුව අත් වේවායි කියලාත් ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ දේශපාලන අඹරේ සිටි කීර්තිමත් දේශපාලනඥයකු වූ ගරු නන්ද මැතිව් මැතිතුමා 1977දී පාර්ලිමේන්තුවට පිවිස, මේ රටට විශිෂ්ට ගණයේ සේවාවක් ඉටු කරන්නට ඇප කැප වුණා. විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතා උන්නතිය වෙනුවෙන් එතුමා කටයුතු කළා. එතුමා කොළොන්න මැතිවරණ කොට්ඨාසය තමයි නියෝජනය කළේ. මම හිතන විධියට කොළොන්න මැතිවරණ කොට්ඨාසය විශාල ග්‍රාමීය ප්‍රදේශයක්. එම ග්‍රාමීය ප්‍රදේශයේ සංවර්ධනයට එතුමා ලබා දුන් දායකත්වයත් අපි අගය කළ යුතුයි. ක්‍රීඩා ඇමතිවරයා විධියට, තරුණ කටයුතු ඇමතිවරයා විධියට එතුමා එම ක්ෂේත්‍ර තුළ විශාල සේවාවක් සිදු කළා. ක්‍රීඩාව දියුණු කරන්නට එතුමා විශාල ලෙස කටයුතු කළාය කියන එකත් අපි දකිනවා.

ඒ වාගේම තරුණ කටයුතු පිළිබඳව එතුමාගේ දැඩි අවධානයක් තිබුණා. විශේෂයෙන්ම හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා තරුණ කටයුතු ඇමතිවරයා හැටියට ආරම්භ කළ ක්‍රියා තවත් සාර්ථකව ඉදිරියට ගෙන යන්නට එතුමා ක්‍රියා කළාය කියන එකත් මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

එතුමා දීර්ඝ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කළා; ඇමති තනතුරු ගණනාවක් දැරුවා. ඒ සෑම ක්ෂේත්‍රයක් තුළින්ම එතුමා මේ රටට, සමාජයට විශාල සේවාවක් සැලසුවාය කියන එකත් අපි මතක් කරන්න ඕනෑ. පසු කාලයක එතුමා ඌව ආණ්ඩුකාරවරයා විධියට කටයුතු කළා. දේශපාලන වශයෙන් වෙනස් වුණත්, එතුමා කොයි පැත්තේ ඉඳිමින් වුණත් මේ රට වෙනුවෙන් කටයුතු කළාය කියන එක අපි මතක් කළ යුතු වෙනවා. එය එතුමාට ගෞරවයක් විධියට සඳහන් කරමින්, අභාවප්‍රාප්ත ගරු නන්ද මැතිව් මැතිතුමාට උතුම් වූ අමා මහ නිවන් සුව අත් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

ගරු ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමා පාර්ලිමේන්තුවේ අවුරුදු පහකුත්, මාස හතරක් වැනි කාලයක් කටයුතු කළාය කියන එක අපට දැන ගන්නට ලැබී තිබෙනවා. එතුමා ඇසුරු කරන්නට නොලැබුණත්, එතුමා කළ සේවාව අපි දකිනවා; දන්නවා. මඩකළපුව දිස්ත්‍රික්කය නියෝජනය කරමින් කථා කළ මන්ත්‍රීවරුන් දැක්වූ අදහස්වලට අනුව එතුමා විශිෂ්ට ගණයේ සේවාවක් කළ කෙනෙක්ය කියන එක අපි දකිනවා. විශේෂයෙන්ම යුද සමයේ මඩකළපුව දිස්ත්‍රික්කය නියෝජනය කරමින් කටයුතු කරද්දී, එතුමා එම ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් ඇප කැප වී කටයුතු කළාය කියන එක මතක් කළ යුතු වෙනවා. ගරු ප්‍රින්ස් කාසිනාදර් මැතිතුමාට එතුමාගේ ආගම අනුව ආත්ම ශාන්තිය ලැබේවායි කියන එකත් මා මේ අවස්ථාවේ සඳහන් කරනවා.

අද ශෝක ප්‍රකාශ යෝජනා තුළින් කථා කළ ගරු එම්.එස්. තේමිස් මැතිතුමා 1956 දේශපාලන පෙරළියත් සමඟ පාර්ලිමේන්තුවට පිවිසුණු මන්ත්‍රීවරයෙක්. එතුමා සැබෑ කම්කරු නායකයෙක්. එතුමා කම්කරු ක්ෂේත්‍රය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පිවිස, කම්කරු අයිතීන් වෙනුවෙන් විශාල කැපවීමකින් කටයුතු කළාය කියන එක අපට දැනගන්න ලැබී තිබෙනවා. ගරු එම්.එස්. තේමිස් මැතිතුමා අවුරුදු තුනකුත්, මාස අටක් වාගේ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කළා. නමුත් එතුමා පිළිබඳව යම් යම් කථා අපට අදටත් පුවත් පත්වලින් දැකගන්න ලැබෙනවා. මේ රටේ සිටි සැබෑ වෘත්තීය සමිති නායකයකු විධියට පාර්ලිමේන්තුවට පිවිසෙන්න එතුමාට පළමුවෙන්ම අවස්ථාව ලැබුණා. කෙටි කාලයකදී වුවත් මේ රට වෙනුවෙන්, සමාජය වෙනුවෙන් වාගේම, කම්කරු පන්තිය වෙනුවෙන් විශාල කැපවීමක් කළ, වැඩ කළ නායකයකු විධියට එතුමා හඳුන්වන්න පුළුවන් බව මතක් කරමින්, එතුමා අප අතරින් වෙන්වීම ශෝකයට කාරණයක් බවත් සඳහන් කරමින්, එතුමාටත් උතුම් වූ නිවන් සුව අත් වේවායි කියන ප්‍රාර්ථනාව කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

අභාවප්‍රාප්ත ගරු රංජිත් අතපත්තු මැතිතුමාත්, ගරු නන්ද මැතිව් මැතිතුමාත් දේශපාලන වශයෙන් මා පෞද්ගලිකවම ඇසුරු කළ නිසා, සාමාන්‍ය ශෝක යෝජනා පළ කිරීමට අමතරව, අවසාන වශයෙන් මගේ වචන ස්වල්පයක් මේ අවස්ථාවට එකතු කරන්න මා කැමැතියි.

ගරු රංජිත් අතපත්තු මැතිතුමා පිළිබඳ මගේ මතකය, මා ඉතාම කුඩා කාලයේ මගේ පියා දේශපාලනයට පිවිසි කාලයට දිව යනවා. මගේ පියා දේශපාලනයට පිවිසි අවස්ථාවේ, වැල්ලවාය මැතිවරණ කොට්ඨාසයට 40 දෙනෙකුගේ විතර නාම යෝජනා ඉදිරිපත් වුණා. ඒ වේලාවේ, මගේ පියා තෝරා ගත්තාය කියන පණිවුඩය ගෙනාවේ රංජිත් අතපත්තු මැතිතුමායි. ඒ වේලාවේ තමයි මම මුලින්ම එතුමා හඳුනා ගත්තේ.

එතුමා ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂවරයකු විධියට කටයුතු කළා. ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන වැඩ පිළිවෙළ වාගේම ප්‍රාථමික සෞඛ්‍ය පිළිබඳව එතුමාට තිබුණු අත්දැකීම් සම්භාරයත් පාවිච්චි කරමින් එතුමා සෞඛ්‍ය ක්ෂේත්‍රයට විශාල සේවයක් ඉටු කළා. ඒ කාරණය මම සිහිපත් කරනවා.

ඊට අමතරව, අපේ නන්ද මැතිව් මැතිතුමා ඌව පළාතේ ආණ්ඩුකාරවරයා හැටියට දීර්ඝ කාලයක් තිස්සේ කටයුතු කරමින්

අතිවිශාල කාර්යභාරයක් කළා. ඉතාම කිට්ටුවෙන් අපි එතුමා ඇසුරු කළා. විශේෂයෙන්ම අපේ දිස්ත්‍රික්කයට යාබදව තිබෙන කොළොන්න ආසනයට එතුමා කළ සේවය අතිවිශාලයි. ඒ වාගේම, එතුමා සමඟ කටයුතු කළ අනෙක් මන්ත්‍රීවරුන් දෙදෙනා තමයි ගාමිණී අතුකෝරල මැතිතුමා සහ උපතිස්ස ද සිල්වා මැතිතුමා. මේ තිදෙනා ඉතාම කිට්ටුවෙන් ඇසුරු කරමින් ඒ දිස්ත්‍රික්කය වෙනුවෙන් අතිවිශාල සේවයක් කළා. ඒ කාරණය මම විශේෂයෙන් මේ අවස්ථාවේ මතක් කරනවා.

ගරු මන්ත්‍රීවරුනි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අභාවප්‍රාප්ත ගරු සී. නන්ද මැතිව් මහතා, අභාවප්‍රාප්ත ගරු වෛද්‍ය රංජිත් අතපත්තු මහතා, අභාවප්‍රාප්ත ගරු ප්‍රින්ස් කාසිනාදර් මහතා සහ අභාවප්‍රාප්ත ගරු එම්.එස්. තේමිස් මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනා අනුමත කරමින්, ගරු කථානායකතුමා සමඟ මමද ඒ හා එකතු වීමට කැමැත්තෙමි.

අද දින රැස්වීමට අදාළ නිල හැන්සාඩ් වාර්තාවේ පිටපත් ශෝකයට පත් එම පවුල්වල අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට නියෝග කරමි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 3.11ට, 2020 පෙබරවාරි 18 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி. ப. 3.11 மணிக்கு பாராளுமன்றம், 2020 பெப்ருவரி 18, செவ்வாய்க்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Parliament adjourned accordingly at 3.11 p.m. until 1.00 p.m. on Tuesday, 18th February, 2020.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.